201 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 201 - இல. 7
**Volume 201 - No. 7**

2011 අගෝස්තු 25 වන බ්‍රහස්පතින්දා
2011 ஓகஸ்ட் 25, வியாழக்கிழமை
**Thursday, 25th August, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ඇමතීම**

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය:**
ගරු ලෙස්ලි ගුණවර්ධන මහතා
ගරු ජයසේන රාජකරුණා මහතා
ගරු ධනපාල වීරසේකර මහතා
ගරු අගොස්තීනු පොන්සේකා මහතා

---

# பிரதான உள்ளடக்கம்

**மேதகு ஜனாதிபதி அவர்கள் பாராளுமன்றத்தில் ஆற்றிய உரை**

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம்:**
மாண்புமிகு லெஸ்லி குணவர்தன
மாண்புமிகு ஜயசேன ராஜகருணா
மாண்புமிகு கே.டீ. வீரசேகர
மாண்புமிகு அகுஸ்தீனு பொன்சேகா

---

# PRINCIPAL CONTENTS

ADDRESS TO PARLIAMENT BY HIS EXCELLENCY THE PRESIDENT

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. Leslie Goonewardene
Hon. Jayasena Rajakaruna
Hon. Dhanapala Weerasekera
Hon. Augustheenu Fonseka

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 අගෝස්තු 25වන බ්‍රහස්පතින්දා***
*2011 ஓகஸ்ட் 25, வியாழக்கிழமை*
*Thursday, 25th August, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 ව්‍යවස්ථාවේ (4) අනුව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව ඇමතීම. අතිගරු ජනාධිපතිතුමා.

## අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ඇමතීම
## மேதகு ஜனாதிபதி அவர்கள் பாராளுமன்றத்தில் ஆற்றிய உரை
## ADDRESS TO PARLIAMENT BY HIS EXCELLENCY THE PRESIDENT

**අතිගරු මහින්ද රාජපක්ෂ මහතා (ජනාධිපතිතුමා, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා)**
(மேதகு மஹிந்த ராஜபக்ஷ - ஜனாதிபதியும் நிதி, திட்டமிடல் அமைச்சரும் பாதுகாப்பு அமைச்சரும்)
(His Excellency Mahinda Rajapaksa - President, Minister of Finance and Planning and Minister of Defence)
ගරු කථානායකතුමනි, විධායක ජනාධිපති ධුරය මේ රටේ ඇති කිරීමෙන් පසු බිහි වූ ජනාධිපතිවරුන්ගෙන් පාර්ලිමේන්තු කටයුතුවලට වැඩියෙන්ම සහභාගි වූ ජනාධිපතිවරයා වශයෙන් අද නැවතත් මේ පාර්ලිමේන්තුවේ පෙනී සිටින්නේ පාර්ලිමේන්තුවත්, ජනාධිපති ධුරයත් අතර පැවතිය යුතු සම්බන්ධය තවතවත් තහවුරු කිරීමේ අධිෂ්ඨානයෙන් යුතුවයි. මා ජනාධිපති වූ තැන් සිටම සෑම අය වැයක්ම මා විසින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එමඟින් ක්‍රියාත්මක කළ ආර්ථික හා සංවර්ධන වැඩ පිළිවෙළට පාර්ලිමේන්තුවේ අඛණ්ඩ සහාය මට ලබා ගැනීමට හැකි වුණා. පසු ගිය අය වැය විවාදය අවසන් කිරීමට ද මා පැමිණියේ අය වැය ක්‍රියාවලියේ පාර්ලිමේන්තුව හා රජයේ සම්බන්ධය තවත් පුළුල් කරමිනුයි. මාගේ සෘජු අධීක්ෂණයෙන් පවතින අමාත්‍යාංශ සඳහා ඇති පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවලට මා නිතර නිතර සහභාගි වීමෙන් ඇමතිවරයකු වශයෙන් මාගේ පාර්ලිමේන්තු කාර්ය භාරය ද සැලකිය යුතු ලෙස ඉටු කිරීමට සමත් වීම ගැන මා නිහතමානීව ආඩම්බර වනවා. විධායකයාත්, ව්‍යවස්ථාදායකයාත් දැඩි සම්බන්ධතාවකින් කටයුතු කිරීමට පෙළ ගැසීම ත්‍රස්තවාදයෙන් නිදහස් වූ අපේ රට වෙනුවෙන් අප ඉටු කළ යුතු විශාල කාර්ය භාරයක්.

ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, යහ පාලනයක් තිරසාර ලෙස ගොඩ නැඟීමටත්, ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ජනතාවගේ විශ්වාසය තහවුරු කිරීමටත්, ව්‍යවස්ථාදායකයත් විධායකයත් දැඩි සම්බන්ධතාවකින් කටයුතු කිරීම හේතු වනු ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, 1983 කළු ජූලිය සමඟ පූජනීය ස්ථාන, ජන ජීවිත හා දේපළ විනාශ කිරීම මඟින් එල්ටීටීඊය ප්‍රවේශ වූ බියකරු ත්‍රස්තවාදය හදිසි නීතිය මත රට පාලනය කිරීමට අවාසනාවන්ත පරිසරයක් ගොඩ නැඟුවා. 1988-1989 කාලයේ දකුණේ ව්‍යාප්ත වූ ත්‍රස්තවාදි කැරලි ද ඒ කාලයේ සිට ක්‍රමයෙන් උත්සන්න වූ දේශපාලනඥයන් ඝාතනය කිරීම තුළින් ද හදිසි නීතියේ අවශ්‍යතාව සාධාරණීකරණය කළා. 2002 ජාත්‍යන්තරයේ සහභාගිත්වයෙන් ද ඇති කර ගත් සාම ගිවිසුම තුළ සාමයට ප්‍රවේශ වීමට දොර විවෘත කිරීමක් ලෙස ඉවත් කළ හදිසි නීතිය නැවත හිස එසෙව්වේ එම සාම ගිවිසුමම එල්ටීටීඊය විසින් අවස්ථා ගණනාවකදීම නිරන්තරයෙන් උල්ලංඝනය කිරීමත් එහි උත්සන්න අවස්ථාවක් ලෙස ලක්ෂ්මන් කදිර්ගාමර් විදේශ අමාත්‍යවරයා ඝාතනය කිරීමත් නිසායි. ගරු කථානායකතුමනි, 2005 මාගේ නායකත්වයෙන් මේ රටේ රාජ්‍ය පාලනයේ වගකීම භාර ගන්නා විට අපට උරුම වුණේ මෙවැනි පරිසරයක්.

2005 දී මා බලයට පත් වන විට ක්‍රියාත්මක වෙමින් තිබුණු සාම සාකච්ඡා ඉදිරියට ගෙන යාමට දැඩි උත්සාහයක් ගනු ලැබුවත්, එල්ටීටීඊය විසින් කැබිතිගොල්ලෑවේ කරනු ලැබූ සමූල මිනිස් ඝාතනයත්, ඉන් පසුව මාවිල් ආරු ජලාශය අවහිර කිරීමත් නිසා මානුෂික මෙහෙවරක් මෙහෙයවීමට අපට සිදු වුණා.

නැඟෙනහිර ප්‍රදේශය මුදා ගැනීමත් ඉන් පසු උතුරු ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගැනීමත් සිදු කළේ මෙම මතු වූ පරිසරය තුළයි. මුළු මහත් උතුරු හා නැඟෙනහිර ප්‍රදේශ ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගැනීමේදී ප්‍රාණ ඇපකරුවන් වූ අතිවිශාල අහිංසක ජනකොටසක් සඳහා සහන සැලසීමටත්, ඒ අය නැවත පදිංචි කිරීමේ ක්ෂණික වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමටත් අපට හදිසි නීතිය ප්‍රයෝජනවත් වුණා.

ගරු කථානායකතුමනි, හදිසි නීතිය යටතේ 2005ට පෙර අවස්ථා ගණනාවකදීම මේ රටේ පුවත් පත් වාරණයන් පවා ක්‍රියාත්මක කළ බවත් ඔබතුමා දන්නවා. එහෙත් ලොව දරුණුම ත්‍රස්තවාදයට එරෙහිව දැවැන්ත සටනක් කිරීමට සිදු වුවත් අප පාලන කාලය තුළ කිසිදු විටක හදිසි නීතිය යටතේ පුවත් පත් වාරණයක්, පාලනයක් ගෙන ආවේ නැහැ. එදා මානුෂික මෙහෙයුමට ඉතා බරපතළ ලෙස සමහර මාධ්‍ය මඟින් බාධාවන් එල්ල කළත් මේ දක්වාත් අප මාධ්‍ය වාරණයක් සිදු කරන්නට උත්සාහ කළේ නැහැ; සිදු කළේ නැහැ. එය අප කළ සැබෑ මානුෂික මෙහෙයුමක් බව ලොවට පෙන්වන්නට තිබෙන හොඳම සාධකයක් කියා මා විශ්වාස කරනවා. නමුත් ඒ මාධ්‍ය නිදහස පවා අද පාවිච්චියට ගන්නේ අප මෙහෙයුම අපකීර්තියට ලක් කරන්න බව මා ප්‍රකාශ කරන්නේ ඉතාම කනගාටුවෙන් යුතුවයි. 2006 ජූනි මස සිට 2009 මැයි මස දක්වා කාලය තුළ අප මෙහෙයවූ මානුෂික මෙහෙවර මඟින් ත්‍රස්තවාදය මේ රටෙන් තුරන් කිරීමට අපට හැකි වුණා.

එතැන් සිට එම ප්‍රදේශ ජන ජීවිතයට විවෘත කිරීමට අවශ්‍ය වන පරිදි බිම් බෝම්බ ඉවත් කිරීමත්, මූලික යටිතල පහසුකම් සැපයීමත්, අවතැන් වූවන් යළි පදිංචි කිරීමත් අපේ ප්‍රධාන වග

[අතිගරු මහින්ද රාජපක්ෂ මහතා]

කීමක් වුණු බව ඔබතුමා දන්නවා. එම කාර්යයේ උසස් ප්‍රතිඵල අපට ලබා ගත හැකි වුණා. ගරු කථානායකතුමනි, 300,000කට ආසන්නව අවතැන් වී සිටි පිරිසෙන් 8,000ක් හැරුණු විට ඉතිරි අය තමන් පදිංචි ස්ථානවල නැවත පදිංචි කර තිබෙනවාය කියන එකත් ඔබට මතක් කරන්නට කැමැතියි. එම ප්‍රදේශවල පාසල්, සෞඛ්‍ය, පරිපාලන පහසුකම් යළි ඇති කර තිබෙනවා. ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ජීවනෝපාය මාර්ග ඇති කිරීම සඳහා කෘෂිකර්මය, සත්ව පාලනය, ධීවර, සංචාරක, වෙළෙඳ, මූල්‍ය කටයුතු යථා තත්ත්වයට පත් කර තිබෙනවා. මේ වන විට එම ප්‍රදේශ යල් කන්නයේ වී අස්වැන්න මෙන්ම ලූනු, එළවලු වැනි අතිරේක බෝගවල අස්වැන්න ද නෙළා ගැනීමේ අවස්ථාවට පැමිණ තිබෙනවා. එම ප්‍රදේශවල ජනතාව ධීවර හා සත්ව කටයුතුවලට පමණක් නොව, ඉහළ මට්ටමක වාණිජ කටයුතුවලට ද ක්‍රමයෙන් ප්‍රවේශ වන බව ඔබ දන්නවා.

ප්‍රදේශයේ තිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍ය මං මාවත්, දුම්රිය මාර්ග, වරායන්, ගුවන් තොටුපොළ, වාරි මාර්ග, ජල සම්පාදන, විදුලිය, වෙළෙඳ පොළ, ගමනාගමන කටයුතු පමණක් නොව ආගමික හා කලා මධ්‍යස්ථාන, ක්‍රීඩාංගණ පහසුකම් ඇතුළු සමස්ත යටිතල පහසුකම් සංවර්ධනයකටද එම ප්‍රදේශය යොමු කර තිබෙනවා. එම ප්‍රදේශය සඳහා පමණක් වෙන් කර ඇති රජයේ ආයෝජනය ඩොලර් මිලියන 2,000ක් ඉක්මවා තිබෙනවා. මෙය -මෙම මුදල්- විවිධ රටවල්වලින් හා මූල්‍ය ආයතන මඟින් දිගු කාලීන ණය හා ආධාර වශයෙන් මෙන්ම රජයේ බදු හා බදු නොවන ආදායම් මාර්ගවලින් ද කරනු ලබන සංවර්ධන කටයුතුයි. ඉදිරි වසර දෙක තුළ මෙම ප්‍රදේශවල පූර්ණ සංවර්ධනයක් අප අපේක්ෂා කරනවා.

ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදී ක්‍රියාවලියෙන් මුළු මහත් දිවයින මුදා ගැනීමත්, ත්‍රස්තවාදී උවදුරට ලක් වූ ප්‍රදේශ යළි ගොඩ නැඟීමත් පමණක් නොව මෙම කෙටි කාලය තුළ එම ප්‍රදේශවල ප්‍රාදේශීය සභා මැතිවරණ ද පවත්වමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයෙන් ශක්තිමත් කර තිබෙනවා. ඉදිරි වසර තුළ උතුරේ පළාත් සභාව සඳහා ද මැතිවරණයක් පැවැත්වීමට අප අපේක්ෂා කරනවා. මෙමඟින් ප්‍රාදේශීය සභාත්, පළාත් සභාත්, පාර්ලිමේන්තුවත් සඳහා සාමාජිකයින් තෝරා පත් කර ගැනීමටත්, ජනාධිපතිවරයා තෝරා ගැනීමටත් උතුරු පළාතේ ජනතාවට අනිකුත් ප්‍රදේශවල මෙන්ම එක හා සමාන අවස්ථාවක් උදා කර දීමට අප සමත් වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලනය ක්‍රියාත්මක කිරීම සඳහා ද සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරින්, සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල නිරත වන වෛද්‍යවරුන්, ගුරුවරුන් හා අනිකුත් සේවකයන් එම ප්‍රදේශවලට අවශ්‍ය පරිදි යොදවා තිබෙනවා. රාජ්‍ය සේවයේ මෙම ව්‍යාප්තියත් සමඟ එම ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට අවශ්‍ය සාමාන්‍ය පරිසරය ගොඩ නැඟීමට කටයුතු යොදා තිබෙනවා. එම ප්‍රදේශවල වැඩ කරන නිලධාරින්ගේ භාෂා දැනුම පුළුල් කිරීමටත්, අනිකුත් ප්‍රදේශවල රාජ්‍ය සේවකයින් සියලු භාෂාවලින් වැඩ කිරීමට හැකි වන පරිදි ජාතික වැඩ පිළිවෙළක් ද ක්‍රියාත්මක කිරීමටත් රජය කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධනයේ ද අප පුළුල් ප්‍රගතියක් මේ වන විට ලබා තිබෙනවා. 2010 වර්ෂයේදී අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8 දක්වා ගෙන ඒමට අප සමත් වුණා. එම ප්‍රවණතාව මෙම වර්ෂයේ මුල් හය මාසය තුළ ද පැවති බව සංඛ්‍යාලේඛන මඟින් පැහැදිලි වනවා. රටේ උද්ධමනකාරී තත්ත්වය අඩු වීමත්, ආහාර හා එළවලු සුලභ වීමෙන් ආහාර සුරක්ෂිතතාව තහවුරු වීමකුත් අප දකිනවා. රැකීරක්ෂා හිඟය සියයට පහ දක්වාත් අඩු වී තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම හත්ලක්ෂයක පමණ ඉහළ අගයකට ළඟා වී තිබෙනවා. දිවයිනේ සෑම ප්‍රදේශයකම විදේශීය සංචාරකයන්ට මෙන්ම දේශීය සංචාරකයන්ට ද නිදහසේ ගමන් කිරීමට සුදුසු පරිසරයක් ගොඩනඟා තිබෙන බව ඔබ දන්නවා.

ගරු කථානායකතුමනි, ආයෝජන කටයුතු ඉහළ මට්ටමකට පැමිණෙමින් තිබෙන බව කිව යුතුයි. අපනයන කටයුතුවල ඇති සීඝ්‍ර වර්ධනයත්, විදේශ මුදල් ගලා ඒමත් නිසා විදේශ සංචිත ද ඩොලර් බිලියන අටක මට්ටමකට දැන් ළඟා වී තිබෙනවා. විනිමය අනුපාතය ස්ථාවර වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාමේ පැවති අවිනිශ්චිතතා රාශියක් මඟ හැරී ගොස් තිබෙනවා. පොලී අනුපාතය පහළ මට්ටමක තිබෙන නිසා පෞද්ගලික අංශයේ ණය ලබා ගැනීම වැඩි වෙමින් පවතිනවා. වරාය, ගුවන් තොටුපොළ, මහාමාර්ග, විදුලිය, වාරි මාර්ග, ජල සම්පාදන වැනි ක්ෂේත්‍රවල පුළුල් යටිතල පහසුකම් සංවර්ධනයක් ඇති වෙමින් පවතිනවා. "දිවි නැඟුම" වැඩසටහන මඟින් කෘෂිකාර්මික අංශයේ පමණක් නොව ගෘහ ආර්ථිකය ද ස්වයංපෝෂිත වෙමින් පවතිනවා. මෙම ආර්ථික ප්‍රගතිය දිවයිනේ අස්සක් මුල්ලක් නෑර ඇති කරමින් අධ්‍යාපනයේත්, සෞඛ්‍ය සේවාවලත්, සමාජ සංරක්ෂණයේත් අපේ ජනතාවට හිමි විය යුතු සියලු මූලික අයිතිවාසිකම් පුළුල් කිරීමට "මහින්ද චින්තන ඉදිරි දැක්ම" සමත් වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2009 මැයි මාසයේ ත්‍රස්තවාදී ක්‍රියා අවසන් කිරීමේ සිට මේ දක්වා කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවක් රටේ වාර්තා වී නැහැ, මනඃකල්පිත ග්‍රීස් යකා හැර. එම කාලය තුළ මැතිවරණ රාශියක් ද පවත්වමින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයකට රට ගමන් කර තිබෙනවා. එම මැතිවරණ ද සාමකාමී හා සාධාරණ මැතිවරණ බවට සමාජය විසින් පිළිගෙන තිබෙනවා. මේ නිසාම පසු ගිය කාලය තුළ හදිසි නීතියේ විවිධ කොන්දේසි ඉවත් කරමින් අපේ සමාජය සාමාන්‍ය පරිපාලනය යටතට ගෙන ඒමට අප සමත් වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියා වාර්තා නොවන බව ජාත්‍යන්තර වශයෙන් ද පිළිගෙන තිබෙනවා. එපමණක් නොව, ත්‍රස්තවාදය පෝෂණය කරන ත්‍රස්තවාදීන් විසින් කරනු ලබන මූල්‍ය ගනුදෙනු, භාණ්ඩ හුවමාරු කිරීම්, මත්ද්‍රව්‍ය ජාවාරම්, මූල්‍ය හා බැංකු ක්ෂේත්‍රවල අවදානම් වළක්වා ගත හැකි ජාත්‍යන්තරව පිළිගනු ලබන නීති රීති රාශියක් අප විසින් මේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබෙනවා. ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීමට අමතරව මෙම නීතිරීති මඟින් ත්‍රස්තවාදය ඇති වීමට ඇති ඉඩප්‍රස්ථා වළක්වා ගැනීමට අප කටයුතු කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, එම ව්‍යවස්ථාව පදනම් කර ගෙන මෙම පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගෙන ඇති නීති රීති මඟිනුත් නීතිය හා සාමය රැකීමට අපේ රජයට හැකි වී තිබෙන බව සඳහන් කරන්නේ ඉතා ආඩම්බරයෙනි. එබැවින්, වසර ගණනකට පසු ලබා ගත් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස රැක ගැනීම අපේ වග කීමක් වනවා. නීතිය අතට ගනිමින් අවිචාර ලෙස ක්‍රියාත්මක වන්නන්ට රටේ නීතිය තුළ කිසිදු ඉඩක් ඇති නොවීමට රාජ්‍ය පරිපාලනය, පොලීසිය හා අධිකරණය ක්‍රියාත්මක වනුයේ සාමාන්‍ය නීතිය යටතේ වීම ජනතාව ලැබූ විශාල ජයග්‍රහණයක්. මෙම ජයග්‍රහණය මේ රටට ලබා ගත හැකි වුණේ වීරෝදාර සෙබළුන් ආදර්ශවත් ලෙස දැඩි කැප වීමෙන් මානුෂික මෙහෙවර නිම කළ නිසායි; ඒ සඳහා මේ රටේ ජනතාව ඉවසීමෙන් යුතුව පරිත්‍යාගශීලි වූ නිසායි. එයින් අප ලබා ඇති ප්‍රතිඵල අති විශාලය. එම ප්‍රතිඵල තව තවත් අර්ථවත් කරමින් අප රට ආසියාවේ නැඟී එන ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස ශක්තිමත් කිරීමට අඩිතාලමක් දැම්මා.

ගරු කථානායකතුමනි, වසර ගණනාවක් මෙම පාර්ලිමේන්තුව සෑම මසකම හදිසි නීතිය සම්මත කළා. ඇතැම් අය එයට විරුද්ධව ඡන්දය දෙනු ලැබුවා. ඇතැම් අය ඡන්දය දීමෙන් වැළකී සිටියා. මෙම උත්තරීතර පාර්ලිමේන්තුව මේ රටේ පවත්නා සියලුම දේශපාලන පක්ෂ නියෝජනය වන තරමටම පොහොසත් වූ පාර්ලිමේන්තුවක්. මේ නියෝජනය තුළින් රටේ පවත්නා විවිධ මත එක් රැස් කරන ඉතා වටිනා සම්පතක් ලෙස ගරු කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා සැලකිය හැකියි. සියලු ජාතීන්, සියලු ආගම් මෙන්ම ලිබරල්වාදීන්

මෙන්ම ප්‍රගතිශීලී මතධාරීන්ගෙන් ද මෙය පෝෂණය වී තිබෙනවා. ඒ සියලු දෙනාම පසු ගිය කාලය තුළ පුළුල් අත් දැකීම් ලබා තිබෙනවා. තරුණ මන්ත්‍රීවරුන් 40 දෙනෙක් පමණ ද මෙම පාර්ලිමේන්තුව තුළ නියෝජනය වනවා. ප්‍රථම වරට ත්‍රස්තවාදී බලපෑම්වලින් තොරව, විවෘතව හා ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ අපේ රටේ පවත්නා ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. එම නිසා මෙම පාර්ලිමේන්තුව තුළින් එම අවස්ථාව මේ රටට උදා කර දෙන ලෙස මේ රටේ ජනතාව වෙනුවෙන් මෙම පාර්ලිමේන්තුවෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදීව රටේ ඉදිරි කටයුතු සාමාන්‍ය නීතිය යටතේ පවත්වා ගැනීමට හදිසි නීතිය ඉවත් කිරීමේ යෝජනාව අද මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කිරීමට මා කැමැතියි. රටේ පාලන කටයුතු සඳහා හදිසි නීතියේ අවශ්‍යතාවක් දැන් නොමැති බවට මා සෑහීමකට පත් වී ඇති නිසායි මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේ නිසා හදිසි නීතිය දීර්ඝ නොකිරීමට අපි කටයුතු කරන බව ඔබ වෙත දන්වනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම, හදිසි නීතිය ඉවත් කරනවා කියන වැදගත් ප්‍රකාශය මෙම ගරු සභාව තුළ කිරීම ගැන අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, මම කීප වතාවක් ප්‍රකාශ කර තිබෙන හැටියට මේ රටේ වැදගත් කරුණු කියන්නේ සභාව ඇතුළේ නොවෙයි, සභාවෙන් පිටතදීයි. එහෙම නම් මම බලාපොරොත්තු වනවා ජනාධිපතිතුමනි, මේක හොඳ ආරම්භයක් කියලා. වැදගත් කාරණා සියල්ල ප්‍රකාශ කළාට පස්සේ වුවමනා නම් ඒ ගැන විවාද කරන්න හෝ විවාද නොකරන්න අපට පුළුවන්.

හදිසි නීතිය ඉවත් කිරීම ගැන විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය තිබෙනවායි කියන එක මම අලුතෙන් ප්‍රකාශ කරන්න වැඩක් නැහැ. හදිසි නීතිය ආවේ යුද්ධය නිසා. දැන් යුද්ධය අවසානයි. ඇත්ත වශයෙන්ම අපි දැනට අවුරුද්දකට ඉස්සෙල්ලා ඉල්ලුවා, හදිසි නීතිය ඉවත් කරන්න කියලා. ඊට පස්සේ කාල සීමාව තුළ අපට සිදු වුණා, හදිසි නීතියට විරුද්ධව ඡන්දය දෙන්න. කෙසේ හෝ කල් ගිහිල්ලා හරි හදිසි නීතිය ඉවත් කිරීම ගැන අපි අපේ සන්තෝෂය ප්‍රකාශ කරනවා. ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ සඳහන් වුණු පරිදි හදිසි නීතිය ආරම්භ වුණේ 1983 දී. එක පැත්තකින් ත්‍රස්තවාදී යුද්ධය තිබුණා. අපි ඊට ඉස්සෙල්ලා එල්ටීටීඊ ය තහනම් කිරීමේ නීතිය ගෙනාවා. ඒක අසාර්ථක වුණු නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගෙනාවා. හදිසි නීතිය ගෙනාවේ ඒ ත්‍රස්තවාදී සංවිධාන කරන ලද කටයුතු මර්දනය කරන්නයි. මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් ජාතික එකමුතුව ගැන දේශපාලන වශයෙන් අපි සාකච්ඡා කර ගෙන ගියා. 2009 දී එල්ටීටීඊ යේ පරාජයෙන් පස්සේ යුදමය කටයුතු අවසන් වුණා. ඒ නිසා අද හදිසි නීතිය ඉවත් කළා. ඒත් අපි විශේෂයෙන්ම සඳහන් කරන්නට කැමැතියි, තවම දේශපාලන පැත්තේ ප්‍රශ්න විසඳන්න තිබෙනවා කියලා. ඒ නිසා අපට මේ රටේ ජනවාර්ගික ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් වන විධියට ජාතික සම්මුතියක් ඇති කර ගන්න පුළුවන්. එහෙම එකඟත්වයකට අපට එන්න පුළුවන් වෙයි. විශේෂයෙන්ම මේ සම්බන්ධ සාකච්ඡා යළිත් ආරම්භ කරලා ඒක සාර්ථක කර ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් ඒකට ආණ්ඩුවේ අවධානයත් යොමු වෙන්න වුවමනායි. ඒත් අපි එක තීරණයක් ගන්න ඕනෑ, මේ ප්‍රශ්නය තවත් අදින්නේ නැතිව විසඳා ගන්න.

හදිසි නීතිය අද අවසන් කළාය, අහෝසි කළාය කියලා ඒක අවසානයක් වශයෙන් සලකන්න එපා. අපට ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කරන්න තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කරන්න තවත් පියවර ගණනාවක් ගන්න තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

Hon. Member, you can speak later on.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

No, no, I am thanking the President. Do not worry. - [*Interruption.*] Sir, give me a minute. I am only - [*Interruption.*]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

Courtesy has been extended to the Hon. Leader of the Opposition. There is not enough time now. So, you must not make your speech too long.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

I will not take very long time. But, I want to tell one thing.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

එතුමා ස්තුතියක් කරන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)

(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, තව විශේෂ කාරණයක් තිබෙනවා. ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කොහොමද කථා කරන්නේ කියන එක සම්බන්ධයෙන් රීති නැහැ. ඒ නිසා මා කියන්නේ, "අපි අනාගතයේදී ඒ රීතීත් ඇති කර ගනිමු" කියලායි. ප්‍රශ්න අවස්ථාවක් දීම ආදී සියල්ල අපි මෙතැනදී ඇති කර ගන්න ඕනෑ. දැන් ගරු කථානායකතුමා පාලනය කර ගෙන තිබෙන්නේ. කෙසේ හෝ අපි ඒක ස්ථාපනය කරන්න ඕනෑ. මා කියන්නේ ආණ්ඩු පක්ෂයයි, විරුද්ධ පක්ෂයයි එකට එකතු වෙලා මේ ප්‍රශ්න විසඳා ගන්න එක වඩා හොඳ බවයි. එතකොට අපට පිටින් එන බලපෑම් නැති වෙනවා. එන අවුරුද්දේ ලෝකයේ විශාල ආර්ථික අභේනියක් ඇති වෙනවා. ඊට ඉස්සර වෙලා අපට එකඟ වෙන්න පුළුවන් නම් ඒක වඩා හොඳයි කියලා මා කියන්න කැමැතියි. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කිරීම ගැන විශේෂ කාරක සභාවක් තිබ්බාට කමක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, සැප්තැම්බර් මාසයේ පළමුවැනි සතියේත් හදිසි නීතිය දීර්ඝ කිරීම පිළිබඳ විවාදය වෙනුවෙන් දිනයක් වෙන් කරලා තිබෙනවා. දැන් ඒ විවාදය නැත්නම් අපි පක්ෂ නායකයන්ගේ රැස්වීමක් තියලා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පක්ෂ නායකවරුන්ගේ රැස්වීමක් කැඳවලා ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ඉල්ලීමක් කරනවා පක්ෂ නායකයන්ගේ රැස්වීමක් පවත්වන්න කියලා.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව,

2011 අගෝස්තු මස 22 වැනි දින,

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පතෙහි ද,

2011 අගෝස්තු මස 23 වැනි දින,

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ)

ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පදනම (සංස්ථාගත කිරීමේ)

ඕලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පත්හිද,

මවිසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2010 ජුනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

1980 අංක 26 දරන ආහාර පනතේ 17(2) වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2009 ජුනි 03 දිනැති අංක 1604/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය;

1980 අංක 26 දරන ආහාර පනතේ 17(2) වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 ජනවාරි 04 දිනැති අංක 1635/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය; සහ

1980 අංක 26 දරන ආහාර පනතේ 17(2) වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 පෙබරවාරි 10 දිනැති අංක 1640/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය.-[සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මම තෙල්වත්ත, පැරැලිය, "වාසනා" නිවසෙහි පදිංචි එම්.ඩබ්ලිව්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු කථානායනකතුමනි, මම ගාල්ල, රිච්මන්ඩ් කන්ද පාර, කුඹල්වැල්ල පළමු පටුමඟ, අංක 3/45සී. දරන ස්ථානයේ පදිංචි ඩී.එල්. සුමිත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වසන්ත සේනානායක මහතා**
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)
Sir, I present a petition from Mrs. Niluka Priyadharshani Perera of No. 75/5, Sonduru Watta, Bothale Ihalagama, Ambepussa.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය: බලපත්‍ර
## தனியார்மயமாக்கற் கொள்கை: உரிமங்கள்
## PRIVATIZATION POLICY : LICENCES

0589/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) රජය ප්‍රතිපත්තියක් ලෙස පෞද් ගලීකරණයට විරුද්ධ ද;

(ii) රටක් ලෙස අස්පෘශ්‍ය වත්කම්වලට අගයක් තිබේද;

(iii) රටේ අස්පෘශ්‍ය වත්කම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි නාලිකා, රූපවාහිනී නාලිකා, චන්ද්‍රිකා විකාශන සේවා සපයන්නන්, ජංගම දුරකථන සේවා සපයන්නන්, බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් හා නිවෙස් කරා සෘජුවම සේවා සපයන ආයතන ආදිය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලයලත් ආයතනයේ නම කවරේද;

(ii) පසු ගිය වර්ෂ හයක කාලය තුළ ඉහත එක් එක් කාණ්ඩය යටතේ නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව කවරේද;

(iii) එම බලපත්‍ර ලබා දීම තුළින් උපයාගත් ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් කරන ලද බලපත්‍ර ටෙන්ඩර් පදනමක් මත ලබා දිය හැකි බවත්;

(ii) ඉහත සඳහන් බලපත්‍ර නිකුත් කිරීමට අනුගමනය කරන වත්මන් ක්‍රමය රහසිගතව සිදු කෙරෙන පුද්ගලීකරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கம் கொள்கை அளவில் தனியார் மயமாக்க லுக்கு எதிராக உள்ளதா என்பதையும்,

(ii) நாட்டின் கண்கூடற்ற சொத்துக்களுக்கு பெறுமதி யுண்டா என்பதையும்,

(iii) நாட்டின் கண்கூடற்ற சொத்துக்கள் எவை என்பதையும்

அவர் சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) வானொலி, தொலைக்காட்சி, செய்மதி ஒளிபரப்புச் செயற்படுத்துனர்கள் கையடக்கத் தொலைபேசிச் செயற்படுத்துனர்கள், அகலப்பட்டை செயற்படுத் துனர்கள், மற்றும் வாசலில் இருந்து வீட்டிற்கு (DTH) சேவை வழங்குனர்கள் ஆகியோருக்கு உரிமம் வழங்கும் அதிகார சபையின் பெயர் என்ன என்பதையும்,

(ii) கடந்த ஆறு வருடங்களில் மேற்படி வகைப்பிரிவுகளின் கீழ் வழங்கப்பட்ட எல்லா உரிமங்களும் யாவை என்பதையும்,

(iii) அவ் உரிமங்களை வழங்குவதால் பெற்றுக் கொள்ளப்பட்ட வருமானம் என்ன என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி உரிமங்கள் விலை மனுகோரல் அடிப் படையில் வழங்கப்படலாம் என்பதையும்,

(ii) மேற்படி உரிமங்களை வழங்கும் தற்போதைய முறைமையானது ஒரு இரகசியமான தனியார் மயமாக்கல் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) whether the Government is against privatization as a policy;

(ii) whether as a country has intangible assets, got a value; and

the intangible assets of the country?

(b) Will he sate-

(i) the name of the authority that issues licences to radio channels, TV channels, satellite broadcasting operators, mobile operators, broadband operators and Door to House (DTH) etc;

(ii) the all licences issued under aforesaid categories for the last 6 years; and

(iii) the revenue obtained from issuing such licences?

(c) Will he admit that-

(i) the aforesaid licences could be issued on a tender basis; and

(ii) the present system of issuing above licences is a secret privatization?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රජය ලාභ ලබන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණයට එකඟ නැත. ලාභ ලබන රාජ්‍ය ආයතන මනා කළමනාකරණයෙන් යුතුව පාඩු නොලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා රජය නිරතුරුවම, ස්ථිරව කැප වී සිටී.

එහෙත් විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යන පරිදි පෞද්ගලික අංශය රටේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම සඳහා ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගැනීම පිණිස ද රජය ප්‍රතිපත්තිමය වශයෙන් ඉදිරිපත් වේ. එසේම පෞද්ගලික අංශය සමඟ තරගකාරී අන්දමින් වෙළඳ පොළ තුළ කටයුතු කර

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ජනතාවට වඩාත් සහනදායී භාණ්ඩ හා සේවාවන් ලබා දීමට රජය ප්‍රතිපත්තිමය වශයෙන් බැඳී සිටියි. මෙහිදී රජය සහ පෞද්ගලික අංශය අතර ඇති වන විශේෂ සහයෝගීතාවන් (Public Private Partnerships) සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ.

(ii) ඔව්.

එය මුදල්මය වටිනාකමින් රටේ ගිණුම් පොත්වල නොපෙන්වයි. එය රටක ආර්ථික සංවර්ධන මට්ටම හා මානව සම්පත්වල ගුණත්වය තුළින්ද තවත් රටක සමාන ඉලක්ක ළඟා කර ගැනීම් හා සසඳන විට විද්‍යාමාන වන සැඟවුණු වැදගත් මූර්ත වටිනාකමකි.

(iii) රටේ අස්පෘශ්‍ය වත්කම් පහත පරිදි වේ:

1. නව සොයා ගැනීම්වල බලය (නවීකරණය, සංවර්ධන හා නව සොයා ගැනීම්)
2. ජාතික වශයෙන් හා අන්තර් ජාතික වශයෙන් දැනුම හුවමාරු කර ගැනීමේ බලය. (දැනුම බෙදා ගැනීමේ හැකියාව)
3. මානව සම්පත්වල බලය (අධ්‍යාපනය, පුහුණුවීම් හා ජීවිතාන්තය දක්වා වූ අධ්‍යයන සඳහා කරන ලද ආයෝජන, කම්කරු සබඳතා සහ දිගුකාලීන ලාභදායිත්වය මත පදනම් වූ සංස්ථාපිත සංස්කෘතිය, ව්‍යවසායකත්වය හා ලෝක ආර්ථිකයට කරනු ලබන දායකත්වයේ ප්‍රමාණය) ව්‍යුහාත්මක ප්‍රාග්ධනය සමඟ ඥාන බලය එක් වූ විට අනාගත වර්ධනය උත්පාදනය කරන බව පිළිගත් සත්‍යයකි.
4. තොරතුරු තාක්ෂණය
5. බුද්ධිමය ප්‍රාග්ධනයේ ආයෝජනය. (හිමිකම් සහතික ආදිය)
6. රටක ආර්ථික දියුණුව හා සේවා නියුක්තිය වෙනුවෙන් දායක වන අදෘශ්‍යමාන හා මුදල්මය නොවන අනෙකුත් සියලුම වත්කම්.

(ආ) (i) ගුවන් විදුලි නාලිකා, රූපවාහිනී නාලිකා හා චන්ද්‍රිකා විකාශන සේවා සපයන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය ලත් ආයතනය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයයි. මේ සඳහා විද්‍යුත් තරංග සංඛ්‍යාත ලබා දීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

ජංගම දුරකථන සේවා සපයන්නන්, බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් හා නිවෙස් කරා සෘජුවම සේවා සපයන ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම කරනු ලබන්නේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

(ii)

| | |
|---|---|
| ගුවන් විදුලි නාලිකා ගණන | 14 |
| රූපවාහිනී නාලිකා ගණන | 12 |
| ස්ථාවර රැහැන් රහිත දුරකථන සේවා | 01 |
| ජංගම දුරකථන සේවා | 01 |
| බ්‍රෝඩ්බෑන්ඩ්, දත්ත සන්නිවේදන හා අන්තර්ජාල පහසුකම් | 02 |
| චන්ද්‍රිකා විකාශන සේවා | 03 |
| රැහැන්ගත රූපවාහිනී | 03 |

(iii) රුපියල් මිලියන 803

(ඇ) (i) ඔව්.

(ii) පිළිනොගනී.

(ඈ) අංක 1435/20 දරන 2006 මාර්තු 10 දින ප්‍රකාශිත අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන්

බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කොන්දේසි අනුව බලපත්‍ර නිකුත් කිරීම සිදු කරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නයක් අහනවා. බලපත්‍ර ලබා දීම තුළින් උපයා ගත් ආදායම රුපියල් මිලියන 803ක් බව සඳහන් කර තිබෙනවා. තිබෙන ලයිසන් ප්‍රමාණය අනුව බලන විට මේ රටට ලැබී තිබෙන ආදායම කොතරම් කුඩා ප්‍රමාණයක්ද කියා මම අහනවා. මේක කෝටි ප්‍රකෝටි ගණනින් ආදායම් ලබන්න පුළුවන් අවස්ථාවක්. නමුත් ඒ ආදායම මේ රටට අහිමි වෙලා තිබෙනවා, ටෙන්ඩර් ක්‍රමය අනුගමනය නොකිරීම නිසා. ඒ නිසා කරුණාකරලා ඉදිරියේදීවත් ටෙන්ඩර් ක්‍රමය අනුව මේ කටයුතු කරනවාද කියා මම අහනවා. සාමාන්‍යයෙන් එක ලයිසන් එකකින් මිලියන 900ක්, 1000ක් ලබා ගන්න පුළුවන් අවස්ථාවක් තමයි තිබුණේ. මේක හරිම අපරාධයක් නොවෙයිද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකරලා ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, එතුමා කතාවක් කළේ. ඡන්ද කාලය නිසා ඉතින් කතා කරන එක හොඳයි. [බාධා කිරීමක්] කෝටි ප්‍රකෝටි ආදී වශයෙන්, තිබෙන වචන ඔක්කොම පාවිච්චි කරනවා. සංඛ්‍යාත්මක වශයෙන් මෙවැනි ක්ෂේත්‍රවලට ඇතුළු වීමේදී අපි මූලාරම්භකව ලබා තිබෙන-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තමුන්නාන්සේගේ උත්තරය තවත් කථාවක් නේද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්. මොකද, අපිත් ඡන්දය ගන්නවා. තමුන්නාන්සේලා පරදිනවා. අපි දිනනවා. ඒ නිසා මමත් කථා කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ සංඛ්‍යාත්මක මූලාරම්භය ගැන එතුමාගේ මතය අප පිළිගන්නේ නැහැ. මූලාරම්භයේදී ඇති වන විශ්වාසය මතයි ඉදිරිය ගොඩ නැඟෙන්නේ. දෙවැන්න, රහසිගතව කිසි දෙයක් කරලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක් ඔබතුමා කරන්නේ. මම දැන් උත්තරය දුන්නා. පෞද්ගලික අංශයට විවෘත කර තිබෙනවා. පෞද්ගලික අංශය අනුගමනය කළ යුතු කොන්දේසි ගැසට් නිවේදනයේ තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ටෙන්ඩර් ක්‍රමය ගැනයි ඇහුවේ. ගැසට් ගහන්නේ ඔබතුමන්ලා. මේ අවස්ථාවේ දෙවැනි කරුණ හැටියට මට කියන්න තිබෙන්නේ

මේකයි. මම මේක උපුටා ගත්තේ ඉන්දියාවෙන්. 2G scam එකෙන් ඉන්දියාවේ කොයි තරම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවාද? ඒක තමයි මිලියන ගණනක් නැති වෙලා තිබෙන අවස්ථාව. ලංකාවටත් ඒ වාගේ ආදායමක් උපයන්න පුළුවන් අවස්ථාවක් තමයි නැති කරලා තිබෙන්නේ. ඒකයි මම මෙතැන කියන්නේ. ඔබතුමා දැන් ඉදිරිපත් කළ තොරතුරු අනුව මේ ඔක්කොම වැය කරලා ලැබුණු සම්පූර්ණ ආදායම රුපියල් මිලියන 816යි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්දියාවේ දූෂණ ගැන ඉන්දියානු රජයට චෝදනාවක් කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ අද ඉන්දියානු රජයට දූෂණ චෝදනාවක් කරන්නේ. මේ උදාහරණය සාධාරණ නැහැයි කියලා අපි කියන්න ඕනෑ. ඉන්දියාවේ කෙරෙන වැඩ ඉන්දියාවේ කෙරෙයි. නැත්නම් තමුන්නාන්සේ දන්නා තවත් රටක කෙරෙයි. පෞද්ගලික අංශයට ඇතුළු වන්න ඉඩ දෙන්න -සහාය වන්න ඉඩ දෙන්න - අපේ රට හැටියට අපි අනුගමනය කරලා තිබෙන්නේ ඉතාමත් විවෘත ප්‍රතිපත්තියක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවන අතුරු ප්‍රශ්නය වශයෙන් මා අහන්නේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා දැන් වක්‍රශීලීව පිළිගෙන තිබෙනවා, පෞද්ගලීකරණය. දැන් කිව්වා, ලාභ ලබන ආයතන විකුණන්නේ නැහැ, පාඩු ලබන ආයතන ගැන බලනවා, ජනතාවට හිතෛෂී දේවල් නම් කරනවාය කියලා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති නැවත පිළිගෙන, දැන් වචනවලින් සෙල්ලම් කර කර, රටට මෙතෙක් කල් කරපු ප්‍රෝඩාව අද හෙළිදරව් වුණා. ලාභ ලබන ආයතන වුණත් පාඩු ලබා විකුණන්න පුළුවන් කියන එක තමයි මෙතැනින් කියන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නයක් නොවෙයි අහන්නේ. කථාවක් කරන්නේ. ගරු කථානායකතුමනි, මේ කථාවට උත්තර දෙන්න කියා ඔබතුමා කියනවා නම් මට විනාඩි කිහිපයක් දෙන්න. මොකද, එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කිව්වා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පවරා ගත්ත රාජ්‍ය වතු අංශය රාජ්‍ය අංශයක් ලෙස පවත්වා ගෙන යන්න ඕනෑය කියලා. ඒක ඉගෙන ගත්තේ අපෙන්. ඒ ප්‍රතිපත්තිය ඉගෙන ගත්තේ අපෙන්. ආර්ථිකයේ කාලීන වෙනස්කම්වලට අපි ගමන් කරන අතර මූලික වගකීම් රාජ්‍ය ආයතනවල තබා ගෙන ගමන් කරන ප්‍රතිපත්තිය අනුගමනය කරනවා. පෞද්ගලික අංශයට ඉඩ දෙනවා. තමුන්නාන්සේලා නොවෙයි පෞද්ගලික අංශය හැදුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවයි. [බාධා කිරීම්] කවුද හැදුවේ? මේ රටේ පෞද්ගලික ව්‍යාපාර හැදුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බව වග කීමෙන් යුතුව කියන්න ඕනෑ. පෞද්ගලික අංශයේ අලුත් කර්මාන්ත ගණනාවක් ඇති වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව කාලයේදීයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොයි කාලයේදීද? [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේලා ඒක අනුගමනය කළා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා ඒක අනුගමනය කළා. [බාධා කිරීම්] විදේශිකයන් ගෙන්වලා - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. දැන් ප්‍රශ්න අංක 2.

## කේ.ඒ. සේනාධීර මහතා : විනය ක්‍රියා මාර්ග
## திரு. கே.ஏ. சேனாதீர: ஒழுக்காற்று நடவடிக்கை
## MR. K.A. SENADHEERA: DISCIPLINARY ACTION

1086/'11

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යාපාරික තැපැලේ සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීමට කේ. සී. ජයරත්න සහ යූ. එල්. ආරියපාල යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කළ බවත්;

(ii) එම කමිටුවේ මූලික විමර්ශන වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවටද පිටපතක් සහිතව 2008.06.26 දාතමින් තැපැල්පති වෙත යවා ඇති බවත්;

(iii) එම වාර්තාව අනුව ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31 වැනි වගන්තිය අනුව නියෝජ්‍ය තැපැල්පති කේ. ඒ. සේනාධීර මහතා විෂමාචාරයන් සිදු කර ඇති බවට නිගමනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම නිලධාරියාට එරෙහිව ගන්නා ලද විනය පියවර සහ දිනය;

(ii) විනය ක්‍රියා මාර්ග ගනු නොලබන්නේ නම්, ඊට හේතු;

(iii) විෂමාචාර චෝදනා ලැබ සිටින සේනාධීර මහතා සේවක විරෝධතා පවතිද්දී එම තනතුරට පත් කිරීමට හේතු වූ කරුණු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ඇ) ඉහත කමිටු වාර්තාවේ සඳහන් අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

தபால் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வர்த்தக தபாலில் ஏற்பட்டுள்ள மோசடிகள் சம்பந்தமாக ஆரம்ப விசாரணையொன்றை மேற்கொள்வதற்காக தபால், தொலைத்தொடர்புகள் அமைச்சின் செயலாளரால் கே.சீ.ஜயரத்ன மற்றும் யூ.எல். ஆரியபால ஆகியோரைக் கொண்ட குழுவொன்று நியமிக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி குழுவின் ஆரம்ப விசாரணை அறிக்கை அரசாங்க சேவைகள் ஆணைக்குழுவிற்கு பிரதியொன்றுடன் 2008.06.26ஆம் திகதியன்று தபால் மாஅதிபருக்கு அனுப்பப்பட்டுள்ளது என்பதையும்;

(iii) அவ்வறிக்கையின்படி தாபன விதிக்கோவையின் XLVIIIஆம் அத்தியாயத்தின் 31வது வாசகத்தின் பிரகாரம் பிரதி தபால் மாஅதிபர் திரு. கே.ஏ. சேனாதீர முறைகேடுகளில் ஈடுபட்டுள்ளதாகத் தீர்மானிக்கப்பட்டுள்ளதென்பதையும்

அவர்அறிவாரா ?

(ஆ) (i) ஆமெனில், மேற்படி உத்தியோகத்தருக்கெதிராக எடுக்கப்பட்டுள்ள ஒழுக்காற்று நடவடிக்கை மற்றும் அதன் திகதி யாதென்பதையும்;

(ii) ஒழுக்காற்று நடவடிக்கை எடுக்கப்படவில்லையெனில் அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(iii) முறைகேட்டில் ஈடுபட்டதாகக் குற்றச்சாட்டு சுமத்தப்பட்டுள்ள திரு. சேனாதீரவை ஊழியர்களின் எதிர்ப்புக்கு மத்தியில் மேற்படி பதவிக்கு நியமிப்பதற்கான காரணங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி குழு அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள ஏனைய விதப்புரைகள் செயற்படுத்தப்படுமா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன் ?

asked the Minister of Postal Services:

(a) Is he aware that-

(i) a committee consisting of K.C. Jayaratne and U.L. Ariyapala was appointed by the Secretary of the Ministry of Posts and Telecommunications to conduct a preliminary investigation into the irregularities that took place in the business mail;

(ii) a preliminary investigation report of the aforesaid committee was forwarded to the Post Master General on 26.06.2008 along with a copy to the Public Services Commission; and

(iii) according to that report, it has been recommended that the Deputy Post Master General, Mr. K.A. Senadheera has committed acts of misconduct in terms of the section 31 in paragraph XLVIII of the Establishment Code?

(b) If so, will he state-

(i) the disciplinary action taken against the aforesaid officer and the date;

(ii) the reasons if disciplinary action is not taken; and

(iii) the reasons for appointing Mr. Senadheera, against whom allegations of misconduct have been levelled, to the aforesaid post despite objections by employees?

(c) Will he state whether the other recommendations of the aforesaid report will be implemented?

(d) If not, why?

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (තැපැල් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)

(අ) (i) දනිමි.

(ii) මූලික විමර්ශන වාර්තාව තැපැල්පති වෙත ඉදිරිපත් කළ බව නොදනිමි. අමාත්‍යාංශ ලේකම් වෙත 2008.06.10 දින ඉදිරිපත් කරන ලදී.

(iii) දනිමි.

(ආ) (i) එම වාර්තාව අදාළ නිර්දේශ සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කරන ලදී.

(ii) විශ්‍රාමික නිලධාරීන් යොදවා මූලික විමර්ශනය සිදු කර තිබීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම වාර්තාව ප්‍රතික්ෂේප කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන ඒකකයේ නිලධාරීන් යොදවා නැවත මූලික විමර්ශනය කරවන ලෙස නියෝග කර ඇති හෙයින් එසේ කටයුතු කර ඇත.

(iii) "එම තනතුර" කුමක්ද යන්න පැහැදිලි නැත. ඔහු තමාගේ නිත්‍ය තනතුරෙහි සේවය කරයි.

(ඇ) ක්‍රියාත්මක නොකෙරේ.

(ඈ) ඉහත ආ (ii) හි දැක්වූ පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම මූලික විමර්ශන වාර්තාව ප්‍රතික්ෂේප කර ඇති හෙයිනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ස්තුතියි. ගරු කථානායකතුමනි, අංගසම්පූර්ණ පිළිතුරක් ලැබුණා. අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-1101/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-1449/'11-(2), ගරු (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම හොඳයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-0595/'10-(2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විනාශ වූ වැව් ප්‍රතිසංස්කරණය: මූල්‍ය ප්‍රතිපාදන
## அழிவடைந்த குளங்கள் புனரமைப்பு: நிதி ஒதுக்கீடு
## RENOVATION OF DESTROYED TANKS: FINANCIAL ALLOCATION

1102/'11

7. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2011 ජනවාරි මස ඇති වූ වර්ෂාව හේතුවෙන් විනාශයට පත් වූ වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) විනාශයට පත් වූ වැව් ප්‍රතිසංස්කරණය සඳහා රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් කවරේද;

(iii) විනාශ වූ වැව් අතුරින් මේ වන විට පිළිසකර කර ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණය කර නොමැති වැව් සංඛ්‍යාව කොපමණද;

(v) එම වැව් පිළිසකර කිරීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டு சனவரி மாதம் பெய்த மழை காரணமாக அழிவடைந்த குளங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அழிவடைந்த குளங்களைப் புனரமைப்பதற்காக அரசினால் மேற்கொள்ளப்பட்ட நிதி ஒதுக்கீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) அழிவடைந்த குளங்களில் இதுவரை புனரமைக்கப்பட்டுள்ள குளங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) புனரமைக்கப்படாத குளங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) அந்தக் குளங்கள் புனரமைக்கப்படாமைக்கான காரணங்கள் என்னவென்பதையும்

அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House-

(i) the number of tanks that were destroyed due to the rain that was experienced in January 2011;

(ii) the allocations that have been made by the government to renovate the destroyed tanks;

(iii) the number of tanks that have been renovated so far out of the number of tanks that were destroyed;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iv) the number of tanks that have not been renovated; and

(v) the reasons for the failure to renovate those tanks ?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන වැව් කිසිවක් විනාශයට පත්ව නොමැත. එහෙත්, මධ්‍යම පරිමාණ වැව් දෙකක් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිවුලේකඩ වැව හා අම්පාර දිස්ත්‍රික්කයේ වම් ඉවුර ඇළ පද්ධතියේ පිහිටි වලගම වැව සහ එහි ගහ පද්ධතියේ පිහිටි කුඩා වැවක් වන වලතාපිටිය වැවද හානියට පත් විය. කෙසේ වෙතත්, වාරි ව්‍යාපෘති 210ක පමණ වාරි පද්ධතියට ගංවතුර අලාභ හානි සිදු වී ඇත.

(ii) මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 500ක් වෙන් කර වැඩකටයුතු කර ගෙන යනු ලැබේ. එසේම යථා කාලයේදී තවත් රුපියල් මිලියන 1,600ක් වෙන් කිරීමට අපේක්ෂිතයි.

(iii) සියලු ව්‍යාපාරවල වගාව පවත්වා ගෙන යාමට අවශ්‍ය පිළිසකර කිරීම සිදු කර ඇති අතර අනෙකුත් පිළිසකර කිරීම් කෙරෙමින් පවතී.

(iv) අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති හෙයින්, ඉතිරි වැඩ සියල්ල අවසන් කිරීමට හැකි වනු ඇත.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා විශ්වාස කරන හැටියට එතුමා සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව නොමග යවන්නේ නැහැ. නමුත් මා ළඟ විස්තරයක් තිබෙනවා. ඒ අනුව කිලිනොච්චියේ වැව් 7ක්, ඒ වාගේම වවුනියාවේ වැව් 35ක්, ත්‍රිකුණාමලයේ වැව් 35ක් සහ ඇනිකට් 3ක්, අනුරාධපුරයේ වැව් 180ක් සහ ඇනිකට් 3ක්, ඊට අමතරව පොළොන්නරුවේ වැව් 49ක් සහ ඇනිකට් 33ක්, මඩකලපුවේ වැව් 125ක්, අම්පාරේ වැව් 67ක් හා ඇනිකට් 4ක් විනාශයට පත් වුණාය කියනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔව්, ඒක ඇත්ත. ගරු කථානායකතුමනි, මගේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන වාරිමාර්ග පිළිබඳවයි මා පිළිතුර දුන්නේ. මේ වාරිමාර්ග කියන විෂයය යටතේ කුඩා වැව් පළාත් සභාවට තිබෙනවා; ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට තිබෙනවා. ඒ පිළිබඳව තොරතුරු ඔබතුමා ඒ අදාළ ස්ථානවලින් ගන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීට පස්සේ ප්‍රශ්නය අහනකොට අහන්න-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, දැන් අපි ප්‍රශ්නය අහනකොට එතුමා සාමාන්‍යයෙන් ඒ සියල්ල එකට එකතු කරලා තමයි උත්තර දෙන්නේ. ප්‍රවාහන සේවය ගත්තත් ඔය වාගේ නේ. මේක හරියට දුන්නා නම් -මම ඒකයි කිව්වේ. - මේකට මුදල් වෙන් කරනකොට,-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මම ඒ පිළිබඳව දන්නවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙනුත් ගොවිජන සේවා අමාත්‍යාංශයෙනුත් ඒ වැව් අමුණු සෑදීම සඳහා අවශ්‍ය මුදල් ලබා දීලා ඒවා කෙරී ගෙන යනවා. ඒ පිළිබඳව විස්තර අවශ්‍ය නම් ඔබතුමා ඒවා පිළිබඳව වෙනම ප්‍රශ්නයක් අහන්න. මගේ අමාත්‍යාංශයේ විෂය පථයට වැටෙන කාරණා ටික තමයි මම මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගොවිජන සේවා අමාත්‍යාංශයෙන් ඇහුවොත් නම් ඒ ප්‍රශ්නයට උත්තරය ලැබෙයි. ඊළඟට ප්‍රශ්න අංක 8.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. තව අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවන අතුරු ප්‍රශ්නයක් නැහැ නේ. දැන් ඔක්කොම-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෑහීමකට පත් වෙන්න ඕනෑ ඔබතුමාද? ප්‍රශ්නය අහපු මමද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම සෑහීමකට පත් වෙනවා නම් මට ඉඩ දෙන්නත් පුළුවන්; නොදෙන්නත් පුළුවන්. ඒකත් මතක තියා ගන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න මට අයිතියක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට අයිතියක් තිබෙනවා වාගේම මටත් අයිතියක් තිබෙනවා, අතුරු ප්‍රශ්නය අදාළ නැත්නම් ඒ අතුරු ප්‍රශ්නය

අහන්නට ඉඩ නොදී ඉන්නට. දැන් අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑද? [බාධා කිරීමක්] මීළඟට ප්‍රශ්න අංක 08, ගරු බුද්ධික පතිරණ මහතා.

## රිජ්වේ ආර්යා ළමා රෝහල: භෞතික සම්පත්
## றிஜ்வே சீமாட்டி சிறுவர் வைத்தியசாலை: பௌதிக வளங்கள்
## LADY RIDGEWAY CHILDREN'S HOSPITAL: PHYSICAL RESOURCES

1107/'11

**8. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ ශල්‍යාගාර, ශල්‍ය උපකරණ සහ වෙනත් භෞතික සම්පත්වල විශාල හිඟයක් පවතින බවත්;

(ii) භෞතික සම්පත්වල හිඟය හේතුවෙන් වෛද්‍යවරුන්ට නිකරුණේ කාලය ගත කිරීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තත්ත්වය මග හරවා ළමා සෞඛ්‍ය රැක ගැනීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් කඩිනමින් ලබා ගැනීමට සැලසුම් කර තිබේද;

(ii) මෙම තත්ත්වයට පිළියම් වශයෙන් එම රෝහල තුළ නව ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එම ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කිරීමට නියමිත කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு றிஜ்வே சீமாட்டி சிறுவர் வைத்திய சாலையின் சத்திரசிகிச்சை கூடங்கள், சத்திர சிகிச்சை உபகரணங்கள் மற்றும் பிற பௌதிக வளங்களின் பாரிய தட்டுப்பாடு நிலவுகின்றதா என்பதையும்;

(ii) பௌதிக வளங்களின் தட்டுப்பாடு காரணமாக வைத்தியர்கள் வெறுமனே காலத்தைக் கழிக்க வேண்டி ஏற்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) இந்நிலைமையைத் தவிர்த்து சிறுவர் சுகாதாரத்தைப் பாதுகாக்க அவசியமான பௌதிக வளங்களைத் துரிதமாகப் பெற்றுக்கொள்ள திட்டமிடப் பட்டுள்ளதா என்பதையும்;

(ii) இந்நிலைமைக்குத் தீர்வாக அந்த வைத்திய சாலையில் புதிய கட்டிடங்களை நிர்மாணிக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அவசியமான நிதியேற்பாடுகள் செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) மேற்படி கட்டிட நிர்மாணிப்பினை மேற்கொள்வ தற்கு உரிய காலவரையறை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that-

(i) there is a severe shortage of operation theatres, surgical equipments and other physical resources at the Lady Ridgeway Children's Hospital in Colombo; and

(ii) the doctors have to remain idle as a result of the shortage of physical resources?

(b) Will he inform this House-

(i) whether plans have been made to obtain the required physical resources speedily in order to remedy this situation, and protect children's health;

(ii) whether steps will be taken to construct new buildings within that hospital as a remedy for this situation;

(iii) if so, whether the necessary financial allocations have been made; and

(iv) of the timeframe within which those buildings are scheduled to be constructed?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) භෞතික සම්පත්වල සහ ශල්‍යාගාරවල හිඟයක් නොමැත.

(ii) මාසිකව සිදු කරන ශල්‍යකර්ම සංඛ්‍යාව සලකා බැලීමේදී නිලධාරින් එලෙස නිකරුණේ කාලය ගත කිරීමක් සිදු නොවේ.

(ආ) (i) රෝහල මඟින් සපයන සේවාව තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් නව ශල්‍යාගාර සංකීර්ණයක් ඉදිකිරීමට හා අනෙකුත් භෞතික සම්පත් සැපයීමට සැලසුම් සකස් කර ඇත.

(ii) සේවාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් නව ශල්‍යාගාර සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

(iii) සැලසුම් කළ කටයුතු සඳහා 2012 වර්ෂයට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කෙරෙනු ඇත.

(iv) සැලසුම් කළ ඉදිකිරීම් කටයුතු වර්ෂ 2013 දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, මෙම රෝහල මුළු දිවයිනටම ප්‍රතිකාර කරන රෝහලක්. විශේෂයෙන්ම මුළු දිවයිනේම දරුවන් මෙම රෝහල සඳහා යොමු කරනවා. විශේෂයෙන්ම තෘතීයික සත්කාර සේවාව, වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය සේවාවන් සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කටයුතු මෙම රෝහල තුළින් ඉටු කරනවා. ඒ වාගේම මේ රෝහල ශල්‍ය වාට්ටු හතරක් සහ ශල්‍යාගාර හතරකින් සමන්විතයි. විශේෂයෙන්ම මේ ශල්‍යාගාරවල පසු ගිය මාසය ඇතුළත -පසු ගිය ජූලි මාසය ගත්තාම- සැත්කම් 1440ක් කරලා තිබෙනවා. මේ සැත්කම්වලින් ප්‍රධාන සැත්කම් 176ක්,

[ගරු ලලිත් දිසානායක මහතා]

මධ්‍යම ප්‍රමාණයේ සැත්කම් 411ක් සහ සාමාන්‍ය සැත්කම් 853ක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම හෘද සැත්කම් 110ක් කරලා තිබෙනවා. ඒ වාගේම හදිසි ප්‍රතිකාර සැත්කම් සිදු කරලා තිබෙනවා. ඒ අනුව මෙම රෝහල තුළින් ඉතා විශාල සේවාවක් සිදු කරලා තිබෙනවා.

ප්‍රශ්නයේ සඳහන් කරලා තිබෙනවා,"භෞතික සම්පත්වල හිඟය හේතුවෙන් වෛද්‍යවරුන්ට නිකරුණේ කාලය ගත කිරීමට සිදු වී ඇති බවත්" කියලා. එහෙම නිකරුණේ කාලය ගත කිරීමක් කිසිම ආකාරයකින් සිදු වෙලා නැහැ. මේ එක මාසයක් තුළ කරන ලද සැත්කම් ප්‍රමාණය සහ ශල්‍යාගාරවල කටයුතුයි සඳහන් කර තිබෙන්නේ. ඒ වාගේම මෙම රෝහල මඟින් අක්ෂි ශල්‍යකර්ම කිරීම සඳහා නව ශල්‍යාගාරයක් ඉදි කරලා ඒ කටයුතු හෙට අනිද්දා වනකොට ඉතාම ඉක්මනින් පටන් ගන්නවා. ඒ වාගේම විශේෂයෙන්ම දැනට හදිසි අනතුරු අංශයේ කුඩා ශල්‍යාගාරයේ පහසුකම් පුළුල් කිරීමේ කටයුතුත් කර තිබෙනවා. ඒ අනුව එම ශල්‍යාගාරයට C-arm කියන උපකරණ ඇතුළු උපකරණ මිල දී ගැනීමට ගරු අමාත්‍යතුමා මේ වන විටත් මුදල් ප්‍රතිපාදන ලබා දීලා ඒ කටයුතු කරගෙන යනවා.

කාලයත් සමඟ ඇති වන අවශ්‍යතාවන් තේරුම් ගෙන අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහනේ 2020 දක්වා සෞඛ්‍ය සේවාවන් පුළුල් කිරීමේ ප්‍රතිපත්තිය යටතේ ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත විශේෂයෙන්ම රිජ්වේ ආර්යා ළමා රෝහලේ නව හෘද රෝග සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු කර තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය මිලියන 221ක් වෙනවා. ගරු අමාත්‍යතුමාගේ ඉල්ලීම අනුව මේ සඳහා 2012 අය වැයෙන් මිලියන 100ක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මෙම නව ශල්‍යාගාර සංකීර්ණය මඟින් හෘද රෝග සැත්කම් සඳහා වූ පහසුකම්වලට අමතරව පොදු ශල්‍යකර්ම සඳහා ශල්‍යාගාර දෙකක් ඉදි වෙනවා. ඒ තුළින් ඉතා පුළුල් වූ සේවාවක් සපයන්න බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන ප්‍රශ්නයක් තමයි මේ කටයුතු ඉවර කරන්නේ කවදාද කියන එක. 2013 වෙන කොට ඒ නව ශල්‍යාගාර සංකීර්ණයේ කටයුතුත් අවසන් කරනවා. ඔබතුමා රූපවාහිනිය බැලුවා නම් දකින්න ඇති. ඊයේත් අපේ වෛද්‍යවරු ඉතා දීර්ඝ කාලයක සැත්කමක් -මා හිතන්නේ පැය පහකට වැඩි කාලයක්- කළා. ඉතින් එවැනි විශාල වූ සේවාවක් මේ රෝහල තුළින් සිදු කෙරෙනවා. මා හිතන්නේ වෛද්‍යවරු මේ රෝහලේ නිකම් ඉන්නවාය කියලා ඔබතුමාට වැරදි මතයක් දීලා තිබෙනවා. සම්පත්වල හිඟයක් නිසා වෛද්‍යවරුන් නිකරුණේ කාලය ගත කරනවාය කියලා ඔබතුමාට වැරදි මතයක් දීලා තිබෙනවා. මේ රෝහලේ වෛද්‍යවරුන් එහෙම නිකරුණේ කාලය ගත කිරීමක් සිද්ධ කරන්නේ නැහැ.

අද රිජ්වේ ආර්යා ළමා රෝහල ඉතා විශිෂ්ට වූ සේවාවක් සපයනවා කියන එක මම කියන්න ඕනෑ. රිජ්වේ ආර්යා ළමා රෝහල කියන්නේ නිදහස් සෞඛ්‍ය සේවාවේ ළමා රෝග පිළිබඳව තිබෙන අපේ හදවත වාගේ තැනක්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දුන්න කාරණා සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න මට ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අහන්න පුළුවන්කමක් තිබෙනවාද? නැත්නම් එතුමාගෙන්මද අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමා අහන්න. සෞඛ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න නිසා උත්තර දෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, 2010 දෙසැම්බර් මාසයේ 31වැනි දා පුවත් පත් වාර්තාවක් පළ වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමාව මුණ ගැහුණු වෛද්‍යවරුන් පිරිසක් සඳහන් කළ කාරණා සම්බන්ධයෙන්. ඒ කාරණා ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මතක ඇති, දෙසැම්බර් 29වැනි දා එතුමා බලන්න ගියාම සෝපානයක් හිර වුණා. මේ රිජ්වේ ආර්යා ළමා රෝහලේ ඒ සෝපානයේ පවා ගැටලු තිබුණා.

මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ඒ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මේ වෛද්‍යවරු සඳහන් කළා, තමන්ට තමන්ගේ සේවා කාලය තුළ රැඳෙන්න තැනක්වත් නැහැය කියලා. ගරු ඇමතිතුමා මේ වාර්තාව අනුව කියලා තිබෙනවා, ඒ අයට එවැනි පහසුකමක් සලසනවා කියලා. දැනට එවැනි පහසුකමක් සලසලා තිබෙනවාද?

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ රිජ්වේ ආර්යා ළමා රෝහල අතිවිශාල සේවාවක් ඉෂ්ට කරන දිවයිනේ තිබෙන ප්‍රධානම ළමා රෝහලයි. මම අවස්ථා කීපයකදීම එහි ගියාම එහි තිබෙන යම් යම් කරුණු, අඩු පාඩු මම සඳහන් කරලා තිබෙනවා. රිජ්වේ ආර්යා ළමා රෝහල අවුරුදු පහක සංවර්ධන සැලැස්මකට දැනට සංවර්ධනය කරගෙන යන රෝහලක්. ඒ නිසා තිබෙන අඩු පාඩු පියවරින් පියවර සකස් වේවි. සමහර වෙලාවට ඔබතුමාට ඒ තොරතුරු දෙන අයට මම කියන්නේ ඔබතුමා එක්කම ඇවිල්ලා හරි, අමාත්‍යාංශයට ඇවිල්ලා මාත් එක්ක හරි කථා කරන්න කියලා. එහෙම ප්‍රශ්නයක් -ගැටලුවක්- තිබෙනවා නම් මම විසඳලා දෙන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ මේ ගැන සඳහන් කළා. නමුත් මේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා සතියකට කළ හැකි වන්නේ ශල්‍යකර්ම කීපයක් පමණයි, මේ ශල්‍යාගාරවල තිබෙන ගැටලු සහගත තත්ත්වය නිසා අනික් දිනවල ශල්‍යකර්ම කරන්න විධියක් නැහැ, වෛද්‍යවරුන්ට බොහෝ දුරට නිකරුණේ කාලය ගත කරන්න වෙලා තිබෙනවාය කියලා. ඒ නිසා මේ කාරණය පිළිබඳව පිළිතුරක් ලබා දීමෙන් විතරක් සෑහීමකට පත් වන්නේ නැතුව කරුණාකරලා ඒ ගැන හොයා, බලා මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියලා ඉතා ගෞරවයෙන් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, මෙම රෝහලේ පසු ගිය මාසය තුළ සැත්කම් විශාල ප්‍රමාණයක් සිදු කළා. ඒ වෛද්‍යවරු නිකම් ඉන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාට කවුරු හරි වැරදි අදහස් දෙනවා ඇත්තේ. මොකද, මේ රිජ්වේ ආර්යා ළමා රෝහල කියන්නේ ඉතා විශිෂ්ට සේවාවක් සපයන රෝහලක්. ඉතින් මේවා වහලා තියන්න බැහැ. ඔබතුමා කියන විධියට එක තත්පරයක් හරි මේවා වහලා

තිබුණා නම් ඒ ගැන මාධ්‍ය තුළින් ඉතා විශාල ප්‍රචාරයක් කෙරෙනවා. කිසිම ශල්‍යාගාරයක් වහලා නැහැ. කිසිම වෛද්‍යවරයෙක් නිකම් ඉන්නේ නැහැ. ඒ වෛද්‍යවරු ඉතාම විශිෂ්ට ලෙස ඒ කාර්යය ඉටු කරනවා. හොඳම උදාහරණය ඊයේ සිදු කළ සැත්කමයි. ඒ සැත්කම පැය පහකට වැඩි කාලයක් කළේ ඒ අපේ වෛද්‍යවරු. ඉතා විශිෂ්ට වූ සේවාවක් අපේ වෛද්‍යවරු ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලය ඉටු කරනවා. මම හිතන හැටියට ඒ කටයුතු සැහැල්ලුවට ලක් කරන්න තමයි ඔබතුමාට වැරදි තොරතුරු දීලා තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කුමන ආකාරයෙන් සඳහන් කළත් මේ රිජ්වේ ආර්යා ළමා රෝහලට තිබෙන බරපතළම ගැටලුවක් විධියට දක්වලා තිබෙනවා, -දැන් ඇමතිතුමා සඳහන් කළා පස් අවුරුදු සැලැස්මක් පිළිබඳව- දිගු කාලීන සැලැස්ම සඳහා ප්‍රතිපාදන ඒ සමස්ත කාලය සඳහා ලබා ගැනීමට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන කාරණය. ඒ ගැන වෛද්‍යවරුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේ අවුරුද්ද, දෙක සඳහා ප්‍රතිපාදන තිබෙනවා. නමුත් ඉදිරි වර්ෂ සඳහා

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇති, ඇති. ප්‍රශ්නය පැහැදිලියි ගරු මන්ත්‍රීතුමා. සැලැස්මක් තිබෙනවාද කියලානේ අහන්නේ. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
ඒ සඳහා වාර්ෂිකව මුදල් ලැබෙනවා. ඔබතුමාට වැරදි තොරතුරු දෙන කවුරු හරි ඉන්නවා නම් මාව හම්බ වෙන්න කියන්න. ඕවා සම්පූර්ණ අසත්‍ය තොරතුරු.

## ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදන වර්ධනය: වැඩසටහන
## வருடாந்த மீன் உற்பத்தியை அதிகரித்தல்: நிகழ்ச்சித்திட்டங்கள்
## INCREASE OF ANNUAL FISH PRODUCTION: PROGRAMMES

1603/'11

**10.ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන වාර්ෂික දළ මත්ස්‍ය නිෂ්පාදිතය කොපමණද;

(ii) එය වර්ධනය කිරීම සඳහා මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் தற்போதைய வருடாந்த மொத்த மீன் உற்பத்தி யாதென்பதையும்;

(ii) அதனை அதிகரிப்பதற்காக இவ்வாண்டினுள் செயற்படுத்தியுள்ள மற்றும் செயற்படுத்துவதற்கு உத்தேசித்துள்ள நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House of-

(i) the current gross annual fish production of Sri Lanka; and

(ii) the programmes which have been implemented and programmes that are expected to be implemented in this year to increase the gross annual fish production?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2010 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 384,670කි.

| | මෙට්‍රික්ටොන් |
|---|---|
| මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය | 332,260 |
| ජලජීවී වගාව මිරිදිය | 52,410 |
| එකතුව | 384,670 |

| 2011 ජනවාරි සිට ජූනි දක්වා | මෙට්‍රික්ටොන් |
|---|---|
| ගැඹුරු මුහුද හා අක්වෙරළ | 72,270 |
| වෙරළාසන්න | 110,180 |
| මිරිදිය | 20,780 |
| එකතුව | 203,230 |

ප්‍රශ්නයේ (අ) (ii) කොටස සඳහා දීර්ඝ උත්තරයක් තිබෙන්නේ ගරු කථානායකතුමනි. මේක කියවන්න ගියොත් සෑහෙන වේලාවක් යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙනම් සභාගත කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පිළිතුරේ ඉතිරි කොටස මා **සභාගත*** කරනවා.

- වයඹ පළාතේ දැනට ක්‍රියාත්මක ඉස්සන් වගාව මනා අධීක්ෂණයක් යටතේ වගා කාල සටහනකට අනුව ක්‍රියාත්මක කිරීමෙන් ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීම හා විදේශ විනිමය ඉපයීම.

- මත්ස්‍ය බීජ නිෂ්පාදනය(ඇඟිල්ලන්) සඳහා පෞද්ගලික ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඒකක පිහිටුවීම තුළින් රටේ මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම (ජාතික මත්ස්‍ය බීජ නිෂ්පාදනයට 58% කින් දායක වීම.)

- උතුරු නැඟෙනහිර පළාත් වල මිරිදිය ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම තුළින් 2010 වර්ෂයේ දී ඇඟිල්ලන් ලක්ෂ 35 ක් තැන්පත් කර ඇත.

- මිරිදිය ජලාශවල මසුන් ඇල්ලීම සඳහා මිරිදිය ධීවර යාත්‍රා 1,085 ක් හා දැල් කට්ටල 3,500 ක් ලබාදීම.

- මිරිදිය ධීවර කාර්මිකයින්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 2 කට අධික මුදලක් වැය කිරීම

- මිරිදිය ධීවර කාර්මිකයන් 38,000 ක් පමණ එම කර්මාන්තයේ නියැළීමෙන් රැකියා අවස්ථා පුළුල්වීම.

- ආසියානු පැසිපික් කළාපීය රටවල් 17 ක ධීවර අමාත්‍ය වරුන්ගේ සහභාගිත්වයෙන් 2011.07.28-29 දෙදින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ දී ''ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ ආර්ථික සංවර්ධනය සඳහා ජලජීවී වගාව'' පිළිබඳ සමුළුව පවත්වන ලදී.

- අප රටේ ජලජීවී වගාව සංවර්ධනයට අවශ්‍ය තාක්ෂණික සහයෝගිතාව සඳහා බංග්ලාදේශය, වියට්නාමය සහ ඉන්දුනීසියාව සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත. මේ නිසා ජලජීවී වගාව පිළිබඳව නව තාක්ෂණය ලබාගැනීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කර ගැනීමට නියමිය.

**05. ධීවර කර්මාන්තයට දේශීය හා විදේශීය ආයෝජන ලබාගැනීම.**

දේශීය සහ විදේශීය අයෝජකයන් සමඟ හවුල් ව්‍යවසාය ගිවිසුම්වලට එළඹීමට හැකි පරිදි ලංකා ධීවර සංස්ථාව ක්‍රියාත්මක වන 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ දෙවන වගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවේ පළමුවන උප ලේඛනයේ පස් වැනි කොටස සංශෝධනය කර ඇත.

මේ අනුව අල් ෆයිසාලියා සමූහයේ සහෝදර සමාගමක් වන ``එක්සැබ්`` ආයෝජන සමාගම සමඟ ලංකා ධීවර සංස්ථාව බද්ධ ව්‍යාපාර ආරම්භ කරනු ඇත. ඉදිරි වසර හතර සඳහා මුළු ප්‍රාග්ධන ආයෝජනය ඇ.ඩොලර් මිලියන 300 කි.

**යෝජිත ක්‍රියාකාරකම්-**

ගැඹුරු මුහුදේ මසුන් මැරීම සඳහා නවීන පහසුකම් සහිත යාත්‍රා ලබාදීම

මත්ස්‍ය පිරිසැකසුම් යන්ත්‍රාගාර

ධීවර නිෂ්පාදන අළෙවි ජාලය ශක්තිමත් කිරීම.

ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය නංවාලන විවිධ ව්‍යාපෘති ආදිය

(ආ) අදාළ නොවේ.

එහි මා පෙන්වා දී තිබෙනවා,

01. උතුරු පළාතේ ධීවර කර්මාන්තයට ප්‍රමුඛත්වය ලබා දෙමින් වෙරළාසන්න ධීවර කර්මාන්තය සංවර්ධනය කරන අයුරු.

02. අක්වෙරළ සහ ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය සඳහා ගත්තා වූ තීන්දු.

03. මත්ස්‍ය සම්පතට හානි කරන පන්න ක්‍රම තහනම් කිරීම සහ වෙරළාසන්න මත්ස්‍ය සම්පත කළමනාකරණය කරන අයුරු.

04. මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගා සංවර්ධනය සඳහා ගත්තා වූ ක්‍රියාමාර්ග.

05. ධීවර කර්මාන්තයට දේශීය හා විදේශීය ආයෝජන ලබා ගැනීම පිළිබඳව.

ඒ යෝජිත ක්‍රියාකාරකම් ඔක්කොම ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු ඇමතිතුමාට ඉතා ස්තුතිවන්ත වෙනවා, මත්ස්‍ය සම්පත වැඩි දියුණු කිරීම සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග ගැන. මෙට්‍රික් ටොන් 384,670ක් මත්ස්‍ය නිෂ්පාදනය කර තිබෙනවා. මගේ පළමු අතුරු ප්‍රශ්නය මේකයි. මේවා ලංකාවේ හැම පළාතකටම බෙදා හරිනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔව්. විශේෂයෙන්ම නුවරඑළිය, මාතලේ, නුවර, අනුරාධපුරය, පොළොන්නරුව යන මේ පළාත්වල තිබෙන්නේ මිරිදිය මාළු. අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තොත් මත්ස්‍ය පරිභෝජනයෙන් සියයට 89ක් මිරිදිය මාළු.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

දෙවෙනි අතුරු ප්‍රශ්නය. උතුරේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ධීවර වරායවල්, තොටුපළවල් කීයක් හැදෙනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ධීවර වරායන් දෙකක් හදන්නට, ගුරුනගර් සහ සිලාවතුර යන ධීවර වරාය හදන්නට ඔලුවිල් ධීවර වරාය හදපු සමාගමට අපි භාර දීලා තිබෙනවා. ඒ ගොල්ලෝ ශක්‍යතා වාර්තාව අවසන් කරලා තිබෙනවා. පේදුරුතුඩුව ධීවර වරාය හදන්නට ජපන් රජය ආධාර ලබා දෙන්නට තීන්දු කරලා තිබෙනවා. ඒ වාගේම මයිලඩි ධීවර වරාය හදන්නට කොරියානු රජය භාර අරගෙන තිබෙනවා. ඉතිරි වරාය එකොළහම නෝර්වේ රාජ්‍යය භාර අරගෙන තිබෙනවා. ඒ සඳහා ඔවුන්ගේ ශක්‍යතා වාර්තාව සම්පූර්ණ කර ගැනීම සඳහා ඩොලර් මිලියනයකුත්, ඒ වරාය 11 සෑදීම සඳහා ඩොලර් මිලියන 100කුත් දෙන්නට සාකච්ඡා කරලා තිබෙනවා. එතකොට ඒ සියලුම වරායවල් සම්පූර්ණයි. ලංකාවේ නැංගුරම් තොටුපොළවල් සහ ධීවර තොටුපොළවල් දියුණු රටක ඇති නැංගුරම් තොටුපොළවල් සහ ධීවර තොටුපොළවල් මෙන් වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ යටතේ අවශ්‍ය පහසුකම් ලබා දීලා 2013 වෙනකොට ඒ කටයුතු අවසන් කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තුන්වන අතුරු ප්‍රශ්නය. ඔබතුමාගේ පිළිතුර අනුව, නැඟෙනහිර ප්‍රදේශයේ ඔලුවිල්වල ඉතාම වැදගත් ධීවර වරායක් හැදෙනවා. කවදාද ඒක සම්පූර්ණ කරන්නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔලුවිල් ධීවර වරායේ එක පැත්තක් වාණිජ වරාය. අනෙක් පැත්ත ධීවර වරාය. දැනට ධීවර වරායේ කටයුතු සම්පූර්ණයි. මේ අවුරුද්ද අවසාන වන්න ඉස්සර ශීතාගාර පහසුකම් ලබා දෙන්න තමයි ලෑස්ති කර තිබෙන්නේ. මේ අවුරුද්ද ඉවර වන්න ඉස්සර අපි ඔලුවිල් වරාය විවෘත කරනවා. ඒ වාගේම අපි පසු ගිය දවස්වල නැඟෙනහිර වාලච්චේනේ ධීවර වරාය විවෘත කළා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අතුරු ප්‍රශ්න තුනටම හරියාකාරව පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

## හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය : විස්තර
## ஹம்பாந்தோட்டை மஹிந்த ராஜபக்ஷ துறைமுகம் : விபரம்
## HAMBANTOTA MAHINDA RAJAPAKSA PORT: DETAILS

1062/'11

11.**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට - (1):

(අ) (i) හම්බන්තොට, මහින්ද රාජපක්ෂ වරායේ ඉදිකිරීම් නිම කළ දිනය සහ එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කළ දිනය කවරේද;

(ii) හම්බන්තොට වරාය විවෘත කළ දින සිට එම වරායට සේන්දු වූ නැව්, බෝට්ටු සහ යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) වරායේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) මසකට වැටුප් සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හම්බන්තොට වරායේ අද දිනට ශේෂ පත්‍රය කවරේද යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹம்பாந்தோட்டையிலுள்ள மஹிந்த ராஜபக்ஷ துறைமுகத்தின் நிர்மாணப் பணிகள் எப்போது பூர்த்தி செய்யப்பட்டன என்பதையும் அதன் வர்த்தக நடவடிக்கைகள் எப்போது ஆரம்பிக்கப்பட்டன என்பதையும்;

(ii) ஹம்பாந்தோட்டைத் துறைமுகம் திறக்கப்பட்ட தினத்திலிருந்து அதில் தரித்துள்ள கப்பல்கள், படகுகள் மற்றும் கலங்கள் ஆகியவற்றின் எண்ணிக்கையினையும்;

(iii) அத்துறைமுகத்தில் பணியாற்றும் ஊழியர்களின் எண்ணிக்கையினையும்;

(iv) மாதாந்தச் சம்பளத்திற்காக ஒதுக்கப்படும் தொகையினையும்

அவர் குறிப்பிடுவாரா?

( ஆ) ஹம்பாந்தோட்டைத் துறைமுகத்தின் இன்றுள்ளவாறான ஐந்தொகையினை அவர் இச்சபைக்கு அறியத் தருவாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state-

(i) as to when the construction of Hambantota Mahinda Rajapaksa Port was completed and its commercial operations were started;

(ii) the number of ships, boats and vessels that have docked at Hambantota Port from the date it was opened;

(iii) the number of staff working in the port; and

(iv) the salary contribution per month?

(b) Will he inform this House of the balance sheet of the Hambantota Port as to date?

(c) If not why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුරු දෙනවා.

(අ) (i) 2010.11.18 දින වන විට මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි පළමු අදියර වැඩ නිමවූ අතර, එදින සිට ක්‍රියාත්මක වන පරිදි වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

(ii) යාත්‍රා 08කි. (මින් යාත්‍රා 03ක් පුහුණු ගමන් වාර සඳහා යොදවා ඇත.)

1. යාත්‍රාව Asian Express, පැමිණි දිනය 2011 ජුනි මස 01 වන දින, මාලදිවයිනෙන්.
2. යාත්‍රාව Logos Hope, පැමිණි දිනය 2011 ජුලි මස 18 වන දින, ගාල්ලෙන්.
3. යාත්‍රාව Wan Hai 502, පැමිණි දිනය 2011 අප්‍රේල් මස 28 වන දින, සිංගප්පූරුවෙන්.
4. ඕඑල් ඩුබායි, පැමිණි දිනය මැයි මස 01.
5. Sky Apollo, පැමිණි දිනය මැයි මස 30 වන දින, ඉන්දියාවෙන්.
6. යාත්‍රාව සේරුවිල, පැමිණි දිනය නොවැම්බර් මස 18, වන දින, බුරුමයෙන්.

(iii) හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු සඳහා සේවක මණ්ඩලයක් දැනට අනුයුක්ත කර නොමැති අතර අවශ්‍ය අවස්ථාවලදී හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු සඳහා කොළඹ සහ ගාල්ල වරායවලින් සේවක මණ්ඩල යොදවනු ලැබේ.

(iv) අදාළ නොවේ.

(ආ) හම්බන්තොට වරාය සඳහා මේ දක්වා වෙනම ශේෂ පත්‍රයක් පවත්වා ගෙන යනු නොලැබේ.

(ඇ) හම්බන්තොට වරායට අදාළ ගිණුම් අංශයක් ක්‍රියාත්මක වන තුරු කොළඹ වරාය යටතේ අදාළ විස්තර ගිණුම්ගත කරනු ලැබේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, ඒ තොරතුරු ලබා දීම පිළිබඳව ස්තුතියි.

නැව් හෝ බෝට්ටු හෝ මේ අවුරුද්දට අටක් ඇවිත් තිබෙනවා කිව්වා. ඒ නැව්වල containers නැත්නම් break bulk cargo කොතරම් ප්‍රමාණයක් ගෙනාවාද කියන එක සම්බන්ධව දැනුවත් කරන්න පුළුවන්ද? එතැන ලොකු ගලක් තිබෙනවා කියලා

ඔබතුමන්ලා කලින් පිළිගත්තේ නැති වුණාට, දැන් පිළිගෙන තිබෙනවා ඒක ඉවත් කරන්න මිලියන 450ක් යනවා කියලා. එදා හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමායි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි ඒ ගැන විවාද කරනකොට ඒ කථාව හාස්‍යයට ලක් කරන්න හැදුවා. දැන් සභාපති කියනවා, US Dollars 450 million යනවා කියලා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
දැන් තමුන්නාන්සේට ඕනෑ, තමුන්නාන්සේ අහපු පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුරද, එහෙම නැත්නම් ඊට එහා ගිය විවාදයක්ද? ඒ දෙකෙන් කොයි එකද කියලා කියපුවාම මට එතුමාට උත්තරය දෙන්න පුළුවන් ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහපු ප්‍රශ්නයට තේරෙන විධියට උත්තර දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
නැහැ, නැහැ. තමුන්නාන්සේ දැන්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම බොහොම සෘජුව ඇහැව්වේ, නැව් කීයක් ඇවිල්ලා තිබෙනවාද-[බාධා කිරීමක්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
තමුන්නාන්සේට ඕනෑ, ඒ ගලද, මේ ප්‍රශ්නයට උත්තරද? කොයි එකද ඕනෑ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතැන ගලක් තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්නයට උත්තර දුන්නා නේ. ඊට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම කියන්නම්කෝ. ඉස්සෙල්ලාම මට අවශ්‍ය, නැව් සම්බන්ධයෙන්. ඇවිල්ලා තිබෙන නැව්වල බර, කන්ටේනර් ප්‍රමාණය, break bulk cargo ද නැද්ද කියන එකට උත්තර ලබා දෙන්නකෝ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, යාත්‍රා අටක් ආවා කියලා එතුමාගේ ප්‍රශ්නයට මම පිළිතුර දුන්න බව. එතුමා මෙතැනදීත් මතක් කළා, බෝට්ටු ගැන. මම මුලින්ම කියන්න ඕනෑ, බෝට්ටු එන්නේ ධීවර වරායවලට බව. වාණිජ වරායවලට එන්නේ නැව්. ඒකයි පළමුව දෙන පිළිතුර. ඒ ආපු ඒවායේත්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පළමුව ආපු නැව වාෂ්ප නැවක්. අපට නැව් ගැන කියන්න එන්න එපා. මොකක්ද මේ කියන්නේ? අසත්‍ය කියන්න එපා, පාර්ලිමේන්තුවට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මන්ත්‍රීතුමානේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් උත්තර අහන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා, උත්තරය දෙන කල් ඉවසා ගෙන ඉන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, කලබල නොවී උත්තරය දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
පක්ෂය ඇතුළේ ඉවසා ගෙන ඉන්නෙත් නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක වැඩක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හම්බන්තොට වරාය-

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඉතින් උත්තර දෙන කල් ඉන්නකෝ. පොඩ්ඩක් ඉවසා ගෙන ඉන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඊයේ සිරිකොතේදී- [බාධා කිරීමක්] ඊයේ දුන්නා බැටේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, Asian Express නැව, පැමිණි රට මාලදිවයින, මේ නැවේ වැලි ප්‍රවාහනය කිරීමයි ක්‍රියාත්මක වුණේ. [බාධා කිරීමක්] බලන්න ගරු කථානායකතුමනි, වැලි අපනයනය කිරීම අද අපේ රටට විදේශීය ආදායමක් ලබා දෙනවා. [බාධා කිරීම්] එතකොට ඒකත් විහිළුවකට ගන්නවා. මාලදිවයිනට අවශ්‍ය කරන වැලි අපේ රටෙන් මුදලට ගැනීම විහිළුවකට අරගෙන.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පස් ගෙනෙන්නේ කවදාද දන්නේ නැහැ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
දැන් පස් කන්න වෙලා තිබෙන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔව්, ඔව්. ඒ ගොල්ලන්ගේ කටේ පස්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
කටේ පස්, මේ දවස්වල. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, නිශ්ශබ්ද වෙලා ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මේ දැන් ගිහිල්ලා නායකතුමාගෙන් බැණුම් ඇහැව්වා. මේ දැන් මම බලා ගෙන හිටියා. මේ දැන් ආවා, පත්තර කැල්ලක් අරන්, එලෙව්වා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අහන ප්‍රශ්නයට කෙටියෙන් උත්තර දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මන්ත්‍රීතුමා පිලි පනිනවානේ. පිලි පනින්නේ නැතුව ඉන්නකෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නියෝජ්‍ය ඇමතිතුමා කෙටියෙන් උත්තර දෙන්න. අනෙක් මන්ත්‍රීවරුන් නිශ්ශබ්ද වන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, සේරුවිල යාත්‍රාව පළමුවන දවසේ පැමිණෙන කොට මේ රටට බුදු පිළිම රැගෙන පැමිණියා. ඉතිරි යාත්‍රා තුන නාවුක පුහුණුවීම් සඳහා පැමිණියා. මේක තමයි දැනට තිබෙන තත්ත්වය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැව් දෙකක් ගැන කිව්වා. අනෙක් නැව් හයේ මොනවාද ගෙනාවේ? හුළං‍ද? එකක බුදු පිළිමයක් ගෙනාවා කියනවා, එකක වැලි ගෙනාවා කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි හෝ වැරදි ඒ උත්තරය පිළිගන්න. තමුන්නාන්සේ ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ආසනයේ නේ මේ වරාය තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ ආසනයේ වුණාට කමක් නැහැ, ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න. විහිළු කරන්න යනකොට නේ ඔක්කොම කැ ගහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා පිළිගන්නවාද ඒ ඇත්ත කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විහිළු නොකර ප්‍රශ්න අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ වරායට අවුරුද්දටම නැව් හයයි ඇවිල්ලා තිබෙන්නේ. [බාධා කිරීම්] මේක විහිළුවක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න තිබෙන ප්‍රශ්නය පැහැදිලිව, ඍජුව අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම බොහොම පැහැදිලිව අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔන්න පැහැදිලිව අහනවා. අහගෙන ඉන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවුරුද්දකට රුපියල් මිලියන 5,000ක් පොලී විතරක් ගෙවන්න සිදු වෙලා තිබෙන මේ හම්බන්තොට වරායට නැව් හයක් පමණක් ඇවිල්ලා ඒ සිදු වන අපරාධයට ගෙවන්න තිබෙන්නේ කොළඹ වරායෙන් නේද, දැන් ඔබතුමා දුන් උත්තරය අනුව?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, මෙතුමාට බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, හම්බන්තොට වරායට ගත් ණය ගෙවීමේ හැකියාවක් අපට තිබෙනවා කියලා. ඒ ගැන කිසිම ගැටලුවක් අපට නැහැ, ගරු කථානායකතුමනි. ඒක වග කීමකින් තමයි මම කියන්නේ. ඉතින් එතුමාට පැහැදිලිව ඒක පිළිගන්න පුළුවන් වෙයි. මේ වන විට අපි වරායට වියදම් කළ මුදලට වැඩිය මුදලක් වන ඩොලර් මිලියන 600ක් වියදම් කරලා ආයෝජකයෝ තුන් දෙනෙක් වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා අපට කිසිම ගැටලුවක් නැහැ, ඒ වරායේ වැඩ රාජකාරි සියල්ලම හරියාකාරව ක්‍රියාත්මක වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Lloyd's Shipping Certificate එක සහ survey එක ඇත්තටම මේ වරායට ලැබී තිබෙනවාද, මෙතැන ගලක් නැහැ, ඒ නිසා කිසි හයක් නැතිව international නැව්වලට මෙතැනට එන්න පුළුවන් කියලා? එහෙම නම් Lloyd's Certificate of Insurance අංකය පාර්ලිමේන්තුවට දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු කථානායකතුමනි, මාධ්‍ය තුළින් හැම වෙලේම උත්සාහ කරනවා, මේ වරායට රක්ෂණයක් නැහැ කියලා කියන්න. එතුමා ඇතුලත්මුදලි මහත්මයා ළඟ හිටපු කෙනෙක් නිසා මම එතුමාගෙන් අහනවා, කොළඹ වරායේ රක්ෂණය කොහේද තිබෙන්නේ කියලා. වරායවල් සඳහා රක්ෂණයක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අසත්‍ය දේවල් කියන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
රක්ෂණය නැතිව පළමුවැනි අදියරේදී මේ වරායට අවශ්‍ය කරන සියලු ගුණාංග ගැන අපට අනුමැතිය ලැබී තිබෙනවා ගරු කථානායකතුමනි. කිසිම ගැටලුවක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Lloyd's Certificate of Insurance එකේ අංකය දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
තමුන්නාන්සේ වරාය හා මහාමාර්ග පිළිබඳ උපදේශක කාරක සභාවට එන්න. ඇතුලත්මුදලි මහතාගේ කාලයේ ඉඳලා ගිණුම් ටික ඔක්කොම දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-1104/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13-1108/'11-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් වරාය ප්‍රශ්නය ඉවරයි. දැන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් අසන ප්‍රශ්නය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා 2000 සිට 2011 දක්වා වසර 11ක දීර්ඝ විස්තරයක් අහලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි උත්තරයක් දෙන්න ඕනෑ නිසා අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස් කිරීමේ ව්‍යාපෘතිය: විස්තර
## இலத்திரனியல் கழிவுப்பொருள் சேகரிப்புக் கருத்திட்டம்: விபரம்
## E-WASTE COLLECTION PROJECT: DETAILS

1604/'11

**15.ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය රැස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙතෙක් රැස් කරන ලද ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එසේ රැස් කරන ලද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන්නේද;

(iii) එසේ නම්, රැස් කරන ලද ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය අතරින් දැනට ප්‍රතිචක්‍රීකරණය කරන ලද ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலத்திரனியல் கழிவுப்பொருட்களை சேகரிக்கும் கருத்திட்டத்தின் கீழ் இதுவரையில் சேகரிக்கப் பட்டுள்ள இலத்திரனியல் கழிவுப்பொருட்களின் அளவு யாதென்பதையும்;

(ii) அவ்வாறு சேகரிக்கப்பட்ட கழிவுப்பொருட்கள் மீள்சுழற்சிக்கு உட்படுத்தப்படுகின்றதா என்ப தையும்;

(iii) அவ்வாறாயின், சேகரிக்கப்பட்ட இலத்திரனியல் கழிவுப்பொருட்களில், தற்போது மீள்சுழற்சிக்கு உட்படுத்தப்பட்டுள்ள இலத்திரனியல் கழிவுப் பொருட்களின் அளவு யாதென்பதையும்

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he state-

(i) the amount of electronic waste that has been collected by now under the E-waste Collection Project ;

(ii) whether the waste collected under the aforesaid project is recycled; and

(iii) if so, the amount of electronic waste that has been recycled by now out of the electronic waste collected?

(b) If not, why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් භාණ්ඩ පරිහරණය වේගවත් වීමත් සමඟ විද්‍යුත් ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම වේගවත්ව සිදු වන අතර මෙම අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. රටවල් අතර අපද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව ශ්‍රී ලංකාව අත් සන් කර ඇති බාසල් සම්මුතිය මඟින් ද ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ක්‍රමානුකූලව කළමනාකරණය පිළිබඳ අවධානය යොමු කර ඇත.

ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2010 වසර තුළ වාර්තාගත දත්තයන්ට අනුව ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ටොන් 1,400ක් එක් රැස් කොට ඇති අතර, 2011 ජූලි මස අග දක්වා ටොන් 600ක් එක් රැස් කොට ඇත.

(ii) ශ්‍රී ලංකාව තුළ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා දැනට පහසුකම් නොමැති බැවින්, ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය එක් රැස් කිරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර (උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අංක 1534/18 දරන 2008.02.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය) හිමි ආයතන මඟින් එක් රැස් කර සියලු ජාත්‍යන්තර නීතීන්ට හා රෙගුලාසීන්ට අනුකූලව ඒ සඳහා සියලු අනුමැතීන් ලත් අපනයනකරුවන් මඟින් අපනයනය කරනු ලබයි. ඒ සඳහා දැනට හොංකොං, සිංගප්පූරුව, දකුණු කොරියාව, ජර්මනිය යන රටවල් සඳහා අනුමැතීන් ලැබී ඇත.

(iii) එක් රැස් කරන සියලු ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය මේ වන විට ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කොට ඇති අතර අදාළ අපනයනික ආයතන විසින් 2011 ජූලි වන තෙක් එකතු කරනු ලැබූ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය මේ වන විට අපනයනය කර ඇති බව වාර්තා කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම ගැන බලන්න. විශේෂයෙන්ම කොළඹ නගරය වැනි ප්‍රදේශවල ඒවා ටොන් මිලියනයක් පමණ තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අමාත්‍යාංශය මඟින් ගන්නා වූ ක්‍රියා මාර්ගය කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු කථානායකතුමනි, මේ වැඩ පිළිවෙළ මවිසින් ආරම්භ කළේ 2010 දී. අපි දැනට මේ සම්බන්ධයෙන් ලංකාවට ආනයනය කරන සියලු ආනයනකරුවන් සමඟ කථා කරලා තිබෙනවා. ඒ ආනයනකරුවන් අපට එකඟ වෙලා තිබෙනවා, ඒ සඳහා එකම

එම්බිල්ම්යක් පාවිච්චි කරන්න. ඒ අනුව ඒ ආනයනය කරන ද්‍රව්‍ය විකුණන ස්ථානවලම එම අපද්‍රව්‍ය එකතු කිරීමේ ව්‍යාපෘතියක් සම්බන්ධනේ දැන් අපි ඒ අය සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඉදිරියේදී අපට පුළුවන් ඒ ස්ථානත් නම් කරන්න. නමුත් මෙය අලුතින්ම ආරම්භ කරපු ව්‍යාපෘතියක් නිසා අපි සමහර කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් ඉන්නවා. අපද්‍රව්‍ය එකතු කරන්නන් සහ ඒවා විකුණනු ලබන අය අතර සම්බන්ධතාව අපි ඇති කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

කොළඹ, උතුරු කොළඹ, බිලුමැන්ඩල් සහ කොලොන්නාව වාගේ ප්‍රදේශවල මම හිතන හැටියට අවුරුදු 20ක පමණ කාලයක වාගේ ඉඳලා ලොකු කුණු කඳු දෙකක් තිබුණා. තමුන්නාන්සේ අපට දැනුම් දුන්නා, ඒ පිළිබඳව විදේශීය ක්‍රමවේදයන් යොදවලා කටයුතු කරනවාය කියලා. ඒ පිළිබඳව ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මේ ප්‍රශ්නය මගෙන් අහලා නැති වුණත් මම උත්තර දෙන්න ඕනෑ. විශේෂයෙන් කසළ අපහරණය පිළිබඳව ක්‍රමවේදයන් නිර්මාණය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය අපට අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ කැබිනට් අනුමැතිය අනුව අවශ්‍ය කටයුතු සිදු වෙනවා. කසළ අපහරණය පිළිබඳ නවීන ක්‍රමවේදයන් ගැන තමයි අපි අවධානය යොමු කරලා තියෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

දැන් අපනයනකරුවන්ගේ සංඛ්‍යාව වැඩි කරනවාද ?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඕනෑම කෙනකුට මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්. අපේ සම්මතයන් අනුව ඔවුන් එකතු කරලා අපනයනය කරන්න සූදානම් ඒ හැම කෙනකුටම බලපත්‍ර ලබා දීමට කිසිම ගැටලුවක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය. ප්‍රශ්න අංක 4.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: තැපැල් සේවා අමාත්‍යාංශය

### 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: தபால் சேவைகள் அமைச்சு

### MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF POSTAL SERVICES

1247/'11

**4. ගරු අර්ජුන රණතුංග මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Arjuna Ranatunga on behalf of the Hon. Sunil Handunetti)

තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් තැපැල් සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தபால் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011`தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக தபால் சேவைகள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Postal Services:

(a) Will he state the total amount of money spent by the Ministry of Postal Services on the "Deyata Kirula" exhibition in 2011?

[ගරු අර්ජුන රණතුංග මහතා]

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, තැපැල් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) <u>අමාත්‍යාංශයෙන් වියදම් කර ඇති මුදල් පිළිබඳ විස්තර</u>

| | | | |
|---|---|---|---|
| ප්‍රදර්ශන කුටිය සැකසීම සඳහා අත්තිකාරම් | | - රු. | 4,898,013.20 |
| නොපියවූ | - රු. 32,000.00 | | |
| පියවූ | - රු. 81,455.00 | - රු. | 113,455.00 |
| අතිකාල දීමනා | | - රු. | 101,996.49 |
| ගමන් වියදම් | | - රු. | 64,502.85 |
| වෙනත් වියදම් | | - රු. | 132,681.12 |
| මුළු වියදම | | - රු. | 5,310,648.66 |

(ආ) (i) <u>තැපැල් දෙපාර්තමේන්තුව වැය කළ මුදල් පිළිබඳ විස්තර</u>

| | | |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරී දීමනා | - රු. | 14,000.00 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ නිලධාරීන්ට, | | |
| ආහාර පාන වියදම් | - රු. | 16,995.00 |
| අතිකාල | - රු. | 157,467.85 |
| ගමන් වියදම් | - රු. | 68,757.00 |
| මුළු වියදම | - රු. | 257,219.85 |

(ii) තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කර්තව්‍යයන්

- මුද්දර කාර්යාංශයේ සේවාවන් හා මුද්දර ප්‍රදර්ශනය
- තැපැල් දෙපාර්තමේන්තුවේ සේවාවන්හී ප්‍රගතිය ප්‍රදර්ශනය වන ආකාරයේ දර්ශන තල නිර්මාණය කර තිබීම.

(iii) අදාළ නැත.

(ඇ) දැයට කිරුළ වැඩ සටහන සඳහා වියදම් දැරීම වෙනුවෙන් අය වැය දෙපාර්තමේන්තුව විසින් වෙනම වැය ශීර්ෂයක් වෙන් කර දී නොමැති අතර, භාණ්ඩාගාරයේ අය වැය අංශයේ උපදෙස් මත දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා ගෙවීම් කරීමේ දී 108-01-02-2001 ගොඩනැගිලි වැය ශීර්ෂ යටතේ වියදම් දරා ඇත. අතිකාල හා ගමන් වියදම් ගෙවීමේදී සාමාන්‍යයෙන් අතිකාල හා ගමන් වියදම් සඳහා ගෙවීම් කරන වැය ශීර්ෂය මඟින් ගෙවීම් කරන ලදී.

(ඈ) අදාළ නැත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 9 - 1248/'11 - (1) ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු අර්ජුන රණතුංග මහතා**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල : පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: பாராளுமன்ற அலுவல்கள் அமைச்சு
## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF PARLIAMENTARY AFFAIRS

1249/'11

14. **ගරු අර්ජුන රණතුංග මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
( மாண்புமிகு அர்ஜுன ரணதுங்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Arjuna Ranatunga on behalf of the Hon. Sunil Handunetti)

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

( அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக பாராளுமன்ற அலுவல்கள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக் களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள் ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்ப தையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களி னால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

( இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

( ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Parliamentary Affairs:

(a) Will he state the total amount of money spent by the Ministry of Parliamentary Affairs on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්, අමාත්‍යාංශය විසින් වැය කළ මුළු මුදල රු. 1,512,681.53 කි.

(ආ) (i) අමාත්‍යාංශය යටතේ වෙනත් ආයතන හෝ දෙපාර්තමේන්තු නැත.

(ii) වෙනත් ආයතන හෝ දෙපාර්තමේන්තු නොමැති බැවින් අදාළ නොවේ.

(iii) වෙනත් ආයතන හෝ දෙපාර්තමේන්තු නොමැති බැවින් අදාළ නොවේ.

(ඇ) පසු ගිය අය වැයෙන් දැයට කිරුළ වැඩසටහන සඳහා වෙනම වැය ශීර්ෂයකින් මුදල් වෙන් කර නැත.

(ඈ) පැන නොනඟී.

# නිවේදන
# அறிவிப்புக்கள்
# ANNOUNCEMENTS

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 3.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ශෝක ප්‍රකාශය: ගරු ලෙස්ලි ගුණවර්ධන මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு லெஸ்லி குணவர்தன
## VOTE OF CONDOLENCE : HON. LESLIE GOONEWARDENE

[අ. භා. 2.15]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙන්ම විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයකු වශයෙන්ද මෙම උත්තරීතර සභාව නියෝජනය කළ මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

1938 අගෝස්තු මස 17 වැනි දින වේයන්ගොඩදී රණවීර අප්පුහාමිලාගේ දොන් පීරිස් ගුණවර්ධන මහතාගේත්, විතානගේ ප්‍රේමවතී මහත්මියගේත් දයාබර පුතුරත්නයක් වශයෙන් රණවීර අප්පුහාමිලාගේ ලෙස්ලි හර්බට් ගුණවර්ධන මහතා මෙලොව එළිය දුටුවේය. තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ එතුමා, ඉන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ඉතිහාසය පිළිබඳ පළමු පෙළ ගෞරව උපාධියක් හිමි කර ගත්තේය. ඉතිහාස විෂයයට දැක්වූ දක්ෂතා මත මේබල් ජයසූරිය ත්‍යාගය සහ එෆ්.එච්.එම්. කෝබට් ත්‍යාගය පවා 1960 දී හිමි කර ගැනීමට එතුමාට හැකියාව ලැබිණි.

ප්‍රාචීන හා අප්‍රිකානු අධ්‍යයන ශාස්ත්‍රාලයේ පර්යේෂණයන්හි නිරතව "පළමුවන සේන සිට මාඝ ආක්‍රමණය තෙක් සංඝ සමාජයේ ඉතිහාසය" නමැති නිබන්ධනය රචනා කිරීම නිසා 1961 දී ලන්ඩන් සරසවියෙන් ඉතිහාසය විෂයය යටතේ ආචාර්ය උපාධියක් ද හිමි කර ගත්තේය. බෞද්ධ විහාරාරාම වෙත ප්‍රදානය කර තිබූ විශාල කෙත්වතු පිළිබඳ විද්‍යාර්ථීන් කිසිවෙකු එතෙක් අත

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

නොගසා තිබූ ක්ෂේත්‍රයක් අලළා ලියැවුණු මෙම නිබන්ධනය පසු කාලීනව සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන්ද ප්‍රකාශයට පත් විණි.

විරංජනී ගුණවර්ධන මහත්මිය සමඟින් යුග දිවිය ගත කළ ගුණවර්ධන මහතා, එම විවාහය තුළින් අසේල ගුණවර්ධන නමැති පුතනුවන් මෙලොවට දායාද කළේය. ඉංග්‍රීසි හා සිංහල යන දෙබසින්ම ලේඛන කටයුතුවල යෙදුණු ගුණවර්ධන මහතා, ශාස්ත්‍රීය ගවේෂණයන් ලොව හමුවේ තැබූ විශිෂ්ට ශාස්ත්‍රඥයෙක් විය. ඉතිහාස විෂයය සඳහා ප්‍රථම පන්ති ගෞරව සාමර්ථයක් ලැබීම නිසා පේරාදෙනිය විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයට බඳවා ගනු ලැබූ ගුණවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, ඉතිහාස අංශයේ අංශ ප්‍රධානී, ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන්ද කටයුතු කළ අතර, 1994 වසරේ සිට එම විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වශයෙන්ද සේවය කළේය.

1972 සිටම ඇමෙරිකාව, ප්‍රංශය, ජපානය ඇතුළු රටවල් ගණනාවක විශ්වවිද්‍යාලයන්හි සම්මාන මහාචාර්යවරයකු ලෙසින් පත් කරන ලද එතුමා එතෙක් කිසිදු ශ්‍රී ලාංකීය ඉතිහාසඥයෙකු නොකළ අන්දමේ අසහාය ප්‍රයත්නයක් දරමින් ඉතිහාසය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සහ වාරි තාක්ෂණය ඔස්සේ ශාස්ත්‍රීය පොත් ගණනාවක්ම රචනය කළේය. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ ශිෂ්‍යයකු වූ මෙම මහ ඇදුරුතුමා පරණවිතානයන්ගේ ශාස්ත්‍රීය නිබන්ධනයන්හි පැවති අඩු ලුහුඩුකම්ද මැනවින් පෙන්වා දීමෙහිලා සමත් විද්වතෙකු වූ අතර, එම නිබන්ධන විදේශීය විද්වතුන්ගේ මතවාද වෙනස් කිරීමෙහිලා බෙහෙවින් බලපෑවේය.

1998 වසරේදී ලන්ඩන් පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සභාපති ධුරයෙන් ද පිදුම් ලැබූ අතර, විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් අනතුරුව සිය පර්යේෂණයන්හි පූර්ණ කාලීනව නියැළුණේය. ඡායාරූපකරණය, කලාව, සංගීතය, චිත්‍රපට කලාව ආදී විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ඇඩි උනන්දුවකින් කටයුතු කළ ගුණවර්ධන විද්වතානන් එම කාල වකවානුව තුළදීද අනාගත පරපුර උදෙසා ග්‍රන්ථකරණයේ යෙදෙමින් අමිල සේවාවක නියැළුණේය. 1998 වසරේදී බ්‍රිටැනිකා විශ්ව කෝෂයේ සංස්කාරකවරයකු වශයෙන්ද පත් කරනු ලැබූ මහාචාර්ය ගුණවර්ධන ශූරීන්ගේ ශාස්ත්‍ර නිපුණතාව අගයමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් 2001 වසරේදී සම්මාන මහාචාර්ය පදවියකින්ද පුදනු ලැබිය.

හැටේ දශකයේදී දේශපාලන ක්ෂේත්‍රය කෙරෙහිද අවධානය යොමු කළ එතුමා කොමියුනිස්ට් පක්ෂය හා එක් වෙමින් එහි මධ්‍යම කාරක සභාවට පත් විය. ඉන් අනතුරුව 2000 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ජාතික ලැයිස්තුවෙන් මෙම උත්තරීතර සභාව වෙත පැමිණි ගුණවර්ධන මහාචාර්යතුමා බලයට පත් පොදු ජන එක්සත් පෙරමුණු රජයේ විද්‍යා හා තාක්ෂණ ඇමතිවරයා වශයෙන් පත් කරනු ලැබිණි. 2001 වර්ෂයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග ජනාධිපතිතුමියගේ උපදේශකවරයකු ලෙසද කටයුතු කළ අතර ඉන්දියා-ශ්‍රී ලංකා පදනමේ සභාපති වශයෙන්ද, විශ්වවිද්‍යාල උප කුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ සංගමයේ සභාපති වශයෙන්ද සුවිශේෂී සේවාවක් ඉටු කළේය. ඒ හැරුණු විට තවත් තනතුරු ගණනාවක් එතුමා වෙත හිමි වී තිබුණ අතර, එම තනතුරු ආහරණ ලෙස තබා නොගනිමින් ඒ සෑම තනතුරක් මඟින්ම තමන්ගේ රටටත්, ජාතියටත් ඉටු විය යුතු සේවාව නොඅඩුව සපයාලීමට මහ ඇදුරු ගුණවර්ධනයන් උත්සාහ ගත්තේය.

1971 සිට 2008 දක්වා කාලය අතරතුර ඉන්දියාව, ඇමෙරිකාව, ඉතාලිය, බංග්ලාදේශය, තායිලන්තය හා මැලේසියාව වැනි රටවල්වල පැවැති සමුළු ගණනාවකදී දේශන පවත්වමින් තම දැනුම් සම්භාරය ලොව වෙත පිරිනැමීමට පියවර ගත් එතුමා ඒ සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකාවට විශාල කීර්තියක් අත්පත් කර දුන්නේය. ශ්‍රී ලංකාවටත් පොදුවේ සමස්ත ලෝකයටත් ශාස්ත්‍රීය වශයෙන් දැනුම් ගබඩාවක් වූ ලෙස්ලි ගුණවර්ධන නම් වූ විද්වතානන් සුළු කාලයක් අසනීප තත්ත්වයෙන් පසු වී වසර 72ක් ආයු වළඳා 2010 නොවැම්බර් මස 16 වැනි දින අනාගත පරපුරට පිරිමැසිය නොහැකි පාඩුවක් ඇති කරමින් සදහටම දෙනෙත් පියා ගත්තේය. නිහතමානීත්වයේ ප්‍රතිමූර්තියක් වූ එතුමා තම දේහයේ අවසන් කටයුතු පැය 24ක් ඇතුළත සිදු කරන ලෙස ද ඉල්ලීමක් කර අවසන්වරට ද ඒ මිනිස්කම ලොවට කියා පාමින් දැයෙන් සමු ගත් උතුම් මිනිසෙක් විය.

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපනයේ නියැළෙන දූ දරුවන්ගේ යහපත පිණිසත් ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම පිණිසත් සුවිශේෂී මෙහෙවරක යෙදුණු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ දයාබර භාර්යාව වූ විරංගනී ගුණවර්ධන මැතිනියටත්, අසේල ගුණවර්ධන පුතණුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙතත් දන්වා යවන ලෙස යෝජනා කරමි.

[අ. භා. 2.22]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා පිළිබඳව දීර්ඝ විස්තරයක් ගරු සභා නායකතුමා විසින් ඉදිරිපත් කරනු ලැබුවා. එතුමාගේ ජීවිත කාලය, එතුමාගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට වාගේම ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තුව තුළින් සුරැකීමට කළ සේවාව පිළිබඳවත් අපට කරුණු අහන්න ලැබුණා.

ගරු මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයකු මෙන්ම හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ රජයේ අමාත්‍යවරයෙක් හැටියටත් කටයුතු කරපු මහත්මයෙක්. එතුමා විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ අංශාධිපති වශයෙන් කටයුතු කරලා තිබෙනවා. ඒ, ප්‍රධානියා හැටියට.

ඒ වාගේම ශාස්ත්‍ර පීඨාධිපති වශයෙන්ද කටයුතු කර තිබෙනවා. මේකෙන් අපට බොහොම පැහැදිලි වෙනවා, එතුමාගේ දැනීම් සම්භාරය තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, විශ්වවිද්‍යාලීය අධ්‍යාපනය ලබන අපේ දූ දරුවන්ටත්, සමස්තයක් හැටියට රටටත් මොන තරම් සේවයක් ඉටු වුණාද කියා. දැන් අපට අහන්න ලැබුණා, දේශීය වශයෙන් පමණක් නොවෙයි විදේශීය රටවල් කිහිපයකම එතුමාගේ දේශන මොන ආකාරයෙන් ඉදිරිපත් කළාද, ඒ දේශන තුළින් ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් ලබා ගන්නට අවස්ථාවක් සැලසුණාද කියන එක. මේ අවස්ථාවේදී ඒ උදාර පුද්ගලයාගේ, ඒ උගතාගේ අභාවය ගැන අපේ පක්ෂයේ කනගාටුව ඒ පවුලේ සියලු දෙනාටම පිළිගන්වමින්, එතුමාට නිවන් සුව ලැබේවා'යි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 2.25]

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
( மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා පිළිබඳව මා විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු

කාලයේ පටන්ම දන්නා බොහෝ දේවල් කතා කරන්නට තිබෙනවා. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු සම්භාවනීය මහාචාර්යවරයෙක්. ඉතිහාසය පිළිබඳව එතුමාගේ නිගමන, එතුමාගේ අලුත් මත, එතුමාගේ දර්ශන අදත් ඉතිහාසඥයන් අතර නොමැකී තිබෙනවා. එතුමාගේ පොත් පත් ගණනාවක ඉතිහාසය පිළිබඳව එතුමාගේ මත, එතුමාගේ දර්ශනය එතුමා සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, තරුණ කාලයේදීම එතුමා වාමාංශික දේශපාලනයට එකතු වෙලා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ ව්‍යාපාරය තුළ, පක්ෂය තුළ, පක්ෂයේ මධ්‍යම කාරක සභාව තුළ, පක්ෂයේ දේශපාලන මණ්ඩලය තුළ ඉතාම ක්‍රියාකාරීව කටයුතු කළා. අප විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ව සිටි අවධියේදීත් ශිෂ්‍ය නායකයන් හැටියට අපට මඟ පෙන්වපු විශ්වවිද්‍යාල මහාචාර්යවරයා වුණේ ලෙස්ලි ගුණවර්ධන මැතිතුමායි.

ගරු කථානායකතුමනි, අද අප අලුතින් නිර්මාණය කරන්න උත්සාහ කරන දේශපාලන, සමාජ ආර්ථික සංවාදයට ඉතාම ක්‍රියාකාරි ලෙස එතුමා සහභාගි වුණා.

එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් වුණත් අනෙක් සියලු විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන්ගේ ආරාධනා පරිදි ඒ විශ්වවිද්‍යාලවලට ගොස් ඒ විශ්වවිද්‍යාල තුළ තමන්ගේ දේශපාලන මතය කියමින් ශිෂ්‍යයන් සමඟ දේශපාලන, සමාජ, ආර්ථික සංවාදවලට පැටලෙමින් විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හදාරන්නේ නැති දරුවන්ට සමාජ, දේශපාලන, ආර්ථික දැනුම ලබා දීම සඳහා මඟ පෙන්වීම් කළා. ඒ කාලයේ ශිෂ්‍යයෝ හැටියට, ශිෂ්‍ය නායකයෝ හැටියට අපට මතු වන ගැටලුවකදී අපි මුලින්ම කථා කරන්නේ මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාටයි. එතුමා ඒ හැම මොහොතකම ඉතාම ක්‍රියාකාරී ලෙස අපත් සමඟ බද්ධ වෙලා, අපත් සමඟ එකතු වෙලා, අපට මඟ පෙන්වමින් අපේ කටයුතුවලට රුකුල් දුන්නා.

ගරු කථානායකතුමනි, මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේත් පොදුජන එක්සත් පෙරමුණු රජයේත් උපදේශකවරයකු හැටියට විශාල මඟ පෙන්වීමක් කළා. අවසානයේ ආණ්ඩුවට එකතු වෙලා අමාත්‍යවරයකු හැටියට මේ පාර්ලිමේන්තුව තුළත්, කැබිනට් මණ්ඩලය තුළත් උගතෙක්, බුද්ධිමතෙක්, දාර්ශනිකයෙක් සහ ඉතිහාසඥයෙක් හැටියට අපට ලොකු මඟ පෙන්වීමක් කළා. එතුමා ඉතාම සුළු කාලයක් අසනීපයෙන් ඉඳලා අප අතරින් වියෝ වුණා.

ගරු කථානායකතුමනි, එදා ශිෂ්‍යයෝත් අද ශිෂ්‍යයෝත් ආදරය කරන මහාචාර්යවරයකු වූ, මහත්මා ගතිගුණ ඇති ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාගේ වියෝව අපේ රටේ සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයටත් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයටත් විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයටත් නොමැකෙන පාඩුවක් බව ප්‍රකාශ කරන්න කැමැතියි. මම එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.28]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු කථානායකතුමනි, මෙම ගරු සභාවේ විවිධ අග්‍රගණ්‍ය බුද්ධිමතුන් ඉඳලා තිබෙනවා. අපට මතක් වනවා, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා, ඒ වාගේම ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා, ඒ වාගේම පී. කන්දයියා මැතිතුමා වැනි ඉතාම උගත් නියෝජිතවරු මේ ගරු සභාවට ගෞරවය ගෙනැවිත් දීලා තිබෙන බව. අපේ සගයකු වූ අභාවප්‍රාප්ත මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාත් ඒ හා සමානව විශිෂ්ට ගණයේ උගතෙක්, බුද්ධිමතෙක් කියලා අපට නිර්භයවම ප්‍රකාශ කරන්න පුළුවන්.

ඒ කරුණු දිහා බලන කොට ඒ සියලුම බුද්ධිමතුන් එන්නේ වාමාංශික ව්‍යාපාරයෙන්. වාමාංශික ව්‍යාපාරයට කරන ගෞරවයක් හැටියට අපි එය මතක් කරන්න ඕනෑ. මගේ මිත්‍ර ලෙස්ලි ගුණවර්ධන මහාචාර්යතුමාත් විශ්වවිද්‍යාල කාලයේ පටන්ම ලංකා කොමියුනිස්ට් පක්ෂයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරපු කෙනෙක්. එතුමා විශ්වවිද්‍යාලයට ඇතුළත් වී අවුරුදු දෙකකට පස්සේ මම විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. අපේ කාලයේ ඉතාම ප්‍රතාපවත්, ආදර්ශවත් ශිෂ්‍යයකු හැටියට ලෙස්ලි ගුණවර්ධන ශිෂ්‍යයා හඳුන්වන්න පුළුවන්.

ඇත්ත වශයෙන් එතුමාගේ ජීවිත කථාව නිදහස් ලංකාවේ ආදර්ශවත් කථාවක් කියලා අපට කියන්න පුළුවන්. එතුමාගේ දෙමවුපියන් එතුමා කුඩා කාලයේ නැති වුණා. නමුත් එතුමාගේ බුද්ධි මහිමය තුළ එතුමා ඉදිරිපත් වූ සෑම විභාගයකින්ම පළමුවන තැනට ආවා විතරක් නොවෙයි, ඉහළම ශිෂ්‍යත්ව ලබා ගන්නත් එතුමාට පුළුවන් වුණා. පහේ ශිෂ්‍යත්ව විභාගය, SSC විභාගය, විශ්වවිද්‍යාල ප්‍රවේශය, GAQ විභාගය සහ අවසාන විභාගය කියන හැම එකකින්ම ගන්න පුළුවන් උපරිම ලකුණු අරගෙන, උපරිම ස්ථානය අරගෙන තමයි එතුමා තමන්ගේ අධ්‍යාපනය ඉදිරියට ගෙන ගියේ. ලංකාවේ නිදහස් අධ්‍යාපනය තුළින් යම් කිසි චරිතයක් නිර්මාණය කරන්න නිදහස් අධ්‍යාපනය ගෙනාපු අය කල්පනා කළා නම්, ඒ ලෙස්ලි ගුණවර්ධන චරිතයයි කියලා මා මතක් කරන්න කැමැතියි. එතුමාගේ මිත්‍රයන් එතුමාට කථා කළේ "ship" කියන ආදර නාමයෙනුයි. මොකද, එතුමාට හැම දාම scholarships ලැබුණා. එතුමා ගිය හැම විභාගයකින්ම එතුමා අනිවාර්යයෙන් මුල් තැනට ආවා. විශේෂයෙන්ම තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය තුළින් විශ්වවිද්‍යාලයට ඇවිත්, ඒ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් අතරින් ඉහළම පෞරුෂය, දැනුම, පෙනුම, සුහදශීලීභාවය යන හැම දෙයින්ම එතුමා මුල් තැන ගත්තා.

මට මතකයි, ඒ කාලයේ අපේ ධර්මසිරි සේනානායක මැතිතුමා විශ්වවිද්‍යාලයේ සිටියා. ඒ දවස්වල අපි කොටස් දෙකකට බෙදිලා සිටියා, ට්‍රොට්ස්කිවාදීන් සහ කොමියුනිස්ට්වාදීන් කියලා. ට්‍රොට්ස්කිවාදීන්ට නායකත්වය දුන්නේ විශ්වවිද්‍යාලය ඇතුළේම හිටපු ඩොරික් ද සූසා මැතිතුමා. එතුමා සුමානයකට වරක් විශ්වවිද්‍යාලයෙන් පිටට ගිහින් පන්ති පවත්වනවා. ඒ වාගේම මාක්ස්වාදය ගැන, ලංකා වාමාංශික ව්‍යාපාරයේ ඉතිහාසය ගැන කොමියුනිස්ට් පක්ෂයත් තරගකාරීව වෙන තැනක පන්ති පවත්වනවා. මා හිතන හැටියට ඒ කාලයේ සිටියේ ආචාර්ය වැන්ඩන් රීසන් මැතිතුමා. ඒ පන්තිවලට කොමියුනිස්ට් පක්ෂයේ අය යනවා. ඒ ගැන අපේ එස්.බී. දිසානායක මැතිතුමාට මතක ඇති. අපි එකම ශාලාවේ සිටියත්, තුන්වන ජාත්‍යන්තරය සහ හතරවන ජාත්‍යන්තරය අතර තිබෙන ගැටුම් සමහර විට අපේ පුංචි ශාලාවලත් තිබුණා. නමුත් ඒක බුද්ධි ප්‍රබෝධයට හේතුවක් වුණා. ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා විශ්වවිද්‍යාල කාලයේ පිළිගත් ඒ මාක්ස්වාදි දර්ශනය අවසානය දක්වා රැක ගත්තා. එතුමාගේ ඉතිහාසය දෙස බැලීමේදී ඒ මාක්ස්වාදි දර්ශනය දේශපාලන වශයෙන් විතරක් නොවෙයි, ශාස්ත්‍රීය කටයුතුවලදීත් ඉතාමත්ම වැදගත් දර්ශනයක් බවට පත් වුණා.

අද ලෝකයේ අග්‍ර ගණ්‍ය ඉතිහාසඥවරිය හැටියට ඉන්දියාවේ රොමිලා තාපර් මැතිනිය හඳුන්වන්න පුළුවන්. Romila Thapar is Emerita Professor of Ancient Indian History in Jawaharlal Nehru University. මෙන්න එතුමිය ලෙස්ලි ගැන කියන දෙය. I quote:

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

"He was one those rare historians for whom history was what E.H. Carr described as a dialogue between the past and the present. His mind scanned the world around him and sought connections and contexts, as is characteristic of the best of historians.

But his curiosity did not stop at explaining the past. He was sensitive to the present and more so to its inequities and concerned about where our kinds of societies were heading."

තවත් තැනක එතුමිය මෙහෙම කියනවා:

"Leslie's magisterial work was on what Max Weber has called 'monastic landlordism'. In Robe and Plough, Leslie extended the meaning of the term by relating it to the socio-economic context that was its crucible.

This he did by creatively using Marxist methods of analysis, without in any way reducing the argument to a mechanical causation. It became an intensive study of the political relationship of the Sangha and royal

authority as well as the economic base of the authority of monastic establishments."

මේ අනුව අප අද කථා කරන්නේ මේ ගරු සභාවට ගෞරවයක් ගෙනාපු මන්ත්‍රීවරයෙක් ගැන විතරක් නොවෙයි, මුළු ලෝකයම පිළිගත් මාක්ස්වාදී ඉතිහාසඥයෙක් ගැනයි.

ගරු කථානායකතුමනි, එතුමාගේ පෞද්ගලික ගතිගුණ ගැන මා වචනයක් කථා කරන්න ඕනෑ. එතුමා අපේ ඩිව් ගුණසේකර මැතිතුමා හොඳට අඳුනනවා. එතුමා තරුණ ඩිව් ගුණසේකර මැතිතුමා, සරත් මුත්තෙට්ටුවේගම මැතිතුමා වැනි අයත් එක්ක ඉතාම ළඟින් ඇසුරු කළා. එතුමා ඉතාම ප්‍රියජනක මහත්මයෙක්. හැම දාම වාමාංශික ව්‍යාපාරයේ හිටපු කෙනෙක්. ඒ වාගේම ඉතාම ඍජු චරිතයක්. හැම දෙයක් ගැනම ඉතාම බුද්ධිමත්ව බලලා නිරහංකාරව හැම වෙලාවේම හරි දේ කරන්න මහන්සි ගත්ත සගයෙක් හැටියට අද අප එතුමාව අනුස්මරණය කරනවා. එතුමාගේ ජීවිතයේ අවසාන කාලයේ පවා පැහැදිලිවම කිව්වා, "මම මිය ගියාට පස්සේ ඔය නොයෙක් විධියේ අනවශ්‍ය සෙල්ලම් දමන්නේ නැතිව පැය 24ක් ඇතුළත ඒ කටයුතු අවසන් කරන්න" කියලා. එතුමා පොත් සහ ලිපි ලේඛන 100කට වැඩිය ලියලා තිබෙනවා. ඒ නිසා මේ ගරු සභාවට විශාල ගෞරවයක් ගෙනාපු මන්ත්‍රීවරයෙක් හැටියට අප එතුමා මේ අවස්ථාවේදී මතක් කරනවා. ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය ගැන අපගේ ශෝකය එතුමාගේ ආදරණීය භාර්යාවට සහ පුතාට අප සියලු දෙනාම වෙනුවෙන් දන්වන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 2.37]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**

(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)

(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත මහාචාර්ය රණවීර ලෙස්ලි ගුණවර්ධන මහතා මෑත අවධියේ මෙරට බිහි වූ ශ්‍රේෂ්ඨතම ඉතිහාසඥයින් කිහිප දෙනා අතරින් එක් අයෙකු බව මෙරට මෙන්ම ජාත්‍යන්තර තලයේ උගතුන්ගේ හා බුද්ධිමතුන්ගේ මතයයි. එතුමා පළමුවෙන්ම, දක්ෂ ගුරුවරයෙකු, විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු, මණ්ඩපාධිපතිවරයෙකු, උප කුලපතිවරයෙකු විය. දෙවනුව, එතුමා කීර්තිමත් ඉතිහාසඥයෙක් විය. තුන්වනුව, එතුමා මෙරට මෑත දේශපාලන ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරී කාර්ය භාරයක් ඉටු කළ බුද්ධිමතෙකු විය. සිව්වනුව, එතුමා ග්‍රන්ථ කතුවරයෙකු විය.

ශිෂ්‍ය අවධියේ පටන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට සමීප වූ තරුණ රණවීර ලෙස්ලි ගුණවර්ධනයන්, පසුව අප පක්ෂයේ සාමාජිකයෙකු, දිස්ත්‍රික් නායකයෙකු, මධ්‍යම කාරක සභිකයෙකු, දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස මෙරට වාමාංශික ව්‍යාපාරය වර්ණවත් කළ නියමුවෙකු විය. සමකාලීන සටන් සගයෙකු ලෙස එතුමාත් සමඟ 1972 වසරේදී පක්ෂයේ 8වන ජාතික මහා සම්මේලනයේදී පක්ෂයේ මධ්‍යම කාරක සභාවට තේරී පත්වීමට ලැබීම පිළිබඳව මා ආඩම්බරයට පත් වෙනවා. මම එතුමා සමඟ පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ බොහෝ කාලයක් එකට ක්‍රියා කළෙමි. ශ්‍රී ලංකාවේ මාක්ස්වාදී ව්‍යාපාරයට මෙන්ම මාක්ස්වාදී න්‍යාය පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රයට මහාචාර්ය ගුණවර්ධනයන්ගේ දායකත්වය ජාත්‍යන්තර පිළිගැනීමට පාත්‍ර විය. ආසියාතික සමාජ සංයුතිය - Asiatic mode of production - පිළිබඳ මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද අදහස පිළිබඳ එතෙක් පැවති මතවාද අධ්‍යයනය කරමින්, මාක්ස් විසින් සැබැවින්ම කියන ලද්දේ කුමක් දැයි සොයා ගැනීමට එතුමා විසින් දරන ලද ප්‍රයත්නය මාක්ස්වාදය පිළිබඳ අධ්‍යයනයට නව **මානයක්** එක් කරන ලද්දේ යැයි කිව හැකිය.

1979 දී එතුමාගේ ප්‍රථම දීර්ඝ පර්යේෂණ නිබන්ධනය වන "සිවුර සහ නඟුල" - "Robe and Plough" - ග්‍රන්ථය මෙරට නව ඉතිහාසකරණ සම්ප්‍රදායක් ආරම්භ කළා යයි කිව හැකිය. එය මාක්ස්වාදී දෘෂ්ටි කෝණයෙන් බලා කරන ලද නිර්මාණයකි. මාක්ස් විසින් සැබැවින්ම කියන ලද්දේ කුමක් දැයි සොයා ගැනීමට මා ඒ ගැන කියා තිබියා. 1975 දී ප්‍රථම වරට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "The Sri Lanka Journal of Humanities" නමැති වාර ප්‍රකාශනයේ "The analysis of pre-colonial social formation in the writings of Karl Marx" යනුවෙන් පළ කරන ලද එම ලිපිය 1976 දීම "Indian Historical Review" සඟරාවේ ද, 1977 දී මොස්කව් විද්‍යා ඇකඩමියේ ශාස්ත්‍රීය වාර ප්‍රකාශයක් වූ "Narodi Azi E Afriki" ප්‍රකාශනයේ රුසියන් බසින් ද පළ කරනු ලැබිණ.

මෙම අධ්‍යයනය ප්‍රථමවරට සිංහල භාෂාවෙන් පළ වූයේ වසර 30කට පසුය. එනම් 2005 වසරෙහි මහාචාර්ය රණවීර ලෙස්ලි ගුණවර්ධනයන් විසින් සංස්කරණය කරන ලද "ඉතිහාසයේ අතීතය" ලිපි එකතුවේ "අපරදිග චින්තනය හා ශික්ෂණයක වර්ධනය" නම් වූ පරිච්ඡේදයේ කොටසක් ලෙසය. මෙම අධ්‍යයනයේ විශේෂ ලක්ෂණය වන්නේ ආසියාතික සමාජ සංයුතිය පිළිබඳ මාක්ස් විසින් දරන ලද අදහස් පිළිබඳ එතෙක් පැවැති අවුල් සහගත තත්ත්වය නිරවුල් කිරීමයි. මෙය මාක්ස්වාදය පිළිබඳ කලාතුරකින් හමුවන "මාක්ස්වාදී අධ්‍යයනයක්" ලෙස හැඳින්වීම නිවැරදිය. ගරු කථානායකතුමනි, මෙම ලේඛනයේදී කාල් මාක්ස් ලංකාව පිළිබඳ තබා ඇති සටහන් පිළිබඳව මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධනයන් මෙසේ සඳහන් කරයි:

"මාක්ස්ගේ සටහන් පොත්වල ශ්‍රී ලංකාව ගැනද සටහන් ලියා ගෙන තිබෙනු දක්නට ලැබීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. දිවයිනේ කෘෂිකර්මය හා තාක්ෂණය, අස්වැන්න බෙදා ගත් ආකාරය හා ආර්ථිකය තුළ සාමූහික ශ්‍රමයට හිමි වූ වැදගත් ස්ථානය ඔහුගේ අවධානය දිනා ගත් ප්‍රශ්න අතර විය. අය බදු සංකල්පය ගැන අග්ගඤ්ඤ සූත්‍රයෙන් ලබා ගත් උද්ධෘත පාඨයක්ද, ඒ පාඨය ගැන බුද්ධඝෝෂ තෙරුන් ලියූ අටුවාව ද මාක්ස් ලියූ සටහන් අතර දක්නට ලැබේ."

මෙම සටහන් තමා විසින්ම කියවා අධ්‍යයනය කළ ප්‍රථම ශ්‍රී ලාංකික ඉතිහාසඥයා මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධනයන් විය හැකිය. මහාචාර්ය රණවීර ලෙස්ලි ගුණවර්ධන ග්‍රන්ථ කතුවරයෙකි. එතුමා විසින් ලියන ලද, වාමාංශික ව්‍යාපාරයේ පුරෝගාමියෙකු වූ අභාවප්‍රාප්ත සුගීස්වර වික්‍රමසිංහයන්ගේ චරිතාපදානය 1980 දී ප්‍රකාශයට පත්වූවා. එම ග්‍රන්ථය "අරගලයක අතීතය" වශයෙන් නම් කරනු ලැබුවා. වාමාංශික ව්‍යාපාරය පිළිබඳ මෙතෙක් පළ කරන ලද එකම හා මුල්ම පර්යේෂණ ග්‍රන්ථය එයයි.

වමේ ව්‍යාපාරයේ ශක්තීන් මෙන්ම අභියෝගයන්ද, නව්‍යතාව පිළිබඳවද මෙතෙක් ලියැවී ඇති හරවත්ම පර්යේෂණාත්මක ග්‍රන්ථය එයයි.

2008 දී පළවූ "Sri Lankan History - Some reflections with special emphasis on the development of the State" නැමැති කුඩා ග්‍රන්ථය නිසැකවම මහාචාර්ය ගුණවර්ධනයන්ගේ ශාස්ත්‍රීය ප්‍රයත්නය පිළිබඳ නොමැකෙන ස්මාරකයකි. මෙය ඉතිහාසය හදාරන අයට හොඳ මෙවලමක්. එතුමාගේ අවසාන කෘතිය, එතුමාගේ ශාස්ත්‍රීය ජීවිතයේ අවසාන ජයග්‍රහණයකි. එය ලංකා ඉතිහාසයේ යුග බෙදීම පිළිබඳ ඔහුගේ පර්යේෂණාත්මක නිරීක්ෂණයකි. මාක්ස්වාදී ප්‍රවේශයකින් ඉතිහාසය අධ්‍යයනය කර විශ්ව කීර්තියට පත් මේ ශ්‍රී ලාංකික ඉතිහාසඥයා අපි ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරමු.

විශ්ව කීර්තියට පත් සමාජ විද්‍යාඥයෙකු වන මහාචාර්ය ගණනාථ ඔබේසේකර එතුමා පිළිබඳව මෙසේ කියයි:

"හෙතෙම මෙරට ජනවාර්ගික ඝට්ටනය පිළිබඳවත් එය විසින් ඉතිහාසකරණය කෙරෙහි ඇති කරන ලද නිෂේධනීය වූ බලපෑම පිළිබඳවත් අතිශය කම්පාවට පත්ව සිටියේ ය. ජනවාර්ගික ආතතිය ඇවිලවීමට හේතු භූත වූ මිථ්‍යාවන් බිඳ දැමීම සඳහා හෙතෙම තම ශාස්ත්‍රීය ලේඛන බලවත් අවියක් කොට ගත්තේ ය. අවංක සහ විශ්වාසනීය ඉතිහාසඥයකු ලෙස ඔහු විසින් ඉදිරිපත් කරන ලද විෂය මූල වූ මතවාද ඇතැමුන්ට රුචි නොවීය. එසේ වුවද, නිර්භය ලෙස එවැන්නකට මුහුණ දීමට ඔහුට හැකි විය."

එතුමා ශාස්ත්‍රීය වශයෙන් අතිශය සම්මානයට පාත්‍ර වූවකු මෙන්ම සැබෑ ශාස්ත්‍රඥයෙකු හා අව්‍යාජ මානව හිතවාදියෙකු විය.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධනයන්ගේ අභාවය සම්බන්ධයෙන් එතුමා සාමාජිකත්වය දැරූ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන්ද, එතුමාගේ සමීපතම මිත්‍රයකු වශයෙන්ද, සටන් සගයකු වශයෙන්ද කටයුතු කළ මා පෞද්ගලිකවද මේ අවස්ථාවේදී එතුමාට සාතිශය ශෝකය පිරිනමා සිටිනවා. එය එතුමාගේ භාර්යාව හා පුතා ඇතුළු පවුලේ අයට දන්වා යවන්නය කියා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ රටටත්, වැඩ කරන ජනතාවටත් එතුමා කළ මෙහෙය වෙනුවෙන් අපගේ ආචාරය, ගෞරවය හා උපහාරය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

[අ. භා. 2.45]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

ගරු කථානායකතුමනි, ලංකා සම සමාජ පක්ෂය හැටියටත්, එමෙන්ම විද්‍යාත්මක කටයුතු පිළිබඳ ඇමතිවරයා හැටියටත් මුලින්ම අපේ බලවත් ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි, දිවංගත මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මැතිතුමාගේ අභාවය සම්බන්ධව.

දැන් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන ශෝක යෝජනාවට සම්බන්ධ වීම අපේ යුතුකමක් හැටියට සලකනවා. එතුමා එක්ක අපේ සම්බන්ධය කාලයක් තිස්සේ විශ්වවිද්‍යාලයේදී තිබුණත්, මට එතුමාව හොඳට හඳුනා ගන්න අවස්ථාව ලැබුණේ, 2000 වර්ෂයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමියගේ රජය යටතේ එතුමා විද්‍යා හා තාක්ෂණ ඇමතිවරයා හැටියට පත් කරපු අවස්ථාවේදී. එතුමා ඒ අවස්ථාවේ මගෙන් ඉල්ලීමක් කළා, එතුමාගේ විද්‍යා උපදේශක හැටියට කටයුතු කරන්නය කියලා. ඒ අවුරුදු දෙකක කාලය තුළදී අප අතර කිට්ටු සම්බන්ධතාවක් තිබුණා. ඒ කාලයේ එතුමා එක්ක නොයෙකුත් සාකච්ඡා ඇති කර ගන්නට පුළුවන් වුණා. ඒ තුළින් මට එතුමා ගැන වැඩි අවබෝධයක් ලබා ගන්නට පුළුවන් වුණා.

සමාජවාදීන් හැටියට, මාක්ස්වාදීන් හැටියට අපි ඉතිහාසය දිහා බලනකොට, එය රජවරුන්ගේ ඉතිහාසයක් හැටියට නොවෙයි බලන්නේ. ඒ ඉතිහාසය මිනිස් ඉතිහාසයක්; මිනිස් සමාජය, ආර්ථිකය හා දේශපාලනය සම්බන්ධ වන ඉතිහාසයක්. එතුමා දක්ෂ ඉතිහාසඥයකු පමණක් නොවෙයි, පර්යේෂකයෙක්. අලුත් සොයා ගැනීම්, අලුත් නිර්මාණ ඉදිරිපත් කරපු දක්ෂ විද්වතෙක්. අපි එතුමාට හිස නමනවා, එතුමා ඒ ඉතිහාසය දිහා බලලා අපක්ෂපාත මැනීමක් කිරීම ගැන. ඒ මාක්ස්වාදී කෝණයෙන් බැලුවාම මේ සමාජ ස්ථරය, ආර්ථික ප්‍රශ්න, පන්ති බෙදීම් යන මේවා සියල්ලම සලකලා තමයි ඉතිහාසයේ ගමන මනින්නේ. එතුමාට ඒ හැකියාව තිබුණා.

ගරු කථානායකතුමනි, එතුමා අපේ රටේ බෞද්ධ ඉතිහාසය ගැන සොයා බලා මතු කරපු කරුණු ඉතාම වැදගත්, අපේ රටේ ඉතිහාසය හරියට තේරුම් ගැනීම සඳහා. එතුමාගේ ඒ වැදගත් සොයා ගැනීම්, ඒ ඉදිරිපත් කරපු අදහස් එක්ක මට ගළපන්නට පුළුවන් වනවා, ඊට මෑත යුගයේ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා බ්‍රිතාන්‍ය පාලන කාලය සම්බන්ධව ලියපු පොත. ඒ දෙන්නාම මේවා ලිව්වේ පීඑච්ඩී උපාධිය ලබා ගැනීමට. ඉතින් ඒ පොත් දිහා බැලුවාම මා හිතන හැටියට සත්‍ය තත්ත්වය හරියට වටහා ගැනීම වඩා පහසු වනවා.

එතුමාගේ ඉතිහාසය හැදෑරීම තුළ තිබුණ අනෙක් ලක්ෂණය තමයි, මා මිත්‍ර ඩිව් ගුණසේකර මැතිතුමා කිව්වාක් මෙන් ජාති භේදය ගැන එතුමාගේ තිබුණු අදහස. එහි තිබෙන හිස් භාවය ගැන කරුණු ඉදිරිපත් කරමින්, නොයෙකුත් මිථ්‍යාවන් බිඳ වට්ටන්නට එතුමාගේ ඒ සොයා ගැනීම් උපකාර වුණා. උදාහරණයක් හැටියට කිව්වොත්, අපේ ඉතිහාසයේ යම් යුගයක ඇති වුණ ඒ චෝල ආක්‍රමණයෙන් වෙච්ච විනාශය ගැන කථා කරද්දී එතුමා පෙන්වා දී තිබෙනවා, යුද කාලයේදී ස්වාමීන් වහන්සේලා පවා ගිහිල්ලා තමන්ගේ ජීවිත බේරා ගෙන ජීවත් වුණේ දකුණු ඉන්දියාවේ ඒ චෝල ප්‍රදේශයේ කියලා.

එතුමා ඒ ආකාරයට අපේ සමාජයේ මිශ්‍රත්වය පැහැදිලිව පෙන්නුවා. ජාති වෙනස්වීම්, ජාති බෙදීම් පැත්තෙන් නොවෙයි, යථාර්ථය පදනම් කර ගෙන කරුණු ඉදිරිපත් කළා. අපේ පැරණි ශිෂ්ටාචාරයේ විද්‍යාවයි තාක්ෂණයයි ගැන විශේෂයෙන්ම වාරිමාර්ග ක්‍රම තුළ භාවිතය ගැන විශේෂ දැනුමක් එතුමාට තිබුණා. ඒවා ගැන අපි කථා කළා. මම කලින් බර්නාඩ් සොයිසා ඇමතිතුමාගේ කාලයේ ඉඳලාම ඉල්ලීමක් කරලා තිබුණා අපි ගමට තාක්ෂණය ගෙනියන්න ඕනෑය කියා.

කුඩා, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට අත දෙන්න ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියන්න ඕනෑ කියලා අපි ඒ වැඩ පිළිවෙළ දියත් කරන්න පටන් ගත්තේ ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා ඇමති වෙලා සිටිය කාලයේදීයි. එතුමා කුඩා ළමයෙක් හැටියට හැදුණේ එතුමාගේ මවගේ ගම වන යටන්වල රුවන්වැල්ලේයි. එතැන තමයි පළමුවෙනි "විදාතා" මධ්‍යස්ථානය ආරම්භ කළේ. ඇත්ත වශයෙන් මම නම හැටියට "විද්‍යා තාක්ෂණ දාන" යන්නට "විතාදා" කියන වචනය ඉදිරිපත් කළාම එතුමාගේ අදහසක් හැටියට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඒ භාෂා දැනුම ඇති කෙනෙකුගේ උපදෙස් පිටයි "විදාතා" කියන නම අපි භාවිතා කරන්න යෙදුණේ.

ගරු කථානායකතුමනි, එතුමා මේ සමාජයේ දියුණුවට තමන්ගේ දැනුම භාවිතා කිරීමට වුවමනාවක් තිබුණු විද්වතෙක්

[ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා]

කියලා මම මතක් කරන්න ඕනෑ. කොමියුනිස්ට් පක්ෂය තුළින් එතුමා අපේ සමාජයේ ඉදිරි ගමනට, අපේ ජනතාවගේ දියුණුවට වෙහෙස මහන්සි වෙලා කටයුතු කිරීම ගැනත් අපේ ප්‍රශංසාව පළ කරනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් මේ අවස්ථාවේදී එතුමාගේ බිරිඳටත්, පුතාටත් අනෙකුත් ඥාතීන් සියලු දෙනාටත් අපේ බලවත් ශෝකය පළ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

[2.54 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, the late Member of Parliament, the Hon. (Prof.) Leslie Goonewardene whose Vote of Condolence this House is called upon to pass today, is a great scholar of very high calibre and one of the few Sri Lankan historians well-known to the outside world. To the Sinhala readers, he was better known as Ranaweera Goonewardene through his many writings of which "Anuradhapura Yugaya"- History of the Anuradhapura Period, co-edited with Prof. Amaradasa Liyanagamage, is the most well known. His brilliance as a lecturer was shown when he was asked to lecture in Sinhala on modern India. Even though he had specialized in ancient Indian and Sri Lankan history, he lectured with distinction on the subject with an interesting marxist tinge which was well liked by the students. He was a scholar who had a unique and sharp mind to dissect and interpret the ancient history of Sri Lanka in an interesting and stimulating manner.

In addition to Sinhala and English, he had a solid grasp of Pali and Sanskrit languages and a working knowledge in Latin, Greek and French. He was an authority on the ancient history of Sri Lanka. He even went to the extent of challenging some of the views of Prof. Senarath Paranavithana at that time, the leading archaeologist cum historian on ancient Sri Lanka in the 20th century. The Hon. Leslie Goonewardene rose through the ranks from being an assistant lecturer in History at the University of Peradeniya to become Professor of History, Dean of the Faculty of Arts and finally its Vice-Chancellor. Nonetheless, he brought a new perspective to look at the history of ethnicity in Sri Lanka and forwarded his argument based on a critical study and interpretation of original sources in a well-researched and professional manner, thereby earning the respect even of his critics.

He wrote and lectured extensively on varied subjects in both Sinhala and English. In addition to his expertise on the history of Buddhism in Sri Lanka, he was interested and researched on Sri Lanka's ancient science and technology. His contribution to the study of historiography in Sri Lanka is also noteworthy. He contributed and edited "Ithihasaye Athithaya" - A History of Historiography, the only work published so far in Sinhala on that subject. Even after his retirement and until he became ill about more than a year ago, he was actively engaged in research and publication. His last publication was on periodization in Sri Lankan history. In addition to enriching the academic life in Sri Lanka, he travelled extensively, held leading positions in international academic organizations and participated in many international seminars and conferences around the world.

The Hon. Leslie Goonewardene did not confine himself to academic life alone. He was sincerely interested in the well-being of the people of Sri Lanka and became involved in progressive politics as well. He joined the Communist Party of Sri Lanka during his undergraduate days at the University of Peradeniya in the late 1950s and became active in its politics. He was deeply concerned about the Sri Lanka's ethnic problem and promoted ethnic harmony through his talks and writings. As a result, he was appointed as the Minister of Science and Technology and later as adviser to the President. During his short tenure as Minister, he took a keen interest in taking modern technology to the villages. He should be given credit for promoting the idea of transferring technology to micro and medium-scale industries in the rural sector which was later developed into - as the the Hon. (Prof.) Tissa Vitarana just said - the "Vidatha" programme of the Ministry of Science and Technology.

The Hon. Leslie Goonewardene was always ready to help anyone interested in serious academic work and to his credit he has nurtured a group of serious and dedicated academics at the University of Peradeniya, who would carry the torch of knowledge that he passed on to them for the future. He was keenly interested about China and encouraged others to pursue research and publish the history of China and its relations with Sri Lanka.

Incidentally, Sir, I should recall here that yesterday the Sri Lanka-China Parliamentary Friendship Association was formed under your distinguished Chairmanship with the largest number of Members of Parliament participating. We convey our warmest felicitation to Her Excellency Yang Xiuping, Ambassador for the People's Republic of China for her gracious presence.

Undoubtedly, Sir, the Hon. Leslie Goonewardene was one of those rare breed of distinguished intellectuals Sri Lanka had ever produced. He will be greatly missed by his friends and colleagues in particular and the academic community in general.

Sir, I am also deeply grateful to Mr. Mahinda Werake for this source of information. I would pay my condolences to his beloved wife, Mrs. Viranjani Goonewardene and son, Dr. Asela Goonewardene.

Devoid of any political bias, the late Professor, Minister and the Member of Parliament, always fought for a united, prosperous and cultured Sri Lanka. As far as his valued lifestyle is concerned, I have no doubt that if he had lived today, he would join hands with His Excellency President Mahinda Rajapaksa to take this country forward.

Thank you, Sir.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මා ද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම විධානය කරමි.

මීළඟට, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු ජයසේන රාජකරුණා මහතාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

## ශෝක ප්‍රකාශය: ගරු ජයසේන රාජකරුණා මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஜயசேன ராஜகருணா
## VOTE OF CONDOLENCE: HON. JAYASENA RAJAKARUNA

[අ. භා. 3.00]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කිරීමට දායක වූ ප්‍රවීණ දේශපාලනඥ ජයසේන රාජකරුණා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

ඓතිහාසික පඬුවස්නුවර රාජධානියේ, දහනැක්ගෙදර ග්‍රාමයේ විසූ රාජකරුණා මුදියන්සේලාගේ පුංචිසිංඤෝ රාජකරුණා විදුහල්පතිතුමාගේත්, ජයමහ මුදලිගේ පොඩිනෝනා ජයමහ මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙසින් 1927 මාර්තු මස 27 වැනි දින මොලොව එළිය දුටු රාජකරුණා මුදියන්සේලාගේ ජයසේන රාජකරුණා මහතා දහනැක්ගෙදර විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයත්, කුලියාපිටිය මහා විද්‍යාලයෙන් හා කුරුණෑගල මලියදේව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනයත් ලබා ගත්තේය.

1947 වසරේදී ඉංග්‍රීසි ගුරුවරයෙකු වශයෙන් කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයෙන් සිය වෘත්තීය ජීවිතය ඇරඹූ එතුමා එම වසරේදීම සිංහල මහා සභාවේ වයඹ පළාතේ නායකයකු ලෙස කටයුතු කරමින් ක්‍රියාකාරී දේශපාලනයේද නියැළුණේය. 1956 දී වයඹ පළාත තුළින් විශාල ජනරැල්ලක් ගොඩනඟමින් දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාණන් හට පොදු ජන යුගයක් උදාකරලීම සඳහා සුවිශේෂී ශක්තියක් රාජකරුණා මහතා ලබා දුන්නේය.

ගුරු වෘත්තියේ නියැළී සිටි ජයමහ මුදලිගේ පියසීලි මල්ලිකා ගුණතිලක මෙනෙවිය සමඟින් 1959 වසරේදී අතිනත ගත් එතුමා ඉන් අනතුරුව නීතිය හදාරා නීතිඥ උපාධිය ලබා ගැන්මෙන් පසු කුලියාපිටිය අධිකරණයේ නීතිඥවරයෙකු ලෙස කටයුතු කළේය. 1960 වසරේදී පැවති පළාත් පාලන මැතිවරණයේදී බිංගිරිය ගම්කාර්ය සභාවට තරග කොට ජය ලැබූ එතුමාට එහි සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමේ භාග්‍යය ද ලැබුණි. දිවයිනේ ළා බාලම ගම් සභාපතිවරයා වශයෙන් වාර්තාගත වූ එතුමා ප්‍රදේශයේ උන්නතිය වෙනුවෙන් අතිවිශාල කාර්යභාරයක් මෙම කාල වකවානුව තුළ දී සිදු කළේය.

නීතිඥවරයකු, නීති ග්‍රන්ථ සම්පාදකයකු වශයෙන්ද කටයුතු කළ රාජකරුණා මහතා ව්‍යාපාරිකයකු හා වැවිලිකරුවකු වශයෙන්ද කටයුතු කළේය. ඉතා දක්ෂ හිටිවන කවියකු වූ එතුමා සත්කෝරළ කවි සම්මේලනය ආරම්භ කිරීමට ද දායක වූවේය. 1983 වසරේදී පඬුවස්නුවර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් පත් වෙමින් පාක්ෂිකයන් අභියෝගයන්ට මුහුණ දුන් සෑම අවස්ථාවකදීම පක්ෂයට ශක්තියක් වෙමින් ලබා දුන් නායකත්වය බෙහෙවින් ප්‍රශංසනීයය.

1989 වසරේ පැවති මැතිවරණයේදී පඬුවස්නුවර ආසනය නියෝජනය කරමින් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ජයග්‍රහණය අත් පත් කර ගත් එතුමා පළමුවරට මෙම උත්තරීතර සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගත්තේය. ජනතාව සමඟ උරෙනුර ගැටෙමින් ඔවුනගේ අවශ්‍යතා ඉටුකර දෙමින් ප්‍රදේශයේ අභිවෘද්ධිය නිරතුරුවම ප්‍රාර්ථනා කළ එතුමා ජනතා ආශිර්වාදයෙන් යළිත් 1994 පැවති මහ මැතිවරණයේදීද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරග කොට ජය ලබා දෙවැනි වරටත් මෙම සභාවට පැමිණීමේ භාග්‍යය උදාකර ගත්තේය.

එම අවස්ථාවේදී පඬුවස්නුවර මැතිවරණ බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය උවදුර තදින්ම පැතිර ගොස් තිබූ අතර, පොලීසිය සමඟ එක්වී එම උපද්‍රවයෙන් ප්‍රදේශය සම්පූර්ණයෙන්ම මුදා ගැනීමේ වැඩ පිළිවෙළ මෙහෙයවූ ජයසේන රාජකරුණා මහතා එහිලා සමත් වූ හෙයින් ප්‍රදේශවාසී ගෞරවණීය මහා සංසරත්නයේත්, සමාජ හිතකාමීන්ගේත් පැසසුමට නොමඳවම ලක් විණි. ප්‍රදේශයේ රැකියා නිවාස සෞඛ්‍යය අධ්‍යාපන ආදී විවිධ ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය වෙනුවෙන් කැප වූ එතුමා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ද ප්‍රබල සහයෝගයක් ලබා දුන්නේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, එංගලන්තය, ප්‍රංශය හා චීනය යනාදී රටවල් රැසක සංචාරය කළ එතුමා එම චාරිකාවලින් විශාල දැනුමක් ලබා ගනිමින් එම දැනුම තම ප්‍රදේශයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට ද පියවර ගත්තේය. ඊට අමතරව ඇතැම් රටවල පැවැති සම්මේලනයන්හිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් දේශන පැවැත්වීමට ද එතුමාට සිදුවිණි. ඒ සෑම අවස්ථාවකදීම අප රටට විශාල කීර්තියක් අත් පත් කර දීමට එතුමාට හැකියාව ලැබිණි.

සත් කෝරළයෙන් බිහි වූ විශිෂ්ට ගණයේ ජනතාවාදී දේශපාලනඥයකු වූ එතුමා බිංගිරිය රජමහා විහාරය හා රත්මුළුකන්ද රජමහා විහාරය ඇතුළු විහාරස්ථාන සමඟ නිරතුරුවම සම්බන්ධකම් පවත්වමින් ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ද සුවිශේෂී මෙහෙවරක් ඉටු කළේය. ප්‍රදේශයේ විවිධ සමාජ සේවා ආයතන හා සම්බන්ධවෙමින් ඒ සෑම ආයතනයක්

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

තුළින්ම ඉටු කළ සේවාවන්ට තමන්ගෙන් ලැබිය යුතු දායකත්වය නොමඳව ම ලබා දීමට ද පියවර ගත්තේය.

විවිධ මං පෙත් ඔස්සේ ජනතාවට ළංවෙමින්, ඔවුන්ගේ යහපත ප්‍රාර්ථනා කළ ජයසේන රාජකරුණා නම් වූ මානව හිතවාදී දේශපාලනඥයා වසර 83ක් ආයු වළඳා සත් කෝරළ ජනතාවගේ දෙනෙතට කඳුලක් එක් කරමින් 2010 ඔක්තෝබර් මස 03 වැනි දින මෙලොවින් සදහටම සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, වසර ගණනාවක් තිස්සේ වයඹ පළාතේ දුක් විඳින ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාවේ කටයුතු කළ නීතිඥ ජයසේන රාජකරුණා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, අපගේ බලවත් ශෝකය එතුමාගේ දයාබර භාර්යාව වූ පියසීලි මල්ලිකා ගුණතිලක මහත්මිය ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. SPEAKER left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ. භා. 3.07 ]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජයසේන රාජකරුණා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනාව ගෙනැවිත් ඇති මේ අවස්ථාවේ එතුමා සම්බන්ධව විශේෂයෙන් ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

ජයසේන රාජකරුණා මැතිතුමා අපේ ප්‍රදේශයේ හිටපු විශිෂ්ට ගණයේ දේශපාලනඥයෙක්. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළත්, අපට ප්‍රතිවිරුද්ධ අදහස් දැරුව පක්ෂයක් නියෝජනය කළත් එතුමාගේ දේශපාලන කාලය තුළ, එතුමා නීතිඥ වෘත්තියේ යෙදුණු කාලය තුළ එතුමා හැසුරුණු හැටි, එතුමා කළ දෙවල්, එතුමා ජනතාවත් සමඟ දැක් වූ සම්බන්ධය ගැන අදත් ඒ ප්‍රදේශයේ ජනතාව කථා කරනවා.

මට මතකයි මා ඉස්සෙල්ලාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට පඩුවස්නුවර ආසනයෙන් පාර්ලිමේන්තුවට ඉල්ලන අවස්ථාවේ පඩුවස්නුවර ආසනයේ ගම් දනව්වලට යනකොට ඒ ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ විතරක් නොවෙයි, එක්සත් ජාතික පාක්ෂිකයෝත් ජයසේන රාජකරුණා මැතිතුමා ගැන කථා කළේ බොහොම ගෞරවයෙන්; බොහොම භක්තියෙන්. මොකද, දේශපාලනයේ සාරධර්ම පිරිහුණු යුගයක, සාරධර්ම විනාශ වුණු යුගයක ජයසේන රාජකරුණා මැතිතුමා හොඳ ආදර්ශවත් දේශපාලනඥයකු විධියට කටයුතු කළා.

එතුමා එක අවස්ථාවකදී නීති විද්‍යාලයේ සිටියදීම ගම්සභාපතිවරයකු වශයෙන් කටයුතු කළා. ඊට පසුව 1989 වර්ෂයේ හා 1994 වර්ෂයේත් එතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන් වුණා. එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන කාලය තුළ පවා ඒ ප්‍රදේශයට විශිෂ්ට ගණයේ සංවර්ධන සේවාවක් කළා විතරක් නොවෙයි, අමද්‍යප ව්‍යාපාරය වෙනුවෙන් නැත්නම් තැබෑරුම් වැසීම වෙනුවෙන් පුරෝගාමීව කටයුතු කළා. වයඹ පළාතේ සංවිධායකවරයා වශයෙන් කටයුතු කරන කාලයේ තැබෑරුම් වසන්න අමද්‍යප ව්‍යාපාරය තුළින් එතුමා විශිෂ්ට සේවයක් කර තිබෙන බව මා අසා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දේශපාලඥයකු වශයෙන් දේශපාලනයෙන් හම්බු කළ, දේශපාලනයෙන් තමන් පෝෂණය වුණු කෙනෙක් නොවෙයි. ඒ පවුලත් බොහෙම වැදගත්. ජයසේන රාජකරුණා මැතිතුමාගේ පවුල් පසුබිම ගත්තත්, ඒ ප්‍රදේශයේ හැමෝම අතරේ ජනප්‍රියතාව උසුලමින් බොහොම වැදගත් විධියට ජීවත් වන අයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අසා තිබෙනවා. ජයසේන රාජකරුණා මැතිතුමා නීතිඥයකු වශයෙන් කටයුතු කරනකොට සමහරවිට ආවාට ගියාට නඩු භාර ගන්නේ නැහැ කියලා. නඩු භාර ගැනීමේදී අසාධාරණයක් වනවා කියා දැනුණා නම් ඒ නඩුවට කොතරම් මුදල් ලබා දුන්නත් නඩුව භාර ගැනීමෙන් වැළකී සිටිය බවත් ඒ ප්‍රදේශයේ හිටපු ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් මට ප්‍රකාශ කර තිබෙනවා. දේශපාලන භේදයකින් තොරව අදහන්න ඕනෑ, මෙනෙහි කරන්න ඕනෑ පුද්ගලයෙක් එතුමා. ඒක හොඳටම පැහැදිලි වනවා.

අද දේශපාලනඥයෝ දේශපාලනයට ආවම බලයෙන් කොතරම් ප්‍රතික්ෂේප වුණත්, සමහර දේශපාලනඥයෝ තමන්ගේ බලය අත හරින්න සූදානම් නැහැ. නමුත් ජයසේන රාජකරුණා මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් තවත් කාලයක් ඉන්න පුළුවන්කම තියෙද්දිත්, බලයට පත් වෙලා තියෙද්දිත්, එතුමාට පක්ෂය සමඟ නැත්නම් එතුමාට ඇති වුණු කලකිරීමක් නිසා එතුමා වැදගත් විධියට දේශපාලනයෙන් ඉවත් වෙලා ගියා. ඒ සඳහා එතුමා දෙවතාවක් හිතුවේ නැහැ. එතුමා තවත් කාලයක් රැඳී ඉන්න, එතුමා පත් කරපු ජනතාව වෙනුවෙන් ඒ කාලයවත් රැඳී ඉන්න උත්සාහ කළේ නැහැ. එතුමා දේශපාලනයෙන් ඉවත් වෙලා ගියා. අන්න ඒ වාගේ විශිෂ්ට ගණයේ දේශපාලනඥයෙක් ජයසේන රාජකරුණා මැතිතුමා. එම නිසාම එතුමා ගැන මීට වැඩිය කථා කරන්න අවශ්‍ය නැහැ.

අපේ ප්‍රදේශය නියෝජනය කරපු විශිෂ්ට ගණයේ දේශපාලනඥයෙක් වූ ජයසේන රාජකරුණා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මේ අවස්ථාවේදී මගේ ශෝකය ප්‍රකාශ කරනවා. එතුමා අප අතරින් වියෝ වීම පිළිබඳව එතුමාගේ පවුලේ සියලුම දෙනාට මගේ කනගාටුව ප්‍රකාශ කරමින් ජයසේන රාජකරුණා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.11 ]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම වයඹ පළාතේ,අපේ සත් කෝරලේ හිටපු කෘතහස්ත දේශපාලනඥයෙක් වූ ජයසේන රාජකරුණා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක

ප්‍රකාශ යෝජනාව ගෙන ආ මේ මොහොතේ එයට සම්බන්ධ වෙමින් ශෝකය පළ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවය මුලින්ම පුද කරන්න ඕනෑ.

ජයසේන රාජකරුණා මැතිතුමා කියන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ හදවත දිනා ගත්ත දේශපාලනඥයෙක්. මෙතුමා මුලින්ම අපේ ඓතිහාසික පඬුවස්නුවර රාජධානියේ දහනැක්ගෙදර ගම්මානයේ උපත ලබා කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයෙනුත් ඒ වාගේම කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලබා ගෙන ඉතා දක්ෂයෙක් හැටියට නීති විද්‍යාලයට ඇතුළත් වෙලා නීතිඥ වෘත්තියට ප්‍රවිෂ්ට වුණා. ඒ වාගේම දක්ෂ ඉංග්‍රීසි ගුරුවරයෙක් හැටියට තමන්ගේ දැනුම ගම්බද පාසල් ගණනාවක අහිංසක දුවා දරුවන්ට ලබා දෙන්න එතුමා විශිෂ්ට කැප කිරීමක් කළා.

එතුමාගේ දක්ෂතාව, හැකියාව නිසාම තමයි උපන් ගම් ප්‍රදේශය නොවුණත් බිංගිරිය වාගේ ප්‍රදේශයක ගම් කාර්ය සභාවේ සභාපතිවරයා බවට එතුමා පත් වුණේ. මගේ මතකයේ හැටියට, වැඩිහිටියෝ අපට කියපු හැටියට ස්වාධීනව තරග වැදිලා ගම් කාර්ය සභාවේ සභාපති ධුරය දරන්න එතුමාට වාසනාව, අවස්ථාව, භාග්‍ය උදා වෙලා තිබුණා. එතැනින් එතුමා ආරම්භ කරපු දේශපාලනය විශේෂයෙන්ම අප මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1960 ගම් කාර්ය සභාවේ සභාපතිවරයා බවට පත් වුණා වාගේම, පසු ගිය කාල සීමාවන් තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇද වැටුණු අවස්ථාවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැඟී සිටුවන්න ජයසේන රාජකරුණා මැතිතුමා අති විශාල කැප කිරීමක් කරපු ශක්තිමත් නායකයෙක් වුණා. ඒ නිසාම තමයි එතුමා 1989 පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණාම ඒ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සහයෝගයත් ශක්තියත් නිසා මනාප විශාල ප්‍රමාණයක් අරගෙන එතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න හැකියාව ලැබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පවතින දේශපාලන තත්ත්වයට වඩා වෙනස් වූ දේශපාලන වටපිටාවක් වාතාවරණයක් තමයි 1989 කාලය තුළ තිබුණේ. විශාල භීෂණයක් තිබුණු ඒ වෙලාවේ එක පැත්තකින් දේශපාලනඥයෙක් විධියට තරුණ තරුණියන්ගේ ප්‍රශ්න පිළිබඳව හොඳින් තේරුම් ගන්න පුළුවන් වුණා වාගේම නීතිඥයෙක් හැටියට අවශ්‍ය දැනුම තිබුණු නිසා අපේ දිස්ත්‍රික්කයේ විශාල තරුණ පිරිසකට රැකවරණය ලබා දෙන්න මෙතුමා කටයුතු කළා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී එතුමා ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ.

1994 වර්ෂයේ නැවත වතාවක් පාර්ලිමේන්තු මැතිවරණයට තරග වැදිලා එයින් ජයග්‍රහණය කරලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට පිය නඟන්න කුරුණෑගල දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන් පඬුවස්නුවර ජනතාව වෙනුවෙන් එතුමාට හැකියාව භාග්‍ය උදා වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා විශාල සේවාවක් ඉටු කළා. විශේෂයෙන්ම පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩු කාලය තුළදී පඬුවස්නුවර ප්‍රදේශයේ විදුලිය නැති ගම්මානවලට -විශාල පවුල් සංඛ්‍යාවකට- විදුලිය ලබා දෙන්න, විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න වාගේම ඒ ප්‍රදේශයේ යෝධ සංවර්ධනයක ආරම්භක නායකයා බවට පත් වන්න එතුමාට හැකි වුණා. 1994න් පසු විශිෂ්ට සේවාවක් කරන්න එතුමාට හැකියාව ලැබුණා.

ඒ නිසාම ඒ ප්‍රදේශයේ මහා සංසරත්නය මෙතුමාගේ මේ වැඩ පිළිවෙළට අතිවිශාල කැමැත්තක් දැක් වුවා. මා මුලින් සභාවේ මතක් කළා වාගේ විශේෂයෙන්ම මත් ද්‍රව්‍ය ව්‍යාපාරය නවත්වන්න එතුමා ගත්ත ඒ ක්‍රියා මාර්ගයත් එක්ක මහා සංසරත්නයේ විශාල ප්‍රසාදයක් එතුමා ගොඩ නඟා ගෙන තිබුණා. අපි දන්නවා, එදා අඳුරේ තිබුණු විහාරස්ථානවලට විදුලිය ලබා දෙන්න ජයසේන රාජකරුණා මැතිතුමා අතිමහත් සේවාවක් ඉටු කළාය කියන එක. මම එය මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එතුමා අද අප අතර නැහැ. නමුත් මේ වර්තමාන මනාප මැතිවරණ ක්‍රමය තුළ, හැම දාම තමන් මහජන නියෝජිතයකු බවට පත් වෙලා ඉන්න ඕනෑ කියන ඒ සිතුවිල්ලට තිත තියලා, මානව දයාව, මනුස්සකම, අවංකභාවය පැහැදිලිව ඔප්පු කළ නායකයකුයි මෙතුමා. මීට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කියැවුණා, කලකිරිලා මෙතුමා දේශපාලනයෙන් අයින් වුණායි කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නොවෙයි සිද්ධ වුණේ.

විශේෂයෙන්ම අපි හුඟක් වෙලාවට දැකලා තිබෙන්නේ තමන්ගේ සංවිධායක ධුරය තව කෙනකුට දෙනවා නම් එක්කෝ තමන්ගේ දරුවකුට නැත්නම් තමන්ගේ ළඟම ඥාතියකුට එය පිරිනමන අවස්ථායි. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ඉන්දැද්දීත් -ඉතිහාසයේ මම අහලා තිබෙන එක එක අවස්ථාව- ආසනයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට මේ ප්‍රධාන දේශපාලන පක්ෂය වෙච්ච ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්දැද්දීත්, ඒ සංවිධායක ධුරය ඒ වෙලාවේ වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට හිටපු ධර්මසිරි දසනායක මහත්මයාට පිරිනමන්න කටයුතු කරන්න තරම් ඉතා නිහතමානී, මනුස්සකම්වලින් හෙබි පුද්ගලයකු බවට මෙතුමා පත් වුණා. ඒ වෙලාවේ පක්ෂයේ සභාපතිනිය හැටියට කටයුතු කළ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් විමතියට පත් වුණා, ඒ ලිපිය දුටුවාට පස්සේ.

විශේෂයෙන්ම අපි වාගේ තරුණ දේශපාලනඥයන්ට එතුමාගෙන් ගන්න තිබෙන ඒ වාගේ ආදර්ශ විශාල ගණනාවක් තිබෙනවා. මුලින් මේ ගරු සභාවේදී කිව්වා වාගේ මෙතුමා මුදල් මත යන්නේ නැතුව, විශේෂයෙන්ම මනුස්සකම රැක ගෙන, ඒ වාගේම පක්ෂය රැක ගෙන, තමන්ගේ ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ යුතුකම් කොටස හරියාකාරයෙන් ඉෂ්ට කරමින් කටයුතු කළ ඉතා වැදගත් ශ්‍රේෂ්ඨ ගණයේ දේශපාලනඥයකු බව මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි.

ජයසේන රාජකරුණා මහතාගේ සෙවණැල්ල වාගේ, එතුමාගේ සියලු කටයුතුවලට පිටිපස්සෙන් ඉඳලා විශාල ශක්තියක් ලබා දුන්නේ එතුමාගේ දයාබර බිරිඳ පියසීලි මල්ලිකා ගුණතිලක මැතිනියයි. එතුමිය ගුරුවරියක හැටියට කටයුතු කළා වාගේම තම ස්වාමිපුරුෂයාගේ සියලු දේශපාලන කටයුතුවලදී යෝධ සෙවණැල්ලක්, ශක්තියක් වුණා. ඒ බවත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

පඬුවස්නුවර ප්‍රදේශයේ ඉතාම වැදගත් සම්භාවනීය පවුලක පුද්ගලයකු වන එතුමාගේ දේශපාලනයත් ඉතාම සම්භාවනීය ආකාරයට කරන්න එතුමාට හැකි වුණා කියන එක මම මේ වෙලාවේදී මතක් කරමින්, විශේෂයෙන්ම මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනය හොබවන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, දේශපාලනඥයකු, ඒ වාගේම නීතිඥවරයකු, ඒ වාගේම ගුරුවරයකු, ඒ වාගේම කලාකාරයකු හැටියටත් අපේ රටට විශාල සේවාවක් කරලා, පඬුවස්නුවර ප්‍රදේශයට විශාල සේවාවක් කරලා, සත් කෝරළේ ජනතාවට විශාල සේවාවක් කරලා අප අතරින් සදහටම වෙන් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජයසේන රාජකරුණා මැතිතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුයි මා යෝජනා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. DEPUTY SPEAKER left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 3.18 ]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වකවානු දෙකකදී -වාර දෙකකදී- පාර්ලිමේන්තුව නියෝජනය කර අප අතරින් වියෝ වුණු අපේ ගරු ජයසේන රාජකරුණා මැතිතුමා වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම එතුමා ගැන සඳහන් කරන කොට පසු ගිය කාලයේ අපේ දේශපාලන ඉතිහාසයේ හිටපු ඉතාම ශක්තිවන්ත මතයක් තිබිච්ච නායකයකු හැටියට තමයි මම එතුමාව හඳුන්වන්නේ. මොකද, එතුමාගේ ජීවිතයේ යම් කිසි තීන්දුවක් තීරණයක් ගත්තොත් ඒ තීන්දුව තීරණය වෙනස් නොකරන නායකයකු විධියට එතුමාව හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන් එතුමා ගුරුවරයකු හැටියට සේවය කරමින් නීති විද්‍යාලයේ විභාගයට ලියලා එයින් සමත් වෙලා, ගුරු වෘත්තිය අත හැරලා නීතිඥයකු විධියට එතුමා වැඩ කරන කොට නීතිඥ වෘත්තිය වෙනුවෙන් සම්පූර්ණයෙන් කැප වුණා. කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ හා විශේෂයෙන්ම දිස්ත්‍රික් අධිකරණයේ සේවය කරලා එතුමා සිවිල් නඩු සම්බන්ධව ඉතාම දක්ෂ, පරිණත නීතිඥයකු බවට පත් වුණා.

ඒ විතරක් නොවෙයි, ඒ ප්‍රදේශයේ ජනතාව අසාධාරණයට ලක් වුණු කරුණු කාරණාවලදී එතුමා දිගින් දිගටම තමන්ගේ මතයේ සිටිමින් ඔවුන් වෙනුවෙන් පෙනී සිටියා.

1982දී එතුමා පඩුවස්නුවර ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා විධියට වැඩ භාර ගත්තා. අපේ ශාන්ත බණ්ඩාර මැතිතුමා කිව්වා වාගේ ඊට පෙර එතුමා බිංගිරිය ගම් කාර්ය සභාවේ ප්‍රථම සභාපතිවරයා විධියට පත් වුණා. එතැන ඉඳලා බිංගිරිය ප්‍රදේශයේ, පඩුවස්නුවර ප්‍රදේශයේ විතරක් නොවෙයි, කුලියාපිටිය අවට ප්‍රදේශවල එතුමාගේ තිබුණු නෑදෑ සම්බන්ධකම් පාවිච්චි කරලා 1989 මැතිවරණයට ඉදිරිපත් වෙලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට එතුමා පාර්ලිමේන්තුවට ආවා.

මම පසු ගිය කාලයේ එතුමා සම්බන්ධයෙන් දැකපු විශේෂ කාරණයක් තිබෙනවා. එනම් එතුමා ජනවාර්ගික අර්බුදය සම්බන්ධව ඉතාම දැඩි මතයක හිටපු කෙනෙක්. 1994 දී බලයට පත් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාල වකවානුව "සුදු නෙළුම්" ව්‍යාපාරය සහ "තවලම" ව්‍යාපාරය ලංකාව වටේම ක්‍රියාත්මක කරපු කාල වකවානුවක්. එතුමා කිව්වා කිසි වෙලාවක උතුරු නැඟෙනහිර එකතු කරන්න බැහැ කියලා. බලය බෙදීමට එතුමා කිසිම වෙලාවක කැමැති වුණේ නැහැ. ඒ වෙනුවෙන් ඇති කරපු package එක සම්බන්ධව එතුමා දැඩි විරෝධතාවක සිටියා. මට මතකයි, ඒ කාලයේ අපි ඔක්කොම එකට එකතු වෙලා සංවිධානය කරපු "සුදු නෙළුම්" ව්‍යාපාරයේ තිබුණු රැස්වීමේදී මම package එකට පක්ෂව කථා කළා, එතුමා මන්ත්‍රීවරයා විධියට package එකට විරුද්ධව කථා කළා. ඒ දෘඪභාවය, නැත්නම් යම් කිසි තීන්දුවක් ගත්තොත් වෙනස් නොකරන ස්වභාවය එතුමාගේ චරිතයේ දක්නට තිබුණු විශේෂ ලක්ෂණයක්. එතුමා දැඩි ලෙස විශ්වාස කරපු කාරණයක් තමයි ඒ ගිවිසුමෙන් නැත්නම්, ඒ package එකෙන් දැවැන්ත අර්බුදයක් රට තුළ සිදු වෙයි කියන එක. ඒ නිසා ඒකට එතුමාගේ දැඩි විරෝධතාව ප්‍රකාශ කෙරුවා විතරක් නොවෙයි, කිසිදු භයකින් සැකයකින් තොරව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියටත් එතුමා ඒක ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරලා තිබුණා. එතුමා පක්ෂය ඇතුළේත්, දිස්ත්‍රික්කය ඇතුළේත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් විධියට ඒ වාගේ වැඩ කළා.

1989 හිටපු මන්ත්‍රීවරුන් අතරින් බොහොම ස්වල්ප පිරිසක් පමණයි 1994 දී පාර්ලිමේන්තුවට ඇවිල්ලා හිටියේ. නමුත් එතුමාට ඇමතිකමක් තියා නියෝජ්‍ය ඇමතිකමක්වත් ලැබුණේ නැහැ. ඒ වෙනුවෙන් ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරිය ළඟට ගිහිල්ලා "මට මෙන්න මේක අවශ්‍යයි" කියලා දණින් වැටෙන තැනට එතුමා පත් වුණේ නැහැ. එතුමා තමන්ට ලැබුණු මන්ත්‍රීකම පාවිච්චි කරලා ආණ්ඩුවේ සංවර්ධන වැඩ කටයුතු ටික ගමට ගෙනැල්ලා තමන්ට ඡන්දය දුන් ගමේ අහිංසක දුප්පත් මිනිස්සු වෙනුවෙන් මහා දැවැන්ත සේවාවක් කළා. දිස්ත්‍රික්කයේ ආසන ගණනාවක සංවර්ධනය සඳහා තමන්ට ලැබුණු විමධ්‍යගත අරමුදල් ලබා දුන්නා විතරක් නොවෙයි, තමන්ගේ දායකත්වයත් එතුමා ලබා දුන්නා. සාධාරණ හැම කාරණයකදීම තමන්ගේ මතය වෙනුවෙන් දැඩි ලෙස පෙනී හිටපු කෙනෙක් විධියට එතුමාට මම ගෞරව කරන්න කැමැතියි.

විශේෂයෙන් මේ කාලයේ අපි දකිනවා, ජනාධිපතිවරු ළඟට ගිහිල්ලා වැඳ වැටිලා ඇමතිකම් ගන්නා මන්ත්‍රීවරු, ජනාධිපතිවරු ළඟට ගිහිල්ලා වැඳ වැටිලා නියෝජ්‍ය ඇමතිකම් ගන්නා මන්ත්‍රීවරු. ඒ මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් දෙන්න පුළුවන් නායකයෙක් විධියටත්, තමන්ගේ කොන්ද කෙළින් තියා ගෙන තමන්ට ජනතාව ලබා දුන් මන්ත්‍රී ධුරය කවුරුවත් ඉදිරියේ පාවා නුදුන්න දැවැන්ත නායකයෙක් විධියටත් එතුමාව හඳුන්වන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. මම විශේෂයෙන් කියන්න කැමැතියි, 1994න් පස්සේ තමන්ගේ මන්ත්‍රී ධුරය තිබෙන කොට තමන්ගේ ආසන සංවිධායක ධුරය අත හැරලා ඒක පළාත් සභා මන්ත්‍රී ධර්මසිරි දසනායක මැතිතුමාට පවරා අනාගත නායකයෝ බිහි කරන්න අවශ්‍ය කරන ශක්තිය ලබා දෙමින් පඩුවස්නුවර ආසනයේ තවත් නායකයෙක් හදන්න ඕනෑ කියන තැන ඉඳ ගෙන එතුමා කටයුතු කළ බව. එතුමා ඒ කරපු කාර්ය භාරය නිසා අදත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයා විධියට, නැත්නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා විධියට ගොඩ නැඟෙන්න ධර්මසිරි දසනායක මැතිතුමාට අවස්ථාව ලැබුණා නම් ලැබුණේ, තමන්ගේ පුටුව දීලා ගිය ඒ වාගේ නායකයෙක් හිටපු නිසායි. ඒ ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ කාලය අවසන් වෙන්න කලින් තව නායකයන් හදන්න කටයුතු කරලා ගිය නායකයකු වූ එතුමාට මම විශේෂයෙන් ගරු කරනවා. මා මෙතැනදී විශේෂයෙන්ම කියන්න කැමැතියි අර මා කලින් කිව්වා වාගේ පැත්ත ගියත් ඇත්ත කියන නායකයකු විධියට ජයසේන රාජකරුණා මැතිතුමා තමන්ගේ ජනතාවට සේවය කළාය කියන එක.

එතුමාගේ ආදරණීය බිරිඳ වන මල්ලිකා ගුණතිලක මැතිනිය අප ඉතාම ආදරය කරන, බොහොම ගරු කරන කාන්තාවක්. එතුමිය ගරු රාජකරුණා මන්ත්‍රීතුමා පිටුපස හිටපු දැවැන්තම ශක්තියයි. ගරු ජයසේන රාජකරුණා මැතිතුමා තම දරුවන් විධියට ඉතාම ආදරයෙන් සැලකූ කීප දෙනෙක් ඉන්නවා. එතුමා තමන්ගේ අක්කාගේ දියණියන් තමයි දරුවන් විධියට සලකලා ශක්තිමත්ව හදා ගත්තේ. ඔවුන්ට දෙන්න තිබෙන උපරිම ශක්තිය, ධෛර්යය එතුමා දුන්නා. එතුමාගේ අවසන් කාලයේ ඒ සියලු දෙනා එකට එකතු වෙලා එතුමා වෙනුවෙන් කරපු ක්‍රියාකාරකම් ටික, එහෙම නැත්නම් එතුමා වෙනුවෙන් කරපු කළගුණ සැලකීම මා නැවතත් ගෞරවයෙන් සිහිපත් කරමින්, ගරු ජයසේන රාජකරුණා මැතිතුමාට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.25 ]

**ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickremasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 80 දශකයේ අග භාගයේත්, ඒ වාගේම 90 දශකයේත් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරපු ඉතාම යුක්තිගරුක, ජනතාවාදී නායකයකු පිළිබඳ ශෝක ප්‍රකාශයක් ඉදිරිපත් කරන්න ලැබීම පිළිබඳව මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ආඩම්බර වෙනවා. අපේ ගරු ජයසේන රාජකරුණා හිටපු මන්ත්‍රීතුමා පිළිබඳව කථා කරන විට විශේෂයෙන්ම මහත්මා දේශපාලනය බොහොම ඉහළින් ආරක්ෂා කරපු නායකයකු බව සඳහන් කරන්න අවශ්‍ය වෙනවා. 1989 දී තමයි එතුමා පළමුවැනි වතාවට පාර්ලිමේන්තුවට අවතීර්ණ වුණේ. අපේ බොහෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහන් කළ ආකාරයට ඊට පෙර බිංගිරිය ගම් කාර්ය සභාවෙන් තමයි එතුමා දේශපාලනයට අවතීර්ණ වුණේ. එතුමා ඉංග්‍රීසි ගුරුවරයෙක්. ඉන් පසුව එතුමා නීතිවේදී උපාධිය ලබා ගෙන දීර්ඝ කාලයක් -මා හිතන්නේ අවුරුදු 40කට ආසන්න කාලයක්- කුලියාපිටිය අධිකරණයේ නීතිඥයකු හැටියට කටයුතු කළා. එතුමා ඉඩම් නඩු පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වපු කෙනෙක්. එතුමා දේශපාලනය කරපු අවධියේ වුවද උසාවියට යැමට අමතක කළේ නැහැ. දේශපාලනය කරන විටත් -මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරන අවස්ථාවේ වුවද- උසාවියට ගිහිල්ලා තමා අවුරුදු ගණනක් කරපු කාර්යය ඒ ජනතාව වෙනුවෙන් ඉටු කරන්න එතුමා කටයුතු කළා. හිටපු ගරු මන්ත්‍රී ජයසේන රාජකරුණා මන්ත්‍රීතුමා විශේෂයෙන්ම මගේ දිවංගත පියා සමඟත් බොහොම කිට්ටුවෙන් ඉතාම කුලුපගව ආශ්‍රය කරපු දේශපාලනඥයකු වූ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

අපේ දිස්ත්‍රික්කයේ හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට ජයසේන රාජකරුණා මැතිතුමා අප පළාත් සභාව නියෝජනය කරපු අවස්ථාවලදී අපත් සමඟ බෙහෙවින් සහසම්බන්ධ වෙලා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් අපට ලොකු ශක්තියක් වුණාය කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. බොහොම උගත් දේශපාලනඥයකු හැටියට අපේ අනෙකුත් දේශපාලනඥයන්ටත් ලොකු ආදර්ශයක් ගෙන දෙමින් කටයුතු කරපු මන්ත්‍රීවරයකු ලෙස අපේ ගරු ජයසේන රාජකාරුණා මන්ත්‍රීතුමා හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම පඩුවස්නුවර මැතිවරණ බල ප්‍රදේශයේ අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට එතුමා විශාල කාර්ය භාරයක් කළා. එතුමා ඒ සංවිධායක ධුරය දරපු කාලය තුළ පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් විශාල සංවර්ධනයක් කළාය කියන එක මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ ගුණ කථනයක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා අද අප අතර නැති වුණත් එතුමාගේ නාමය පඩුවස්නුවර ජනතාව අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව තුළ තවමත් තිබෙනවා කියන එක මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කර දෙමින් අපේ ගරු ජයසේන රාජකරුණා හිටපු මන්ත්‍රීතුමාට නිවන් සුව අත් වේවා කියන ප්‍රාර්ථනය ඇතිව මගේ මේ කෙටි අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.29 ]

**ගරු කමලා රණතුංග මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැරණිම සාමාජිකාවක වශයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, දීර්ඝ කාලයක් අපිත් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උන්නතිය වෙනුවෙන්, ඒ වාගේම මහ ජනතාව වෙනුවෙන් උදාර සේවාවක් කළා යැයි හිතට එකඟව මේ උත්තරීතර සභාවේ ප්‍රකාශ කරන්න පුළුවන් මහත්මා ගති ඇති දේශපාලනඥයෙකු පිළිබඳව කථා කරන්නට මට අවස්ථාවක් ලබා දීම ගැන.

සත් කෝරළයේ පඩුවස්නුවර නම් වූ ඓතිහාසික පින් බිමේ දහනැක්ගෙදර නම් වූ සුන්දර ගම්මානයේදී 1927 මාර්තු මස 27වැනි දා උපත ලැබූ ගරු ජයසේන රාජකරුණා මහතා පාඨශාලාචාර්ය ආර්.එම්. පුංචිසිංඤෝ මහතාගේ සහ කේ.එම්. පොඩි නෝනා මහත්මියගේ පුත්‍ර රත්නයක්. මෙතුමාට සහෝදරියන් පස් දෙනෙකුත් එක් සහෝදරයෙකුත් හිටියා. මෙතුමා මූලික අධ්‍යාපනය ලබා ඇත්තේ ගමේ පාසලෙන්. එනම් දහනැක්ගෙදර මහා විද්‍යාලයෙන්. මේ ගරු සභාවේදී ගුණ කථන කළ සියලුම මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ පරිදි කුරුණෑගල මලියදේව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා ඇති මෙතුමා එම විද්‍යාලයේ කැපී පෙනෙන දක්ෂ ශිෂ්‍යයෙක් බවට පත් වෙලා තියෙනවා. පසුව ඉංග්‍රීසි ගුරුවරයෙක් වශයෙන් කුලියාපිටිය මහා විද්‍යාලයෙන් ගුරු වෘත්තියට පිවිසි මෙතුමා ශිෂ්‍යයන්ගේ වාගේම ආචාර්ය මණ්ඩලයේත්, දෙමව්පියන්ගේත් ජනාදරයට සහ ගෞරවයට පාත්‍ර වෙච්ච ආදර්ශවත් ගුරු පියෙක් වෙලා ඉඳලා තියෙනවා.

1959 වසරේදී නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දුන් මෙතුමා 1960 දශකයේදී බිංගිරියේ ලාබාලම ගම් සභාපතිවරයා වශයෙන් පත් වෙලා තිබෙනවා. එතුමා ජනතාවට නීතිඥයෙකු වශයෙන් ඉතාමත්ම සමීපව ජනප්‍රියත්වයට පත් වුණාට පස්සේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අතින් එතුමියගේ රොස්මිඩ් පෙදෙසේ පිහිටි නිවසේදී පඩුවස්නුවර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය ලබා ගත්ත දවස මට මතකයි. එදා සිටයි එතුමා මා දැන හැඳින ගත්තේ. එතුමාගේ සියලු මැතිවරණ කටයුතුවලදී වාගේම පඩුවස්නුවර සංවිධාන කටයුතුවලදී මට දායක වන්නට අවස්ථාව ලැබුණා. එතුමාගේ නිවසට මම ගිහින් තිබෙනවා. එතුමාගේ සම්මන්ත්‍රණවලට සහභාගි වෙලා තිබෙනවා; එතුමාගේ රැස්වීම්වලට සහභාගි වෙලා තිබෙනවා. ඉතාම දුෂ්කර ගම්බද ප්‍රදේශයක් වුණත් ඒ සියලුම සම්මන්ත්‍රණවලට, රැස්වීම්වලට විශාල ජනකායක් එදා එතුමාට එකතු කර ගන්නට පුළුවන්කම ලැබුණා. හිතට එකඟව තම අදහස් ප්‍රකාශ කරන අවංක දේශපාලනඥයෙක් ලෙසයි මා එතුමා හඳුනා ගෙන තිබෙන්නේ.

[ගරු කමලා රණතුංග මෙනෙවිය]

මේ අවස්ථාවේදී ගුණ කථනය කරපු දයාසිරි ජයසේකර මැතිතුමා විරුද්ධ පක්ෂයේ හිටියත් එදා එතුමා අපිත් එක්ක හිටියේ. එතුමා ප්‍රකාශ කරන්න යෙදුණා, ගරු ජයසේන රාජකරුණා මැතිතුමා හිතට එකඟව, අවංකව තම අදහස් ප්‍රකාශ කරපු දේශපාලනඥයෙක් කියලා. ඇත්තටම දේශපාලන ලෝකයේ හුඟක් අය අනික් කෙනා පාවා දී හෝ තමන්ගේ තනතුර රැක ගන්න තමයි කටයුතු කරන්නේ. අනික් කෙනා එළවා දමා හෝ මොනවා හරි දේකින් තමන්ගේ තැන රැක ගන්න තමයි බොහෝ දේශපාලනඥයෝ කටයුතු කරන්නේ. නමුත් ගරු ජයසේන රාජකරුණා මැතිතුමා ඉතාම අවංකව, හිතට එකඟව, නිර්භීතව අදහස් ප්‍රකාශ කර තමන්ගේ මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වෙන්නට තරම් අවංක වෙච්ච නායකයෙක් හැටියටයි අපට එතුමා ගැන මේ උත්තරීතර සභාවේදී ප්‍රකාශ කරන්නට පුළුවන්කම තිබෙන්නේ.

එතුමා කෘෂි කර්මය කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වූවා. පඬුවස්නුවර ප්‍රදේශයේ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරන්න විශාල දායකත්වයක් එතුමාගෙන් ලැබුණා වාගේම අන්ධකාරයේ තිබුණු ගම්මානවලට ආලෝකය ලබා දෙන්න විශාල විදුලි ව්‍යාපෘති එතුමා ආරම්භ කළා. එපමණක් නොවෙයි, එතුමා තමයි ඇපලදෙණිය බුලත් පොළ ආරම්භ කළේ. බුලත් වගාව කරපු ජනතාවට ඒකෙන් විශාල සෙතක් ලැබුණා. අද වාගේ නොවෙයි, එදා මාර්ග පහසුකම් තිබුණේ නැහැ. අද නම් හම්බන්තොටට ගියත්, යාපනයට ගියත්, වව්නියාවට ගියත්, කොහේට ගියත් මාර්ග ඉදි වෙලා තිබෙනවා; පහසුකම් සලසා තිබෙනවා; පාලම්, බෝක්කු ප්‍රතිසංස්කරණය වෙලා තිබෙනවා; මං මාවත් ලස්සන වෙලා තිබෙනවා. එදා පඬුවස්නුවර ප්‍රදේශයේ මාර්ග ඉදි කරන්නට විශාල වෙහෙසක් දැරුවා වාගේම ග්‍රාමීය රෝහලක්ව තිබුණු හෙට්ටිපොල රෝහල දිසා රෝහලක් බවට පරිවර්තනය කරන්නත් එතුමාට පුළුවන්කම ලැබුණා.

එතුමා ජාති හිතෛෂියෙක්. ජාතියට ආදරය කළ, මවු බිමට ආදරය කළ නායකයෙක්. මම මුලින් කිව්වා වාගේ කවුරු කොහොම කිව්වත්, හිතුවත් එතුමා හැම වෙලාවකම හදවතට එකඟව අදහස් ප්‍රකාශ කරපු නායකයෙක්. එතුමා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විශාල ශක්තියක් වුණා; ධෛර්යක් වුණා. එදා භීෂණ සමයේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට නොයෙක් අතවර, අවහිර සිද්ධ වන වෙලාවේ එතුමා නීතිඥවරයකු හැටියට ඒ අය ආරක්ෂා කරන්නට පරිත්‍යාගශීලිව කැප වෙලා කටයුතු කළා. එදා නිරන්තරයෙන්ම අභියෝගවලට මුහුණ දුන් පාක්ෂිකයන් වෙනුවෙන් පෙනී සිටිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නායකයන් අතුරින් එතුමා ප්‍රමුඛස්ථානයක් ගත්තා කිව්වොත් මම හිතන හැටියට කවුරුත් ඒකට විරුද්ධ වන්නේ නැහැ.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ජයසේන රාජකරුණා මැතිතුමා ආදර්ශවත් දේශපාලනඥයෙක් වාගේම මම මුලින් ප්‍රකාශ කළ පරිදි අවංක නායකයෙක්; ජනතා ආදරයට පාත්‍ර වෙච්ච නායකයෙක්. එතුමාගේ අභාවය පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් කාන්තා සංවිධානයේ සාතිශය ශෝකයත්, පෞද්ගලිකව මගේ ශෝකයත් පවුලේ සියලු දෙනාටම පිළිගන්වමින්, බෞද්ධයන් වශයෙන් අපි ප්‍රාර්ථනය කරන අමා මහ නිවන් සුව එතුමාට අත් වේවායි ප්‍රාර්ථනය කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයසේන රාජකරුණා මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මමද ඒ සමඟ එකතු වෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම විධාන කරමි.

## ශෝක ප්‍රකාශය: ගරු ධනපාල වීරසේකර මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஜே.டீ. வீரசேகர
## VOTE OF CONDOLENCE: HON. DHANAPALA WEERASEKERA

[අ. භා. 3.37]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

සබරගමු පළාතේ, රත්නපුර සහ දෙහිඕවිට මැතිවරණ කොට්ඨාසවල පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව දශක දෙකක පමණ කාලයක් තිස්සේ හොබවන ලද කීර්තිමත් දේශපාලනඥයකු වූ ධනපාල වීරසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිත් කරමි.

රත්නපුර, පැල්මඩුල්ලේ විසූ ටිකිරි බණ්ඩාර වීරසේකර රටේ මහත්මයාගේත්, රොස්ලින් කුමාරිහාමි මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙස 1924 මැයි මස 26 වැනි දින ධනපාල පිලිප් රනිල් වීරසේකර මහතා මෙලොව උපත ලැබුවේය. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද වීරසේකර මහතා ඉන් අනතුරුව 1952 දී කොළඹ කෞතුකාගාරයේ සේවයට බැඳී වසර දෙකකට පසු ඉන් ඉවත්ව තමන්ගේම ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කොට, සුරතල් මසුන් හා පැළෑටි වර්ග සැපයීමේ කර්මාන්තයක නිරත විය.

ජොයිස් වීරසේකර මහත්මිය සමඟින් විවාහ ජීවිතය ගත කළ එතුමා එම විවාහය තුළින් රමණී ලියනගේ, රුවනි රත්නායක, සහ රුක්මලී කුෂාන්ති වීරසේකර නමින් දියණියන් තිදෙනෙක් මෙලොවට දායාද කළේය. එක්සත් ජාතික පක්ෂය තුළින් දේශපාලනය වෙත යොමු වී එම පක්ෂයේ තරුණ සංගමයේ සම ලේකම්වරයකු වශයෙන් කටයුතු කළ එතුමා පසු කලෙක නීති විද්‍යාලයට පිවිස නීතිය හදාරන ලද අතර, නීතිඥ උපාධිය ලැබීමෙන් පසු එම වෘත්තියේද නියැළුණේය.

1960 වර්ෂයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා සම්බන්ධ වූ වීරසේකර මහතා දෙහිවල, හත්බෝධිය කොට්ඨාසයේ නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් ක්‍රියාකාරී දේශපාලනයට අවතීර්ණ විය. අනතුරුව ජූලි මස පැවති මහ මැතිවරණයට රත්නපුර ආසනයෙන් ඉදිරිපත්ව සුවිශේෂී ජයග්‍රහණයක් ලබා ගනිමින් ප්‍රථම වතාවට මෙම උත්තරීතර සභාවට පැමිණ මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගත්තේය. සමස්ත ලංකා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂික තරුණ සංගමයේ ලේකම් සහ පක්ෂ ශාඛාවේ සභාපති වශයෙන්ද කටයුතු

කරමින් ප්‍රදේශයේ අභිවෘද්ධිය වෙනුවෙන් විශාල කාර්යභාරයක නියැළුණු එතුමා 1961 වර්ෂයේදී විලී රටේ පවත්වන ලද ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේදී ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා, පීටර් කේනමන් වැනි ප්‍රවීණ දේශපාලනඥයන් සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් පවත්වාගෙන ගිය ගරු වීරසේකර මහතා සමාජවාදී මතවාද ඔස්සේ යමින් 1963 දී ලංකා සමසමාජ පක්ෂයට බැඳුණේය. 1965 පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට එම පක්ෂය යටතේ දෙහිඕවිට ඡන්ද කොට්ඨාසයෙන් තරග වැදුණු ගරු වීරසේකර මහතා යළිත් වරක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් විය. 1970 මහ මැතිවරණයේදීත් දෙහිඕවිට ආසනයෙන් ලංකා සමසමාජ පක්ෂය යටතේ තරග කොට ජයග්‍රහණය අත් පත් කර ගත් එතුමා තුන් වැනි වතාවටත් මෙම සභාවේ අසුන් ගැනීමේ භාග්‍යය හිමි කර ගත්තේ තමන් තුළ පැවැති අවංක හා නිහතමානී භාවයත්, අනුගමනය කළ මහත්මා දේශපාලනයත් හේතුවෙනි.

එවක බලයට පැමිණි සමඟි පෙරමුණු රජයේ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් වූ එතුමා එම කාලය තුළ තමන්ට පැවරුණු රාජකාරිය ඉහළින්ම ඉටු කිරීමට වග බලාගත්තේය. මන්ත්‍රීවරයකු හා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කරමින් තම ප්‍රදේශයේ පවත්නා අඩු පාඩුකම් පිළිබඳ සොයා බලමින් ඔවුනට පිහිට වීමට නිබඳවම කැප වුණු එතුමා සෞඛ්‍ය, නිවාස, ගමනාගමන හා අධ්‍යාපන ආදී විවිධ අවශ්‍යතාවන් තම ඡන්ද දායකයන් වෙනුවෙන් ඉටු කර දීමට දැඩි ප්‍රයත්නයක යෙදුණේය.

ධනපාල වීරසේකර යනු පරිසරයට අතිශයින්ම ආදරය කළ පරිසර හිතකාමියෙකි. එතුමා ඒ වෙනුවෙන් ශ්‍රමයෙන් හා බුද්ධියෙන් අවංකවම කැප වූ උදාර පුද්ගලයකු වූ නිසාම වරෙක සමුද්‍ර දූෂණ අධිකාරියේ සභාපතිවරයා වශයෙන්ද පත් වූ අතර, ජීවිතයේ අවසාන භාගය දක්වාම විසිතුරු මල් වවන්නන්ගේ සංගමයේ සභාපති ධුරයද දැරුවේය. දිවයිනේ බෙහෙවින් ප්‍රචලිතව පවත්නා "ලක්මල්සල" නිර්මාතෘවරයාද වූ ගරු වීරසේකර මහතා පරිසර හිතකාමීන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන මල් වගාව සහ පරිසරය සම්බන්ධ කර ගනිමින් පොත් රැසක්ද ලියා පළ කළේය.

"ලස්සනගම ෆාම්" ව්‍යාපෘතියේ ප්‍රාරම්භක සභාපති ලෙස කටයුතු කළ එතුමා ප්‍රදේශයේ සමාජ සේවා කාර්යයන් රැසක පෙරමුණ ගෙන ක්‍රියා කළේය. පොදු ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කෙරෙන කවර අන්දමේ කාර්යයකදී වුවද තම සහයෝගය නොමඳවම ලබා දුන් මෙම උදාර පුද්ගලයා ආගමික පුනරුදය සඳහාද තම දායකත්වය නිබඳවම ලබා දුන්නේය.

විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ජනතා හදවතට ළං වෙමින්, ප්‍රදේශයේ ජනතාව හා උරෙනුර ගැටෙමින් ඔවුන්ගේ සිත්සතන් තුළ ජීවත් වූ මානව හිතවාදියකු වූ ගරු ධනපාල පිලිප් රනිල් වීරසේකර නම් වූ යුග පුරුෂයා වසර 87ක් ආයු වළඳා ප්‍රජාතන්ත්‍රවාදය අගයන සුවහසක් ජනතාවගේ හදවත්වලට වේදනාවක් ගෙන දෙමින් 2011 පෙබරවාරි මස 25 වැනි දින මෙලොවින් සදහටම සමු ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම උත්තරීතර සභාවේ රත්නපුර සහ දෙහිඕවිට මැතිවරණ කොට්ඨාස නියෝජනය කරමින් වසර ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ද පාර්ලිමේන්තු හා ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් ද කටයුතු කළ නීතිඥ ධනපාල වීරසේකර මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම සභාවේ ශෝකය එතුමාගේ දයාබර දියණියන් වූ රමණි, රුවනි සහ රුක්මලී යන අය ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කර සිටිමි.

[අ. භා. 3.43 ]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ධනපාල වීරසේකර නම් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ නියෝජ්‍ය ඇමතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂය ඇතුළු සමස්ත විපක්ෂය වෙනුවෙන් අපේ කනගාටුව මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. ගරු ධනපාල වීරසේකර මැතිතුමා අවුරුදු 16ක් අඛණ්ඩව මන්ත්‍රීවරයකු හැටියට මහජන සේවයේ යෙදුණු බව ගරු සභානායකතුමා ප්‍රකාශ කළා. මා දන්නා ගරු ධනපාල වීරසේකර මැතිතුමා බොහොම ප්‍රසිද්ධියක් දැරුවා ඕකිඩ් වගාව වෙනුවෙන්. ඒ කාලයේ විසිතුරු මල් වර්ග ගැන කථා කරන කොට එතුමා ගැන මුළු රට පුරාම විශාල ප්‍රසිද්ධියක් තිබුණා. දේශපාලන කටයුතුවලට අමතරව, සමාජ සේවයට අමතරව, පරිසරය වර්ධනය කිරීම පිළිබඳව, පරිසරය දියුණු කිරීම පිළිබඳව, මේ ශ්‍රී ලංකාවේ මල් වගාව පිළිබඳව එතුමා විශාල ප්‍රසිද්ධියක් දැරුවා.

එතුමා නීතිඥවරයකු හැටියටත් කාලාන්තරයක් කටයුතු කර තිබෙනවා. ඊට පසුව දේශපාලනයට පිවිසුණා. එතුමා පක්ෂ කිහිපයකම නියෝජිතකම දැරුවා. එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ඉඳලා අවසානයේ සම සමාජ පක්ෂයට ආවා. ඒ නිසා වකවානුවෙන් වකවානුවට අවශ්‍යතාවන් අනුව, ප්‍රතිපත්ති අනුව දේශපාලනය හැඩගස්වා ගත් යුග පුරුෂයකු හැටියට තමයි අපි අද එතුමා ගැන කථා කරන්නේ.

මම මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්න යන්නේ නැහැ. සම සමාජ පක්ෂයේ නායකයකු හැටියට එතුමා පිළිබඳව දීර්ඝ කථාවක් කරන්නට ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා බොහොම සූදානමින් ඉන්නවා. ධනපාල වීරසේකර ශ්‍රීමතාණන්ගේ පවුලේ සියලු දෙනා අද මේ සභාවේ සිටිනවා. ඒ සියලු දෙනාටම අපේ විපක්ෂයේ කනගාටුව පිරිනමමින් මම නිහඬ වනවා. ස්තුතියි.

[අ. භා. 3.45]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම උත්තරීතර සභාව තුළ දශක දෙකකට ආසන්න කාලයක් රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ ආසන දෙකක් නියෝජනය කරමින් දීර්ඝකාලීන සේවාවක් ඉෂ්ට කිරීමට වාසනාව ලැබූ ධනපාල වීරසේකර මැතිතුමා පිළිබඳව කෙටි ගුණකථනයක් කිරීමට මා බලාපොරොත්තු වනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට 1960 ජූලි මැතිවරණයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ආසනයෙන් ජනතා සේවය සඳහා එතුමා මේ ගරු සභාවට තේරී පත් වුණා. 1963 - 64 වර්ෂයේ අයවැය ලේඛනයෙන් සුබසාධක සහන කපා හැරීමක් පිළිබඳව ඇති වූ ප්‍රතිපත්තිමය කාරණයක් මුල් කර ගෙන එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වී ලංකා සමසමාජ පක්ෂයට සම්බන්ධ වුණා. 1964 ඇති වූ සභාග ආණ්ඩුව බොහොම සුළු කලකින් මේ සභාව තුළ පරාජයට පත් වුණා. ඒ නිසා 1965 මැතිවරණයේ දී රත්නපුර ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නිතරගයෙන් ලැබුණ අතර, තමන්ට නුහුරු නුපුරුදු ප්‍රදේශයක් වන කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ආසනය තරග කිරීමට ලංකා සමසමාජ පක්ෂයෙන් එතුමාව තෝරා ගත්තා.

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

පාසල් ශිෂ්‍යයකු හැටියට මට එම අවස්ථාව මතකයි. කැගල්ලේදී නාම යෝජනා භාර දීලා එන අවස්ථාවේ දී යටියන්තොට ආසනය තරග කරන අපේක්ෂක විධියට නාම යෝජනා භාර දුන් ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාත්, රුවන්වැල්ල ආසනය සඳහා ඉදිරිපත් වුණු අතාවුද සෙනෙවිරත්න මැතිතුමාත්, දෙහිඕවිට ආසනය සඳහා ඉදිරිපත් වුණු ධනපාල වීරසේකර මැතිතුමාත් යන තිදෙනා රුවන්වැල්ල නගරයේදී පිළිගත් අවස්ථාවේ දී මා පිළිගත් අපේක්ෂකයා වුණේ ධනපාල වීරසේකර මැතිතුමායි. ඒ ප්‍රදේශයට අමුත්තකු වුවත් එම මැතිවරණයේදී එදා තිබුණ ශක්තිය උඩ ඉතාම තියුණු සටනකින් පස්සේ ඡන්ද අටසිය ගණනක් වැනි සුළු ගණනකින් හෝ දෙහිඕවිට ආසනය දිනා ගන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. රුවන්වැල්ල ආසනයටත් ආධුනික කෙනෙකු හැටියට ප්‍රදේශයට ඇවිල්ලා මාස ගණනක් තුළ මැතිවරණ ව්‍යාපාරය කරපු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා ඒ අවස්ථාවේදී ඡන්ද 417කින් පරාජයට පත් වුණා. ඒ අවස්ථාවේදී තුන් කෝරළයේ යටියන්තොටත්, දෙහිඕවිට ආසනයත් තමයි ලංකා සම සමාජ පක්ෂය ජයග්‍රහණය කළේ. දෙහිඕවිට ආසනය ඉතාම ජයග්‍රාහී ආසනයක්.

1947 සිට 1977 දක්වාම අපරාජිතව සමසමාජ පක්ෂයේ මන්ත්‍රීවරු නියෝජනය කරපු ආසනයක්. මේ ප්‍රදේශය නියෝජනය කරපු නවක මන්ත්‍රීවරුන් අතර ධනපාල වීරසේකර මැතිතුමාගේ නාමයට සුවිශේෂ තැනක් ලැබෙනවා. එතුමා 1973-74 කාලයේදී නැවතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා සමසමාජ බලකොටුවක් වශයෙන් තිබුණු තුන් කෝරළයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලපෑම ඇති කරන්නට පුරෝගාමී වූ පුද්ගලයකු හැටියට හඳුන්වන්නට පුළුවන්. අපට ඉතා බලවත් වෙහෙසක් දරමින් එම ප්‍රදේශයේ අපේ දේශපාලන ව්‍යාපාරය ගෙන යන්නට හැකි තත්ත්වයට පත් කළේ ධනපාල වීරසේකර මැතිතුමාය කියන එකත් මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ.

එතුමා ඉතාම ජනප්‍රිය මන්ත්‍රීවරයෙක්. මන්ත්‍රීවරුන් හැටියට අප කාටත් එතුමාගෙන් ගත හැකි ආදර්ශයක් තිබෙනවා. ජනතාවට ඕනෑ දේ තෝරා ගැනීමේ සහජ හැකියාවක් එතුමාට තිබුණා. එතුමා ගමකට ගියාම ඒ ගමට ඕනෑ කරන දේ මේකයි කියා ජනතාව කියන්න ඉස්සෙල්ලා එතුමා තේරුම් ගත්තා. අද දැරණියගල වශයෙන් හඳුන්වන, එදා දෙහිඕවිට ආසනය නමින් හැඳින්වූ ප්‍රදේශයේ ජනතාව අදත් ධනපාල වීරසේකර නාමයට ගරු කරන්නේ, එදා එතුමා එවැනි ඉතාම දුෂ්කර ප්‍රදේශවලට කළ සේවාව නිසායි.

එතුමා 1972 දී පමණ පාලමක්, දියපැන්නුමක් ඉදි කළා. නමුත් ඇතැම් අය එම නක්කාවිට පාලම මෝඩ පාලම වශයෙන් හැඳින්වූවා. මීට අවුරුදු දෙකකට පමණ පෙර අලුතින් පාලමක් හදන තුරු මාගල ප්‍රදේශයට, මාලිබොඩ ප්‍රදේශයට හා ශ්‍රී පාද අඩවිය දක්වා වූ දුෂ්කර ගම්වල ඉන්න ජනතාවට වාහනයකින් යන්න පුළුවන්කම ලැබුණේ එතුමා ඉදි කරපු ඒ නක්කාවිට පාලම නිසායි. එම සිද්ධිය නිසා ඒ ප්‍රදේශයට විශාල වෙනසක් ඇති වුණා. මේ එක කාර්යයක්.

ඊ ළඟට සමුපකාර ගම්මාන බිහි කළා. එදා ජනාවාස කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වෙලා, සමුපකාර ව්‍යාපාරය තුළින් "ලස්සණ" කියන නම ඇතුළත් කරමින්, "ලස්සණ මහ" ආදී වශයෙන් සමුපකාර ගම්මාන ඇති කළා. හැම කොට්ඨාසයකම වාගේ LRC එක පවරා ගත්ත ඉඩම්වල සමුපකාර ගම්මාන බිහි වුණා. දැරණියගල කොට්ඨාසයේත් -දෙහිඕවිට කොට්ඨාසයේ- සමුපකාර ගම්මාන කිහිපයක් එතුමා ඇති කළා. ඒ වාගේම ප්‍රථම වතාවට දැරණියගල කොට්ඨාසයට උප දිසාපති කාර්යාලයක් ලබා දුන්නා. බස් ඩිපෝවක්, බස් නැවතුම් පොළක් ආදී වශයෙන් ඒ ප්‍රදේශයට නොතිබුණු දේවල් ලබා දීමට එතුමා කටයුතු කළා. ඒ වාගේම පාසල්වලට ගොඩනැඟිලි ලබා දීම, විදුලිය ලබා දීම වැනි විශාල සේවාවක් 1970-1977 කාලය තුළදී එම ප්‍රදේශයට කිරීමට එතුමාට පුළුවන්කම ලැබුණා. අදත් එතුමාව සිහිපත් කරන්නේ එම නිසායි.

ඒ විතරක් නොවෙයි. මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. 1971 කැරැල්ල අවස්ථාවේදී බොහෝ තැන්වල අහිංසකයින් නිකරුණේ මැරුම් කෑමට ලක් වුණා. නමුත් දෙහිඕවිට කොට්ඨාසයේ දැරණියගල ප්‍රදේශයේ එකම එක තරුණ ජීවිතයක්වත් විනාශ වන්න නොදුන්නේ ධනපාල වීරසේකර මැතිතුමාගේ මැදිහත් වීම නිසායි. එම දිනවල එතුමා ආසනයෙන් පිට ගියේ නැහැ. පොලීසියත් එක්ක සම්බන්ධ වෙලා, ඒ අසරණයින් බේරා ගැනීමට එතුමා කටයුතු කළ ආකාරය එම ප්‍රදේශයේ ජනතාව අදත් සිහිපත් කරනවා. එම නිසා තුන් කෝරළ වාසියකු හැටියට මා මේ අවස්ථාවේදී එතුමා සිහිපත් කරනවා. මන්ත්‍රීවරයකු හැටියට එතුමා ඒ ප්‍රදේශයට කළ සේවය ඉතාමත් අගය කරනවා.

1967 දී මානියම්ගම සමසමාජ තරුණ සම්මේලනය සංවිධානය කිරීමේදීත් දෙහිඕවිට ආසනය නියෝජනය කරමින් එය සාර්ථක කිරීමට එතුමා විශාල වශයෙන් උර දී කටයුතු කළ බව මා මතක් කරන්න ඕනෑ. ඒ පිළිබඳව අපේ වාසුදේව නානායක්කාර මැතිතුමාටත් මතක් වනවා ඇති. අපේ ප්‍රදේශයට දියුණුවක් ලබා දීමට එතුමා ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කළා. ඒ වාගේම අදත් ඒ ප්‍රදේශය පුරා විහිදී තිබෙන ඇන්තූරියන් මල් දැක්කාම මතක් වන්නේ ධනපාල වීරසේකර මැතිතුමායි. විසිතුරු මල් හැටියට, ආදායම් උපයන ව්‍යාපෘතීන් හැටියට මල් වගාව කරන්න මේ රටට උගන්වපු කෙනකු හැටියටත් එතුමාව සිහිපත් කරමින්, එවැනි විශිෂ්ට සේවාවක් කළ ධනපාල වීරසේකර මැතිතුමාට නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ දියණිවරුන් ඇතුළු පවුලේ ඥාතීන්ට අපගේ ශෝකයත් එකතු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.53 ]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ, දැනට අප අතරින් වෙන් වී සිටින අපේ හිතවත් ධනපාල වීරසේකර හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ මට විශේෂ යුතුකමක් තිබෙනවා, අද මේ පාර්ලිමේන්තුවේදී එතුමා පිළිබඳව කථා කරන්න. මොකද, මා අද නියෝජනය කරන්නේ ඒ දැරණියගල මැතිවරණ කොට්ඨාසයයි. එය එතුමා නිර්මාණය කරපු මැතිවරණ කොට්ඨාසයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රගතිශීලී ජනතාවගේ අභිවෘද්ධිය සඳහා එතුමා ගෙන ගිය ඒ දේශපාලන ව්‍යාපාරය, එතුමා නිරන්තරයෙන් කැප වෙලා ඒ කරපු කටයුත්ත ගැන කල්පනා කරන කොට අද එතුමා ජීවතුන් අතර හිටියා නම් අනිවාර්යයෙන්ම එතුමා සතුටු වනවා මේ රට ගමන් කරන මාර්ගය දිහා බලලා. අද සියයට 8ක ආර්ථික වර්ධනයක් ලබා ගෙන තිබෙන රටක් මේ ශ්‍රී ලංකාව. අපි 1977 දී විවෘත ආර්ථික ක්‍රමය පටන් ගත්තාට පස්සේ සියයට 4ක, සියයට 3ක එහෙම නැත්නම් සියයට 4.5ක පමණ ආර්ථික වර්ධනයක් තිබුණු රටක්. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ අද දැවැන්ත ආර්ථික සංවර්ධනයකට මේ රට ගමන් කරනවා. පසු ගිය වර්ෂයේ අපේ ජාතික ආර්ථිකයේ වර්ධන වේගය සියයට 8යි.

මේ මුල් මාස 6 තුළත් ආර්ථිකයේ වර්ධන වේගය සියයට 8යි. අපි ඒ විධියේ දැවැන්ත ආර්ථික වර්ධනයක් ලබා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි අද භාණ්ඩ මිල ඉහළ යෑම යම් ආකාරයකට පාලනය කරලා උද්ධමනය අඩු කරන්න, එය තනි ඉලක්කමකට සීමා කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් අපේ ආනයන හා අපනයන වෙළෙඳාමේ අතිරික්තියක් ඇති කරලා ගෙවුම් ශේෂය වාසිදායක තත්ත්වයකට ගෙනෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ලංකාවේ ප්‍රථම වතාවට ගෙවුම් ශේෂය වාසිදායක තත්ත්වයකට ගෙනාවේ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා මුදල් ඇමතිවරයාව සිටිය, ගරු ධනපාල වීරසේකර මැතිතුමාගේ කාලයේ තමයි. ඊට පස්සේ පසු ගිය කාල පරිච්ඡේදය තුළ වරින් වර කිහිප වතාවක් එහෙම වුණා. නමුත් අද වන කොට ඒ තත්ත්වය ඉතාම සාර්ථක විධියට ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ ආර්ථික ප්‍රගතිය, මේ ප්‍රගමනය බලන්න ධනපාල වීරසේකර මැතිතුමා ජීවතුන් අතර සිටියා නම් කොයි තරම් අගනේද කියලා මට මේ අවස්ථාවේදී සිහි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ප්‍රතාපවත් නායකයෙක්. එතුමා යම් කිසි නීතිරීති මාලාවකට අනුව කටයුතු කළාට වඩා එතුමා තුළ තිබුණු ඒ ප්‍රතාපවත්භාවය, - his charismatic leadership - එතුමාට ආවේණික වූ ඒ උත්තුංග දේහය -උස මහතට සරිලන ශරීරයේ කඩවසම් පෙනුම- උපතින්ම එතුමා නායකයෙක් බවට අපි කාටත් පෙන්නුම් කළා. එතුමා දැරණියගල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන්න පටන් ගත්තාට පස්සේ 1970 දී දෙහිඕවිට මැතිවරණ කොට්ඨාසය යටතේ තරග කළා. එතුමා ඡන්ද විශාල ප්‍රමාණයක් ලබලා පාර්ලිමේන්තුවට ආවා.

ඒ ප්‍රදේශයේ තිබුණු දේශපාලන වාතාවරණය අනුව ලංකා සමසමාජ පක්ෂයෙන් තමයි එතුමා පාර්ලිමේන්තුවට ඇතුළු වුණේ. නමුත් 1974 වන කොට එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගෙන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් එක්ක කටයුතු කරන්න පටන් ගත්තා. ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා මුදල් ඇමතිවරයාව සිටිය කාලයේ මැණික් සංස්ථාව ආරම්භ කිරීමේදී එතුමා වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කළ මන්ත්‍රීවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා වුණා. ධනපාල වීරසේකර මැතිතුමාත් ඒ ආරම්භක අවස්ථාවේදී හිටියා කියන එක අපි අවිවාදයෙන් පිළිගත යුතු කාරණයක්. ඒ නිසා මෙන්න මෙවැනි නායකත්වයක්, නිර්මාණශීලී නායකත්වයක් එතුමාට තිබුණා. නායකත්වයන් ඕනෑ තරම් තිබෙනවා. නමුත් එතුමාට නිර්මාණශීලී නායකත්වයක් තිබුණා. භාර දුන්න වගකීම එතුමාට අකුරට ඉෂ්ට කරන්න පුළුවන්. එතුමාට දුර දැක්මක් තිබුණා. දුර දැකලා ඒ දැක්ම ක්‍රියාවකට පරිවර්තනය කරන්න, එහි ප්‍රායෝගික තත්ත්වය අත් හදා බලන්න ඒ හැකියාව, ශක්තිය එතුමාට තිබුණා.

අපි දන්නවා ඒ දවස්වල වතු ජනසතු කිරීම ක්‍රියාත්මක වුණු බව. ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් යටතේ තමයි මේ රටේ විශාල ඉඩම් තිබුණේ. අදත් දැරණියගල මැතිවරණ කොට්ඨාසය, මේ තුන් කොරළය ගත්තාම සමාගම්වලට යට වුණු තේ සහ රබර් වතු තමයි තිබෙන්නේ. මේවා රජයට පවරා ගත්තේ 1972 දී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට භාර වුණු ඒ ඉඩම් එදා පාලනය කරන්න යම් ආකාරයකට එතුමාගේ නායකත්වය උපකාරි වුණා.

ධනපාල වීරසේකර මහතාට දූවරු තිදෙනෙකු ඉන්නවා. ඒ පවුලේ සියලු දෙනාගේම දායකත්වයත් ලැබුණා එදා මේ කටයුතු එතුමාට සාර්ථක කර ගන්න. ඒ වාගේම එතුමාගේ ආදරණීය බෑනනුවන් වන උපාලි ලියනගේ මැතිතුමාත් දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ට කළා ඒක සාර්ථක කර ගන්න. අපේ ගරු වයි.ජී. පත්මසිරි මන්ත්‍රීතුමා මතක් කළා වාගේ එතුමාගේ වැඩ කටයුතු ගැන කියන්න කාලය ප්‍රමාණවත් නැහැ. එතුමා කරපු දේශපාලන කර්තව්‍ය විග්‍රහ කරන්න දීර්ඝ වෙලාවක් අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැරණියගල කියන්නේ දැනටත් කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබෙන දුෂ්කරම මැතිවරණ කොට්ඨාසයක්. එය විශාල තේ වතු සහ රබර් වතුවලින් ග්‍රහණය වුණු, දළු කඩන හා කිරි කපන කම්කරු පන්තියක් ජීවත් වන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය අද අළු ගසා දාලා නැඟිටිනවා. මම කියන්න කැමැතියි අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ උපදෙස් මත ඒ ප්‍රදේශයට විදුලිය සපයන බව. එදා ලාම්පු තෙල් බවුසර් 9ක් ගෙනාපු දැරණියගල මැතිවරණ කොට්ඨාසයට අද ගෙනෙන්නේ ලාම්පු තෙල් බවුසර් 2යි. ඒ තරම් විදුලිය සපයලා තිබෙනවා. තව මාස තුනකින් ඒ බවුසර් 2ත් ගෙන ඒම වළක්වන්න අද වැඩ කටයුතු සකස් කරලා තිබෙනවා. එවැනි දැවැන්ත සංවර්ධනයකට ඒ මැතිවරණ කොට්ඨාසය ගෙනැල්ලා තිබෙනවා. මේක දකින්න, ඒ අත්තිවාරම දැම්මේ, ඒ දේශපාලන පරිසරය නිර්මාණය කළේ ධනපාල වීරසේකර මැතිතුමායි. ඒ නිසා අපි දන්නවා එතුමාට සතුටෙන් එතුමාගේ ජීවිතයේ අවසන් දවස් කිහිපය ගත කරන්න පුළුවන්කම ලැබුණා කියලා.

එතුමාගේ ජීවිතයේ අවසාන දවසට සති දෙකකට තුනකට කලින් එතුමා මාත් සමඟ දැරණියගල මැතිවරණ කොට්ඨාසයේ සංචාරය කරලා විදුලිය ව්‍යාපෘති විවෘත කරලා පැරණි ගම් වැසියන් හම්බ වෙලා එතුමාගේ ඡන්දදායකයන් හිතවතුන් හම්බ වෙලා ඒ කාලය බොහොම සතුටින් ගත කළාය කියන එකත් මා මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. කලිනුත් මතක් කළා, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාත් මතක් කළා, "ලස්සනගම" ව්‍යාපෘතිය ගැන. මම දන්නේ නැහැ, ඒක එතුමා කොහොම නිර්මාණය කළාද කියලා. වතු ජනසතු කිරීමත් එක්ක, මේ රටේ යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සතුව තිබුණු ඉඩකඩම් 1972 දී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රජයට පවරා ගත්තාට පස්සේ ඒවා සංවර්ධනය කිරීමේ දැවැන්ත වුවමනාවක් එතුමාට තිබුණා. ඒ නිසා තමයි "ලස්සන ගම" කියන ව්‍යාපාරය බිහි වුණේ. මේ අවස්ථාවේ ඒ ගැන මතක් කරන්නට අවශ්‍යයි. ඒක දැවැන්ත ව්‍යාපාරයක්. ඒ වැව ගැනත් මතක් කරන්න ඕනෑ. අද ඒ වැව විනාශ වෙලා තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා පොරොන්දු වෙලා තිබෙනවා, ඒ වැව නිර්මාණය කරලා දෙන්න. එදා ඒ වැවෙන් සතියකට මිරිදිය මත්ස්‍යයන් ටොන් හතක් කොළඹ තිබුණු පොළට අරගෙන ආවා. ධනපාල වීරසේකර මැතිතුමා නායකත්වය දීලා ඒ වැවේ සතියකට මාළු ටොන් හතක් නිෂ්පාදනය කළා. ඒ වාගේ විශාල වැඩ කටයුත්තක් කරන්න එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි.

සත්ව නිෂ්පාදන පැත්තෙනුත් කුකුළු ගොවි පොළවල් රාශියක් ඇති කර තිබුණා. එදා 1977 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජයට පත් වුණාට පස්සේ එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය සමරන්න මේ "ලස්සන ගම" ගොවි පොළේ හිටපු කුකුල්ලු ලක්ෂ දෙකක් පැහැර ගෙන ගියා. එදා විනාශ කරපු ඒ ගොවි පොළ නැවත ගොඩ නගන්න බැරි වුණා. එහෙමයි එදා එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය සැමරුවේ. මේ රටේ ගැමි ජනතාවට නිර්මාණය කරපු ඔවුන්ගේ ජන ජීවිතය පෝෂණය කරපු ඒ ගොවි පොළ විනාශ කරලා දැම්මා. අද ඒක වල් බිහිවෙලා. ඒක නැවත නිර්මාණය කරන්න එතුමාගේ උනන්දුවක් තිබුණා. මාත් එක්ක එකතු වෙලා ඒ වැඩ කටයුතු කර ගන්න එතුමාට ලොකු ආශාවක් තිබුණා. අද ඒ කටයුත්තත් සාර්ථක වෙලා තිබෙනවා. නැවත සැරයක් ඒ වැව නිර්මාණය කරලා ඒ ගොවි පොළ නිර්මාණය කරන්න අපි දැන් වැඩ කටයුතු කර ගෙන යනවා.

අපේ පද්මසිරි මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැරණියගලට ලංකා ගමන ගමන මණ්ඩලයේ ඩිපෝවක් තිබුණේ නැහැ. ඒක දැරණියගලට ස්ථාපිත කළේ එතුමායි. බස් නැවතුම් පොළ හැදුවේ එතුමායි. එහි පාලමක් තිබුණා. මොකද, දැරණියගල ලස්සන දිය

[ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා]

ඇළි තියෙන පළාතක්. එහි කඳුහෙල් ගිරි ශිඛර ජල ධාරා රාශියක් තිබෙනවා. එය ලංකාවේ ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන පළාතක්. ඒ ප්‍රදේශයේ එක දිගට වැටෙන දිය ඇළි හතක් තිබෙනවා. ඒවායින් ගලා ගෙන යන ජලය පිරිසිදු ජලය. ඒ ප්‍රදේශය පිරිසිදු ජලය තිබෙන පළාතක්. දැන් ලංකාවේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේත් දැරණියගල ප්‍රදේශයටයි. ඉස්සර වැඩිම වර්ෂාපතනයක් ලැබුණේ වටවලට. අද ඒක වෙනස් වෙලා. භූ විෂමතා ලක්ෂණ නොවෙයි. දේශගුණය සහ කාල ගුණය වෙනස් වෙලා.

ඒ වෙනස්කම්වලට භාජනය වුණු සුන්දර පළාතක නායකයා හැටියට එතුමා කරපු කටයුතු ගැන අපි විශේෂයෙන් සතුටු වන්නේ කුමක් නිසාද, එතුමා සැබෑ ලෙසම ජනතාවට නායකත්වයක් දුන් නිසයි. එතුමා ජනතාවගේ ප්‍රශ්න හඳුනාගෙන තිබුණා. ජනතාවගේ වුවමනා එපාකම් හඳුනා ගෙන තිබුණා. පාලම් බෝක්කු හැදුවා විතරක් නොවෙයි. ගමනාගමන පහසුකම් ඇති කළා. රෝහල් හැදුවා. ඒ සියලු දේවල් නිර්මාණය කරන්න නිර්මාණශීලී දායකත්වයක් දෙන්න නායකත්වයක් දෙන්න එතුමාට ශක්තියක් හා ධෛර්යයක් තිබුණා.

මා මතක් කරපු නක්කවිට පාලමට එක්සත් ජාතික පක්ෂය ඒ කාලයේ කිව්වේ "ධනපාලගේ මෝඩ පාලම" කියලායි. අපි ඒ පාලම රීයේ පෙරේදා හදලා ඉවර කළා. දැන් එය නවීකරණය කර තිබෙනවා. එතෙක් ඒ ජනතාව පාවිච්චි කළේ ධනපාල මැතිතුමා නිර්මාණය කරපු පාලමයි කියන එක එතුමාට ගෞරවයක් හැටියට මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මේ දේශපාලන ක්‍රියා පටිපාටිය දිහා බැලුවාම නිරර්ථක විවේචන නිසා අනවශ්‍ය දේශපාලන උසිගැන්වීම් නිසා මේ රටේ ජන ජීවිතය අඩාල වෙනවා කියලා පෙනෙනවා. මෙන්න මේවා වළක්වා ගන්නට එතුමාගෙන් ආදර්ශයක් ගන්නට පුළුවන්. 1994 දී එතුමා නැවතත් දැරණියගල මැතිවරණ කොට්ඨාසයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළා. එතුමා සංවිධායකවරයා හැටියට සිටියා.

ජීවිතයේ එතුමාගේ සුන්දරම අත්දැකීම තමයි මල් වගාව. මෙතැන මතක් කළා, ඕකිඩ් වගාව ගැන. ඕකිඩ් වගාවෙන් සුන්දරත්වය වාගේම විදේශ විනිමය උපයන්නත් පුළුවන්ය කියලා මේ රටේ මතයක් ඇති කළේ මේ රටේ ජනතාව තුළ අදහසක් ඇති කළේ ධනපාල වීරසේකර මැතිතුමාය කිව්වොත් ඒකේ කිසි වරදක් නැහැ.

එතුමා කුරුල්ලන්ට හරියට ආදරේ කළා. එතුමා කුරුල්ලෝ විශාල වශයෙන් ඇති කළා. පිට රටවලින් -එංගලන්තයෙන්, යුරෝපයෙන්- පවා විවිධ වර්ගයේ කුරුල්ලන් මේ රටට ගෙනැල්ලා ඔවුන් බෝ කරලා ඉතාම සුන්දර අත් දැකීමක් එක්ක ජීවත් වෙච්ච කෙනෙක් හැටියට එතුමා ගැන සඳහන් කරන්න පුළුවන්. අපට එතුමා ගැන කියන්න හුඟක් දේවල් තිබෙනවා.

අධ්‍යාපනය පැත්තෙනුත් ඒ ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු නගා සිටුවන්න එතුමාගේ දායකත්වය දුන්නා. විශේෂයෙන් එතුමාගේ බෑණනුවන් වන උපාලි ලියනගේ මැතිතුමා එතුමාට මේ කටයුතු සම්බන්ධයෙන් දැවැන්ත නායකත්වයක් දුන්නා; දැවැන්ත සහයෝගයක් ලබා දුන්නා. ඒ නිසා එතුමාට දේශපාලන වශයෙන් බොහොම ප්‍රතාපවත් ශක්තියක් තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුන් කෝරළයේ බිහි කිරීමේ ප්‍රමුඛයා නැත්නම් ආරම්භකයා නැත්නම් නායකයා ධනපාල වීරසේකර මැතිතුමා බව අප සියලු දෙනාම අවිවාදයෙන් පිළිගන්නට ඕනෑ කාරණයක්. අද මම ඒ මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන්නේ එතුමාගෙන් ලද උරුමය නිසා බව මේ සභාවට මතක් කරන්නේ ඉතාමත් ගෞරවයෙන්. ඒ නිසා අප යන මේ දේශපාලන ගමන් මාර්ගයේ; මහින්ද චින්තනයත් එක්ක මේ යන වැඩ පිළිවෙළ තුළ මේ රට අද නිදහස් රටක් හැටියට මේ රටේ ජනතාව නිදහසේ ජීවත් වන රටක් හැටියට පමණක් නොවෙයි දැවැන්ත ආර්ථික සංවර්ධනයකට මේ රට ගමන් කරවන මොහොතක එතුමාගේ අභාවය අප සියලු දෙනාටම පාඩුවක්.

එතුමාගේ අභාවයට කලින් එතුමාගේ ආදරණීය බිරිඳ මෙලොව අත හැර ගියා. එතුමිය ජීවත් වුණු කාලයේ එතුමාත් සමඟ බොහොම සහයෝගයෙන් කටයුතු කළා. එතුමාගේ වැඩ කටයුතුවලට දායකත්වය දෙමින් ක්‍රියා කරපු එතුමාගේ ආදරණීය බිරිඳවත් මේ අවස්ථාවේදී අපි සිහිපත් කරන්නට ඕනෑ. පවුලේ සියලු දෙනාවම අපි සිහිපත් කළ යුතුව තිබෙනවා. දැවැන්ත දේශපාලන කාර්ය භාරයක් ඉෂ්ට කරපු, මේ අද තිබෙන -වර්තමාන- දේශපාලනයට පන්නරය ලබා දුන්නු නායකයකු අප අතරින් වෙන් වීම අපට ශෝකය දනවන කරුණක් බව මතක් කරන්න කැමැතියි.

ධනපාල වීරසේකර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේ දී අදහස් ප්‍රකාශ කිරීමට මටත් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින්, එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත අපගේ ශෝකය දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය සමාප්ත කරනවා.

[අ. භා. 4. 06]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මිත්‍ර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ධනපාල වීරසේකර මැතිතුමා පිළිබඳ ඉදිරිපත් කර තිබෙන ශෝක යෝජනාවට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් මමත් එකතු වීමට කල්පනා කරනවා.

ඇත්තටම එතුමා ඉතාමත්ම ඉහළම සමාජ තලයේ වැජඹුණු, ඉතාම පරසිදු ප්‍රභූ පවුලකින් පැවත එන කෙනෙක්. වීරසේකර රටේ මහත්මයා ගැන මෙතැනදී කියැවුණා. වීරසේකර රටේ මහත්මයාගේ පුත්‍රයෙක් හැටියට ධනපාල වීරසේකර මැතිතුමාට ඒ පළාත්වල තිබුණු ගෞරවය, සැලකීම, ප්‍රභූ තත්ත්වය එතුමා කිසි කලක තැකුවේ නැහැ. එතුමාට වුවමනා කළේ ඊට වඩා වෙනස් සමාජයක් හදන්නයි; දකින්නයි. මා හිතන්නේ හුරු පුරුද්දෙන්ම එතුමා මුල්ම කාලයේ -තරුණ කාලයේ- එක්සත් ජාතික පක්ෂයත් එක්ක සබඳතාවන් පැවැත්වුවා. නොබෝ කලකින්ම එතුමා තමන්ගේ ඒ හදවතේ තිබුණු ජනතා ව්‍යාපාරය කෙරෙහි, පොදු ජන ව්‍යාපාරය කෙරෙහි නැඹුරු වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙතට ගමන් කරන්නට පටන් ගත්තා. එතැනින් මන්ත්‍රීවරයකු බවට පත් වී, එතැනිනුත් එතුමා සමසමාජ පක්ෂය වෙතට ගමන් කරන්නට පටන් ගත්තා. මේ තමයි එතුමාගේ චරිතයේ හැටි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමාගේ පෙරළිකාරි චරිතය එහෙම මැද මාවතක සීමාවක් තුළ රඳවා නතර කරන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. පක්ෂ වශයෙන් ආපසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගියත්, එතුමාගේ රැඩිකල් මතවාදයන් එහෙමම තිබුණා.

සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීම, ජාතීන්ගේ සමඟිය උදෙසා ජාතීන්ට සමානත්වයෙන් සැලකීම, වතු ජනසතු කිරීම හා ජනසතු ව්‍යාපාර ප්‍රබල කිරීම යන මෙන්න මේ අදහස්වලින් එතුමාගේ සිත පිරී තිබුණා. ඒ වෙනුවෙන් එතුමා පෙනී සිටියා. මේ

පාර්ලිමේන්තුවේ වමට නැඹුරු අදහස්වලට එතුමා ලොකු හඬක් එකතු කළා. ඉතින් මෙබඳු චරිතයක් මට ඇසුරු කරන්නට ලැබුණේ එතුමා සමසමාජ පක්ෂයේ හිටපු කාලය තුළයි. මේ කාලයේ අපි ඉතා සමීපව කටයුතු කළ අතර, පක්ෂයේ තරුණ සමිති ව්‍යාපාරයේ විශාල වැඩ කොටසක් ඉටු කරන්නට අපට පුළුවන් වුණා. ඉන්පසුව නැවත එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක සබඳතා ඇති කර ගත්තා. එයින් අපි දේශපාලන වශයෙන් ඈත් වුණත් අපගේ පෞද්ගලික හිතවත්කම් කිසිම අඩුවක් නැතිව පැවතුණා.

ඇත්තටම එතුමා කාලයට වඩා ඉදිරියෙන් හිටපු කෙනෙක්. එකල කුරුල්ලන් ඇති කිරීම, ඇන්තුරියම් පැළ වගාව, සුරතල් මසුන් ඇති කිරීම යන මේවා පිළිබඳව එච්චරම ප්‍රචලිත තත්ත්වයක් තිබුණේ නැහැ. ඒවා ආදායම් මාර්ග හැටියට මේ රටේ එහෙම විවර වෙලා තිබුණෙත් නැහැ. එතුමාගේ කාලයට වඩා ඉදිරියෙන් හිතමින් මෙන්න මේ ව්‍යාපාර, ව්‍යාපෘතීන් ගැන එතුමා අත්හදා බැලීම් කළා. එතුමාගෙන් ලැබුණු පාඩම් මේ රටටම එකතු වුණු විශාල සම්පතක් වුණා.

පසුව එතුමා දේශපාලන පොර පිටියේ දිගටම රැඳී සිටීමේ අදහසින් ඉවත් වී විවේකී සුවය ගත කරමින්, එහෙත් දේශපාලන උනන්දුව අත් නොහරිමින් එතුමාගේ විනෝදාංශය වුත්, ප්‍රධාන වශයෙන්ම එතුමා ඇලුම් කරපු ක්‍රියාකාරීත්වය වුත් මල් පැළ වැවීම, සුරතල් මසුන් ඇති කිරීම ආදිය කෙරෙහි නැවතත් යොමු වෙමින්, දේශපාලන වශයෙන් නොයෙක් දේ කියවමින්, හදාරමින්, දේශපාලන සාකච්ඡාවලට කවුරු හෝ එන තුරු බලා සිටිමින් එතුමා ගෙන ගිය ජීවිතය සුපුරුදු ලෙස ගත කළා. අවසානයේදී එතුමා අභාවයට පත් වීමෙන් පසු අපට එතුමාගේ නිවසට යන්න පුළුවන් වුණා. එතුමා පිළිබඳව අපට තිබෙන මතකය වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ශෝකයත් මෙම ශෝක යෝජනාවට යොමු කරන අතර, අප මිත්‍ර උපාලි ලියනගේ මහතාටත්, එම පවුලේ සියල්ලන්ටත් අපගේ ශෝකය දන්වා යවන්නැයි ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් හමාර කරනවා.

[අ. භා. 4. 10 ]

**ගරු කමලා රණතුංග මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)

(The Hon. (Ms.) Kamala Ranathunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ලස්සනගම" ගම්මානය බිහි කළ, ලස්සන වැඩට ප්‍රිය කළ, ලස්සන මිනිසෙක් ගැන කථා කරන්නටයි මම නැඟී සිටියේ. ධනපාල වීරසේකර මැතිතුමා මා හඳුනා ගත්තේ 1960 දශකයේදීයි. එතුමා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මුණ ගැහිලා එදා රත්නපුර ආසනයෙන් තරග වදින්නට වරම් ලබා ගත් මොහොත මට මතක් වෙනවා. එතුමා පැල්මඩුල්ලේ වීරසේකර රටේ මහත්තයාගේ පුතා වුණාය කියලා තාත්තාගේ ශක්තිය බලය ඇඟට ගත් පුතෙක් නොවෙයි. ඉතාම නිහතමානීව ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ගෙන දේශපාලනයෙන් ජනතාවට සේවය කරන්නට තිබුණු ආශාව නිසාම එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග වැදුණා. රත්නපුර දිස්ත්‍රික්කයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත් එතුමා, 1960 ඉඳලා 1977 දක්වා වසර 16ක කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඊට පසුව දෙහිඕවිට ආසනයෙන් තරග වැදුණා.

ධනපාල වීරසේකර මැතිතුමා නව නිර්මාණ සඳහා කැප වෙච්ච, ජනතාවට සේවය කරපු ශ්‍රේෂ්ඨ ගණයේ දේශපාලනඥයෙක් කියලා මෙම උත්තරීතර සභාවේදී රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා ඉතාම ප්‍රශංසාත්මක මුඛයෙන් ප්‍රකාශ කරන්නට යෙදුණා. දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකාවක් වශයෙන් එතුමන් සමඟ ජනතා සේවයට කැප වෙච්ච කෙනෙක් හැටියට ඒක අපටත් එක හෙළාම අනුමත කරන්නට පුළුවන්කම තිබෙනවා. මට මතකයි අපේ දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා සුද්දන් සතුව තිබුණු අක්කර දහස් ගණනක ඉඩම් ජනතාවට අයිති කර දුන් අවස්ථාවේදී ගරු එච්.ආර්. මිත්‍රපාල මැතිතුමා ප්‍රකාශ කළ පරිදි වීරසේකර මැතිතුමා "ලස්සනගම" ගම්මානයේ ජනතාවට ප්‍රයෝජනවත් විධියට ඉඩම් පනතින් බලාපොරොත්තු වුණු ඒ උදාර කාර්ය භාරය ලබා දෙන්න කැප වුණු බව.

මම එදා ගුවන් විදුලියේ වැඩසටහන් නිෂ්පාදකවරියක වශයෙන් විවිධ වැඩසටහන් මඟින් ඉඩම් ජනසතුව පිළිබඳව ජනතාව දැනුවත් කරන්න කටයුතු කළා. "ලස්සනගම" ගම්මානයට මම ගියා. ඒ ගම්මානයේ අපි වැඩසටහන් පැටිගත කළා. ඒ ගම්මානයේ එක එක අංශවල ව්‍යාපෘතීන් 500ක් පමණ තිබුණා. මට මතකයි එක පැත්තක සත්ත්ව ගොවිපළක් තිබුණා. තවත් පැත්තක සෝයා වගා කරලා තිබුණා. තවත් පැත්තක එළවලු වගා කරලා තිබුණා. "ලස්සනගම" ගම්මානයේ ඒ සියලුම ව්‍යාපෘතීන්වල 500ක පමණ කාන්තාවන් පිරිසක් වැඩ කළා. එදා ටී.බී. ඉලංගරත්න මැතිතුමා ට්‍රැක්ටර් 3ක් "ලස්සනගම" ගම්මානයට ප්‍රදානය කළා. මට මතකයි එදා මැතිනිය එතැනට ගිය වෙලාවේ අපේ කාන්තාවෝ තමයි ඒ ට්‍රැක්ටර් රථ පදවා ගෙන ආවේ. එතුමා "ලස්සනගම" ගම්මානයෙන් බලාපොරොත්තු වුණේ, ඉඩම් ජනසතු කිරීමෙන් ජනතාවට ලබා දුන් ඒ කාර්ය භාරය හරියට කරන්නටයි. එතුමා ඒ සඳහා විශාල කැප කිරීමක් කළා.

අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දියත් කර ඇති "දිවි නැඟුම" වැඩසටහනෙන් අද එම ප්‍රදේශයේ ජනතාවට වගාව පිළිබඳ උනන්දුවක් ඇති කරන්න කටයුතු කර තිබෙනවා වාගේම ධනපාල වීරසේකර මැතිතුමා එදා "ලස්සනගම ෆාම්" ව්‍යාපෘතිය මඟින් අපේ අතිගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දියත් කරපු වගා සංග්‍රාමයේ ප්‍රතිඵල ජනතාවට නෙළා දෙන්නට විශාල කැපවීමක් කෙරුවා. ඒ වාගේම එතුමා "ලක් මල්සල" සමුපකාර මල් වවන්නන්ගේ සංගමයේ ලේකම් ලෙස කටයුතු කළා. මීට කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ ඕකිඩ් වගාව ගැන එතුමා ඉතාමත් ප්‍රසිද්ධයි. එතුමා ඕකිඩ් මල් වගාවට ඉතාමත් ප්‍රිය කළා. මෙතැනදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එතුමාගේ එක දියණියක් ඉන්නේ නවසීලන්තයේයි. මේ ශ්‍රී ලංකාද්වීපයේ ඉන්න දියණිය විවාහ වෙලා ඉන්නේ ලංකා පුත්‍ර සමාගමේ වර්තමාන ගරු සභාපති උපාලි ලියනගේ මැතිතුමාත් සමඟයි. එතුමාත්, එම දියණියත් තමන්ගේ තාත්තාගෙන් ගිලිහිච්ච වැඩ කොටස ඉෂ්ට කරන්නට ඒ වගකීම තමන්ගේ දෙඋරට අර ගෙන විශාල කාර්යභාරයක් කළා. එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපති ධුරයේ වැඩ කරද්දී උපාලි ලියනගේ පවුලෙන් එතුමියට විශාල ශක්තියක් ලැබුණු බව අපි දන්නවා. ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කරන්නට, අපේ කාර්යයන් හරියට කරන්නට ධනපාල වීරසේකර මැතිතුමාගෙන් ඉෂ්ට වෙච්ච සේවය අද එතුමාගේ බෑණා ඉටු කරන්න කැප වෙලා ඉන්නවාය කිව්වොත් මම හිතන්නේ, ඒක වැරදි නැහැ කියලායි.

මම දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාට මැණික් සංස්ථාව ඇති කරන්න අවශ්‍ය වුණු කරුණු, කාරණා රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් ගරු වීරසේකර මැතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. මෙතැන ඒක කියැවුණා. එතුමා ඉතාම අවංක, දේශපාලනයෙන් හරි හම්බ කළේ නැති, ජනතාවට සේවය කරන්න කැප වෙච්ච ශ්‍රේෂ්ඨ නායකයෙක් හැටියට හඳුන්වා දෙමින් එතුමාට අමාමහ නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, ශ්‍රී ලංකා නිදහස් කාන්තා සංවිධානයේ සාතිශය ශෝකයත්, පෞද්ගලිකව මගේ ශෝකයත් පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී පිළිගන්වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. Dhanapala Weerasekera, ex-Member of Parliament.

I may also be permitted to add my personal references. I came to know the Hon. Dhanapala Weerasekera quite well when we were undertaking social service work at Ruanwella, Karawanella, Dehiowita, Talduwa, Ampe and Kannatota areas together with our good Friend, the former Minister of State for Transport, the Hon. U.L.M. Farook, at that time. The Hon. Weerasekera added colour to the *Thunkorale* together with persons of the calibre of Edmund Samarakkody, Soma Wickramanayake, H.G. Somabandu, and our present Minister, the Hon. Athauda Seneviratne. He was an enlightened leader, I should say. He, as an orchid culturist, had established very close contacts with one of the most distinguished leaders of this country, Sir Razik Fareed, the Leader of the All-Ceylon Moors' Association, who was also known as the "King of Orchids."

I shall now direct the Secretary-General of Parliament to make a Minute of the Proceedings of today and send a copy thereof to the members of the bereaved family.

Now, we will take up the Vote of Condolence on the late Hon. Augustheenu Fonseka. Before that, will an Hon. Member propose the Hon. (Mrs.) Thalatha Atukorale to the Chair?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
I propose that the Hon. (Mrs.) Thalatha Atukorale do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු තලතා අතුකෝරල මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. (MRS.) THALATHA ATUKORAL*E took the Chair*.

## ශෝක ප්‍රකාශය: ගරු අගොස්තීනු පොන්සේකා මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு அகுஸ்தீனு பொன்சேகா
## VOTE OF CONDOLENCE: HON. AUGUSTHEENU FONSEKA

[අ. භා. 4.18 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන්ද, ධීවර නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්ද මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ ප්‍රවීණ දේශපාලනඥයෙකු වූ නීතිඥ අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

පුත්තලම දිස්ත්‍රික්කයට අයත් වෙන්නප්පුවේදී ජෝකිම් පොන්සේකා මහතාගේත්, මර්දලේනා ප්‍රනාන්දු මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙසින් 1925 ජූලි 25වැනි දින අගොස්තීනු පොන්සේකා මහතා උපත ලැබුවේය. වෙන්නප්පුව ශාන්ත ජෝශප් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ද, ලුණුවිල මධ්‍ය මහා විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ද ලැබූ එතුමා මග්ගොන ගුරු විද්‍යාලයට ප්‍රවිෂ්ටව පුහුණු ගුරුවරයකු වශයෙන් ඉන් පිටවූවේය.

1947 වසරේදී දෙමටගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සිය ජීවන වෘත්තිය ආරම්භ කළ පොන්සේකා මහතා හලාවත මාදම්පේ සෙබස්තියන් විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයා වශයෙන්ද සේවයේ යෙදුණේය. ඒ අතරතුර ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත් පොන්සේකා මහතා ඉන් අනතුරුව කොළඹ විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමාවක්ද ලබා ගනිමින් තම දැනුම හා අධ්‍යාපන සුදුසුකම් තවදුරටත් වැඩි දියුණු කර ගත්තේය.

පිලෝමිනා පෙරේරා මෙනෙවිය සමඟින් යුග දිවි ගමන ඇරඹූ අගොස්තීනු පොන්සේකා මහතා එම විවාහය තුළින් සිසිල්, ගාමිණී, අරුණ සහ සන්ධ්‍යා නමින් දූ දරුවන් සිවු දෙනෙක් මෙළොවට දායාද කළේය. තරුණ වියේදීම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සොයා බලමින් සුවිශේෂී සමාජ මෙහෙවරක නියැළුණු එතුමා 50 දශකයේ සිටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙමින් ක්‍රියාකාරී දේශපාලනයේ යෙදුණේය. ධීවර සමිති කිහිපයකටම සම්බන්ධ වෙමින් ප්‍රදේශයේ ධීවර ජනතාවට කැපී පෙනෙන සේවාවක් ඉටු කළ පොන්සේකා මහතා වසර ගණනාවක්ම ඕතර පළාත විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කළේය.

1964 දී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිතුමිය විසින් වෙන්නප්පුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක වශයෙන් එතුමාව පත් කරන ලදී. 1965 වසරේ පැවැති මහ මැතිවරණයට වෙන්නප්පුව ආසනයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයකු වශයෙන් තරග වැදී ජයග්‍රහණය ලබා ගත නොහැකි වුවත්, 1970

වසරේදී එම ආසනයට නැවත වරක් තරගකොට විශිෂ්ට ජයග්‍රහණයක් අත් පත් කර ගනිමින් මෙම උත්තරීතර සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගැනීමේ භාග්‍යය හිමි කර ගත්තේය. එවර බලයට පත් සමගි පෙරමුණු රජයේ ධීවර නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබූ පොන්සේකා මහතා ධීවර කර්මාන්තයේ උන්නතිය සඳහාත්, ධීවර ප්‍රජාවගේ ගැටලු විසඳාලීම සඳහාත් එම කාල වකවානුව තුළ අමිල මෙහෙවරක යෙදුණේය.

වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ සංවර්ධන කටයුතු වේගවත් කිරීම සඳහා ප්‍රදේශයේ ප්‍රගතිශීලී ජනතාව සමඟ උරෙනුර ගැටෙමින් කටයුතු කළ එතුමා නිහතමානී දේශපාලනඥයකු වශයෙන් කා අතරත් ජනාදරයට පත්ව සිටියේය. තම බල ප්‍රදේශය තුළ ගමනාගමන කටයුතු දියුණු කරලීම, සෞඛ්‍ය පහසුකම් නංවාලීම, අධ්‍යාපනය ලබන දූ දරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම, ඉඩම් නොමැති දිළිඳු ජනතාවට ඉඩම් ලබා දීම, මං මාවත් හා විදුලිය පහසුකම් සපුරාලීම වැනි සියලු යටිතල පහසුකම් ලබා දීම සඳහා සැම විටම කැපවීමෙන් යුතුව ක්‍රියා කළේය.

රුසියාවේ මොස්කව් නුවර පැවැති ටස්කන් සම්මේලනය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ පොන්සේකා මහතා එමඟින් අප රටට විශේෂ ගෞරවයක්ද හිමි කර දුන්නේය. විදේශ චාරිකාවලදී ලද දැනුම තම ප්‍රදේශයේ අභිවෘද්ධිය වෙනුවෙන් යෙද වූ එතුමා සැමවිටම තම ප්‍රදේශයේත්, ප්‍රදේශවාසීන්ගේත් දියුණුව ඉතසිතින්ම ප්‍රාර්ථනය කළ මානව හිතවාදී දේශපාලනඥයකු වූයේය.

1977 මහ මැතිවරණයෙන් පසු ක්‍රියාකාරී දේශපාලනයෙන් සමු ගත් එතුමා කොළඹ නීති විද්‍යාලයට පිවිස නීතිඥයකු වශයෙන්ද සුදුසුකම් සම්පූර්ණ කර ගත්තේය. ඉන් අනතුරුව මාරවිල අධිකරණයේ නීතිඥවරයකු ලෙසත්, නිල නොලත් මහේස්ත්‍රාත්වරයකු ලෙසත් කටයුතු කළ පොන්සේකා මහතා මාරවිල නීතිඥ සංගමයේ සභාපති වශයෙන්ද ප්‍රාදේශීය ආගමික කටයුතු පිළිබඳ නීති උපදේශක වශයෙන්ද කටයුතු කළේය.

උපතින්ම රෝමානු කතෝලිකයකු වූ අගොස්තිනු පොන්සේකා මහතා තම ආගමේ දියුණුව පමණක් නොව අනෙකුත් සියලු ආගම්වල පැවැත්ම සඳහාත් නිරතුරුවම සහයෝගය ලබා දුන් අතර, කතෝලික ආගමික නායකයන් සමඟ මෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමඟත් ඉතා සුහදශීලීව කටයුතු කරමින් කාගේත් හොඳ හිත දිනා ගැන්මෙහි සමත් වූ මහත්මා දේශපාලනයේ යෙදුණු යුග පුරුෂයකු විය.

මෙවන් උදාර ගුණාංගයන් සමූහයකින් පිරිපුන්ව සිටි පොන්සේකා මැතිතුමා සුළු කාලයක් අසනීප තත්ත්වයෙන් පසු වී වසර 85ක් ආයු වළඳා පවුලේ සියලු දෙනාගේත් ප්‍රදේශවාසීන්ගේත් දෙනෙතට කඳුළක් එක් කරමින් 2010 ජූනි මස දෙවෙනි දින සදහටම දැයෙන් සමු ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් අනුපමේය සේවාවක් ඉටු කළ වෙන්නප්පුව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු ධීවර නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ අගොස්තිනු පොන්සේකා මැතිතුමන්ට මොක් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ දයාබර භාර්යාව වූ පිලෝමිනා පෙරේරා මහත්මියටත්, සිසිල්, ගාමිණී, අරුණ සහ සන්ධ්‍යා යන දූ පුතුන් ඇතුළු පවුලේ ඥාතීන් වෙතත් දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 4.25 ]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අගොස්තිනු පොන්සේකා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපිද එයට එකතු වීමට කැමැත්තෙමු.

වෙන්නප්පුව, උල්හිටියාවේ ධීවර පරිසරයක උපත ලැබූ අගොස්තිනු පොන්සේකා මැතිතුමා වෙන්නප්පුව ශාන්ත ජෝශප් කුමර විදුහලෙන් සිය මූලික අධ්‍යාපනය ලබා, මග්ගොන ගුරු අභ්‍යාස විදුහලෙන් පුහුණුව ලැබ පුහුණු ගුරුවරයෙකු ලෙස ගුරු සේවයට පිවිසියේය. එකල වෙන්නප්පුව ප්‍රදේශයෙන් බිහි වූ ගුරු පරපුරේ අයිතීන් වෙනුවෙන් පෙරමුණ ගෙන ක්‍රියා කළ එතුමා තම වෘත්තිය වෙනුවෙන් ඉදිරිපත් වූ ගුරු සංගම් නායකයකු ලෙස කළ කාර්යභාරය අතිවිශාලයි.

පිලෝමිනා පෙරේරා ගුරු මෙනෙවිය සමඟ විවාහ වූ මෙතුමා දරුවන් සිවු දෙනෙකුගේ පියෙකු වුණා. සිසිල්, ගාමිණී, අරුණ යන පුතුන් තිදෙනා වෘත්තියෙන් ඉංජිනේරුවෝ වෙති. එකම දියණිය සන්ධ්‍යාගේ සැමියාද ඉංජිනේරුවරයෙක්. සිය දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා දී යහ මඟ යැවූ මෙතුමා, තම සිසු දරුවන්ටද ආදර්ශවත් ගුරු පියකු ලෙස ඔවුන් අධ්‍යාපනයේ ඉහළටම ඔසවා තැබීමට හා සමාජයේ යහපත් පුරවැසියන් සේ සමාජගත කිරීම සඳහා ඉටු කරන ලද කාර්ය භාරය අතිවිශිෂ්ටයි.

සිය ගුරු ජීවිතයේ වැඩි කාලයක් දෙමටගොඩ ශාන්ත ජෝන් විද්‍යාලය වෙනුවෙන් කැප කළ මෙතුමා පසුව විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට ඇතුළු වී ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේය. ඉන් පසුව එතුමා මාදම්පේ ශාන්ත සෙබස්තියන් විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයා ලෙස සේවය කළේය. 1965 වසරේදී වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා ලෙස එතුමා ඉදිරිපත් විය. එහිදී මගේ පියාණන් වන හිටපු අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා මැතිතුමා සමඟ තරග කර ජයග්‍රහණය නොකළද, 1970 වර්ෂයේ පැවති මහ මැතිවරණයේදී මගේ පියාණන් අභිභවා යමින් වෙන්නප්පුව ආසනය ජයග්‍රහණය කර මෙම උත්තරීතර සභාවට තේරී පත් විය. පසුව එම රජයේ නියෝජ්‍ය ධීවර ඇමති ධුරයෙන් පිදුම් ලත් මෙතුමා සමස්ත ශ්‍රී ලංකාවේත්, වෙන්නප්පුව ප්‍රදේශයේත් ධීවර ජනතාව වෙනුවෙන් කැපවීමෙන් සේවය කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කැපවී, එම පාක්ෂිකයන් ඒකරාශී කර, පක්ෂයේ සංවිධාන ජාලය ශක්තිමත් කර, තම පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් මෙතුමා විසින් කරන ලද විශිෂ්ට කැප කිරීම අගය කළ යුතුය.

අතිශූර කථිකත්වයක් උපතින්ම උරුම කරගත් මෙතුමා, තම වචනවලින් සිය විරුද්ධවාදීන් පවා තමන් වෙත වසඟ කර ගැනීමේ හැකියාවක් තිබූ දේශපාලනඥයෙකි. විවිධ විෂයයන් පිළිබඳ පරිණත අවබෝධයෙන් කටයුතු කළ අගොස්තිනු පොන්සේකා මැතිතුමා පොදු ජනතාවගේ කඳුළු, දුක්, වේදනා හඳුනා ගෙන ජනතා සේවයේ යෙදුණු ජනහිතකාමියෙකි. ජය පරාජය එක සේ විඳ දරා ගැනීමේ හැකියාව තිබූ අධිෂ්ඨානශීලී මිනිසකු වූ මෙතුමා 1977 මහ මැතිවරණයට තරග කර පරාජය වීමෙන් පසුව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළු වී 1981 දී ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වශයෙන් කටයුතු කළේය. පසු කලෙක දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිඳුන්ගේ සංවර්ධන කටයුතු පිළිබඳ පැහැදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල ක්‍රියාකාරිකයකු ලෙස කටයුතු කළ මෙතුමා එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයකු ලෙසද, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ද සේවය කළේය.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ස්වකීය ජීවිතයේ විශාල කාල පරිච්ඡේදයක් පොදු ජන සේවය සඳහා කැප කළ මෙතුමා මිය යන තුරු පොදු ජනතාව හා වෙසෙමින්, ඔවුන්ගේ දුක සැප විමසමින් ජනතාවගේ ආදරය හා ගෞරවය ලබමින් ජීවත් වූ දුර්ලභ ගණයේ මහඟු ගතිගුණවලින් පිරිපුන් උත්තම ගණයේ පුද්ගලයෙකි. කුමන තරාතිරමක බලවතෙකු හමුවේ වුවද, අයුක්තියට, අසාධාරණයට එරෙහිව තම මතය ඉදිරිපත් කර සාධාරණය ඉටු කිරීම සඳහා නොබියව සටන් කළ අගොස්තිනු පොන්සේකා මහතාගේ මානව හිතවාදිත්වය තව බොහෝ කලක් යනතුරු ප්‍රදේශවාසී ජනතාවගේ හදවත් තුළ නොමැකී පවතිනු ඇත. ප්‍රදේශයේ ආගමික, සමාජයීය, අධ්‍යාපනික හෝ වෘත්තිය වශයෙන් වේවා ඒ කුමන කරුණකදී වුවද ජනතාව සමඟ එක්ව සිට අභීත පෙරගමන්කරුවකු ලෙසද, ආදර්ශවත් සමාජ සේවකයකු ලෙසද, යහපත් පියකු ලෙසද, විශේෂයෙන් ජනතාව තුළින් ගොඩ නැඟී ජනතා සේවයට කැප වී ක්‍රියා කළ ආකර්ෂණීය නායකයකු ලෙසද අගොස්තිනු පොන්සේකා මැතිඳුන්ගේ නාමය පොදු ජන හදවත් තුළ නොමැකී පවතිනු ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ පිලෝමිනා පොන්සේකා මැතිනිය, සිසිල්, ගාමිණී, අරුණ, සන්ධ්‍යා යන දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනා වෙත මාගේත්, මාගේ පියා වන හිටපු අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා මැතිතුමාගේත්, මාගේ මව වන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ලැරීන් පෙරේරා මැතිනිය ඇතුළු පවුලේ සියලු දෙනාගේත් ශෝකය ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන් වෙන්නප්පුව ප්‍රමුඛ පුත්තලම් දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන් අගොස්තිනු ෆොන්සේකා මැතිතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 4.30 ]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අගොස්තිනු ෆොන්සේකා මැතිතුමා වෙනුවෙන් වචන කිහිපයක් කථා කිරීම මගේ යුතුකමක් කොට මා සලකනවා. එතුමා වෙන්නප්පුව ප්‍රදේශයේ ඉතාමත්ම ජනප්‍රිය චරිතයක් වශයෙන් එදා ක්‍රියා කෙරුවා. මීට පෙර කිව්ව විධියට එතුමා 1925 ජුලි මාසයේ වෙන්නප්පුවේ ඉපදිලා 2010 ජුනි මාසයේ 02 වන දා තමයි අභාවප්‍රාප්ත වුණේ. එතුමාගේ පියා ජෝකිම් ෆොන්සේකා මහතා, මව මර්දලේනා ප්‍රනාන්දු මහත්මිය. එතුමා පිලෝමිනා පෙරේරා මෙනෙවිය සමඟ විවාහ වීම තුළින් සිසිල්, ගාමිණී, අරුණ සහ සන්ධ්‍යා නමින් දූ දරුවන් සිවු දෙනෙක් මෙලොවට දායාද කළා.

එතුමා ඉතාමත්ම ධෛර්යසම්පන්න පුද්ගලයෙක්. එතුමාගේ ධෛර්ය කොතරම්ද කියලා කිව්වොත් එතුමා මිය යන තුරුම ඉගෙන ගත්තා. වර්ෂ ගණනක් ගිහින් තමයි එතුමා නීතිඥ වෘත්තියට පිවිසුණේ. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අධ්‍යාපන සුදුසුකම් බලද්දී වෙන්නප්පුව ශාන්ත ජෝශප් කුමරු විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයද, ලුණුවිල මධ්‍ය මහා විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනයද ලැබූ එතුමා මග්ගොන ගුරු විද්‍යාලයට ප්‍රවිෂ්ටව පුහුණු ගුරුවරයෙක් වශයෙන් ඉන් පිට වුණා. පසුව දෙමටගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සිය ජීවන වෘත්තිය ආරම්භ කළ ෆොන්සේකා මහතා හලාවත මාදම්පේ සෙබස්තියන් විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයා වශයෙන්ද සේවය කළා. ඒ අතරතුර ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් 'බීඒ' උපාධිය අරගෙන ඉන් අනතුරුව එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමාවක්ද ලබා ගනිමින් තම දැනුම හා අධ්‍යාපන සුදුසුකම් තවදුරටත් වැඩි දියුණු කර ගත්තා. ඒ වාගේම එතුමා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් විධියටත් කටයුතු කර තිබෙනවා. මාදම්පේ ශාන්ත සෙබස්තියන් විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් විධියටත් එතුමා කටයුතු කළා. ඒ වාගේම එතුමා ගුරු සංගම්වල නායකයෙක් වුණා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ගුරු සංගමයේ සංවිධායක වශයෙනුත් ක්‍රියා කළා.

එතුමා 1970 ඉඳලා 1977 වන තුරු ධීවර නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. අපි අහලා තිබුණු විධියට ඒ කාලයේ ධීවර ඒකාධිකාරයක් තිබුණා. මාළු මුදලාලිලා කිහිප දෙනෙක් පමණයි ඒ පැත්තේ ධීවර කර්මාන්තයට යොමු වුණේ. ඒ ඒකාධිකාරය නැති කිරීමට ක්‍රියා කරපු කෙනෙක් එතුමා. මම ධීවර ඇමති වුණාට පසු අතීතය භාර අවුස්සද්දි ඒ ප්‍රදේශයේ පැරැන්නන් එතුමා සිහිපත් කළා. ඒ ගොල්ලන් කිව්වේ, ඒ ඒකාධිකාරය නැති කරන්න එතුමා ක්‍රියා කළ බවයි. ෆෙස්ටස් පෙරේරා මැතිතුමාගේ පුත්‍රරත්නය කියපු විධියට ධෛර්යයක්, අයුක්තියට හිස නොනමන ගතියක් එතුමා සතුව තිබුණා. එතුමා කතෝලිකයෙක් වුණත් වෙන්නප්පුව කන්‍යාරාමයේ පිරිසකට නොමිලේ අධ්‍යාපනය දීමත්; පිරිසකට මුදල් ගෙවලා අධ්‍යාපනය දීමත් වැරදියි කියා කියන්න තරම් ශක්තියක් එතුමා සතුව තිබුණා. කතෝලික සභාවකට විරුද්ධව නොවෙයි, කතෝලිකයන්ට විරුද්ධවවත් අඩු තරමේ ඒ පිළිබඳව වචනයක් කථා කිරීමටත් ඒ කාලයේ ටිකක් මැළිකමක් දැක්වූවා. මොකද, ඒ කාලයේ තිබුණු සම්ප්‍රදාය අනුව කතෝලික සභාවට ලොකු ගෞරවයක් සහ භක්තියක් සහ යටහත් පහත්කමකුත් තිබුණා. එතුමා ඒවා නොතකා හැර තිබුණා. අයුක්තිය වෙනුවෙන් නොව යුක්තිය වෙනුවෙන් ඒවා නොතකා හැරියා.

රුසියාවට ගිහින් ටස්කන් සම්මේලනයට සහභාගි වෙලා අපේ රට වෙනුවෙන් ඒ කාලයේ විශාල යුතුකමක් ඉෂ්ට කළා කියා තමයි අපි අහලා තිබෙන්නේ. හියු ප්‍රනාන්දු මැතිතුමාගේ හොඳ ගෝලයෙක් එතුමා. හියු ප්‍රනාන්දු මහත්මයා කථානායක පුටුවේ ඉඳ ගත්තා. ගුරුවරයෙක් වශයෙන් එතුමාගේ අඩි පාරේ යමින් අවවාද අනුශාසනා ලබමින් තමයි එතුමා දේශපාලනය කෙරුවේ. 1970 - 77 කාලයේ අපි ජයග්‍රහණය කරපු වෙලාවේ, එතුමා ගුරු ගම්මානයක් පිහිටුවා තිබෙනවා. අද වනතුරු කොහේවත් ගුරු ගම්මානයක් පිහිටුවා නැහැ. එතුමා ගුරු ගම්මානයක් හදලා තිබෙනවා. ඒකට අද කියන්නේ ගුරු කොලනිය කියලා. දැනට ලංකාවේ තිබෙන එකම ගුරු ගම්මානය ඒකයි. ගුරුවරු වෙනුවෙනුත් එතුමා සේවය කළා. තමුන්ගේ වෘත්තියට උදව් වුණු අය වෙනුවෙන් ඒ කටයුත්ත කරලා තිබෙනවා. එතුමා බොහොම සද්භාවයෙන් සාධාරණව සහ යුක්ති සහගතව ඒ ගුරුවරු වෙනුවෙන් පෙනී හිටලා තිබෙනවා.

හියු ප්‍රනාන්දු මහත්මයාගේ දේශපාලනයෙන් පසුව, 1964 දී පක්ෂයට බැඳුණු එතුමාට 1965 දී නාම යෝජනා ලැබුණා. පළමුවන වර පැරදුණත් 1970 දී එතුමාට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණා. ෆෙස්ටස් පෙරේරා මහත්මයාත් අපේ හොඳ හිත මිත්‍රයෙක්. එම මැතිනියත් මේ පාර්ලිමේන්තුවේ හිටපු බොහොම යහපත් චරිතයක්. නමුත් ඒ කාලයේ දේශපාලන මතිමතාන්තරවලදී කියැවුණු කතන්දරයක් තමයි, "මගේ බ්‍රීෆ් කේස් එකෙන් එහෙම නැත්නම් මගේ සූට් කේස් එකෙන් තමයි පාර්ලිමේන්තුවට යන්න පුළුවන් වන්නේ" කියලා ෆෙස්ටස් පෙරේරා මහත්මයා කිව්ව කථාව. එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේත්, "මම සූට් කේස් එකෙන් නොවෙයි, මගේ ශක්තියෙන් මම පාර්ලිමේන්තුට ආවා" කියලායි. කෙසේ වෙතත් අවසානයේදී එතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රේමදාස මහත්තයා හම්බ වෙන්න ඇවිල්ලා, මුණ ගැහිලා කථා කළා. කථා කළාම තමයි එතුමාට ඒ අධ්‍යක්ෂකම දුන්නේ.

එතුමාගේ දරුවන් හොඳට ඉගෙන ගත් අය. ඉගැන්නුවා, ඉගෙන ගත්තා, හැබැයි දරුවන්ව දේශපාලනයට යොමු කළේ

නැහැයි කියලායි මම හිතන්නේ. එක දුවක් ඉංජිනේරුවරියක්. යහපත් විධියට, ගෞරවාන්විත විධියට ඒ කටයුතු කළා. එතුමාගේ පියා ධීවරයෙක්. හැම විටම ඒක මතක් කරලා තිබෙනවා. එතුමා කියපු ආදර්ශ පාඨය තමයි "තමුන්ට ස්ව ශක්තියක් තිබෙනවා නම් තමුන්ට නැඟිටින්න පුළුවන්; යන්න අවශ්‍ය පාරේ යන්න පුළුවන්" කියන එක. ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබුවා; ආත්ම ශක්තිය කෙරෙහි විශ්වාසය තැබුවා. ආත්ම ශක්තියත්, ස්ව ශක්තියත් තිබෙනවා නම් කළ නොහැකි දෙයක් නැහැයි කියන එක යථාර්ථවාදීව එතුමා ඔප්පු කරලා තිබෙනවා. එතුමාගේ චරිතයෙන් අපට ගන්න පුළුවන් එක් ලක්ෂණයක් ඒක. එතුමාගේ චරිතයේ තිබෙන සුවිශේෂත්වය තමයි අවසානයේදී නීති විද්‍යාලයට ගිහින් නීතියත් පාස් කරලා පසුව නීතිඥයකු වශයෙන් ක්‍රියා කිරීම. නීතිඥ සංගමයේ සභාපති පදවියටත් පත් වුණා.

එතුමා නිරෝගිකමත් පවත්වා ගත්තා. 1978 විතර තමයි මම දේශපාලනයට පිවිසුණේ. මට මතකයි, 1982 දී විතර එතුමා ජා-ඇලටත් ඇවිල්ලා පුංචි කථාවක් එහෙම කරලා ගියා. හියු ප්‍රනාන්දු මහත්තයාත් එක්සත් ජාතික පක්ෂයට ගියත් නැවත වරක් ආපහු අපිත් එක්ක ඇවිල්ලා විජය කුමාරණතුංග මහත්තයා එක්කත් දේශපාලනය කළා. මගේ ජා-ඇල රැස්වීමක ස්ටේජ් එකටත් නැග්ගා, මගේ ආරාධනයෙන්. මම තමයි එතුමාට ආරාධනා කරන්න කිව්වේ. මොකද, වෙන්නප්පුව පැත්තත් එක්ක අපේ ලොකු සම්බන්ධතාවක් තිබුණා. ඒ කාලයේ ඉඳලා තිබුණු පෞද්ගලික මිත්‍රත්වයක්. ප්‍රෝටස් තිසේරා මැතිතුමා, සුසිල් තිසේරාලා, අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ සහෝදරයා ඔය සියලු දෙනාම අපේ හිතවත් අය. ජා-ඇල, වෙන්නප්පුව කියපුවාම ඒ ප්‍රදේශ දෙකේ අය අතර බොහොම කුළුපග, සහෘදත්වයක් තමයි තිබුණේ. දේශපාලනය අභිභවා ගිය මිත්‍රකමක් තිබුණා. දෙපක්ෂයේම අය සිටියා. දෙපක්ෂයේම අය සිටියත් තම ප්‍රතිපත්තීන් වෙනස් නොකර ක්‍රියා කිරීම නිසා පැටලෙන්නේ නැති ගතියකුත් අපි කා අතරත් තිබුණා. අපේ ජෝන් අමරතුංග මැතිතුමා ඊට සාක්ෂි දරනවා ඇති. දේශපාලනය කරන වෙලාවට කරනවා, නමුත් අනෙක් වෙලාවට මිතුදම් වඩමින් එකිනෙකාට ගෞරව කරමින් ජීවත් වීමේ සම්ප්‍රදාය අප තුළ තිබෙනවා. ඒක ආදර්ශයක් විධියට තමයි අපි දකින්නේ. ඉතින් මම කියන්න කැමැතියි, මෙතුමාගේ මේ නීරෝගීකම කොහොමද කියලා කිව්වොත් එතුමාගේ වාහනයත් එතුමාම එළවා ගෙන ගිය බව.

අවුරුදු 80කට වැඩි අයට විශ්‍රාම වැටුපක් දෙන්න මම සමාජ සේවා ඇමති වශයෙන් යෝජනා කරලා තිබෙනවා. අවුරුදු 80ට වැඩි අය 2,25,000ක් ඉන්නවා. වයස අවුරුදු 80ට පස්සෙත් එතුමාට හොඳ ශක්තියක් තිබුණා. ඒ කියන්නේ වයස බාධාවක් නොවෙයි, නිරෝගි ශරීරයක් හා නිරෝගි මනසක් පවත්වා ගෙන යෑමට. වයසට වඩා මනස රෝගී වුණොත් මම හිතන්නේ එතැන වෙනත් කතන්දරයක් තිබෙන බවයි. එහෙම කතන්දරයක් එතුමාගේ ජීවිතය තුළ නැහැයි කියන එක එතුමා ඔප්පු කර තිබෙනවා, අවුරුදු 85දීත් නිරෝගි මිනිසකු වශයෙන් ජීවත් වීම තුළින්. ඒ ජීවිත ආදර්ශය එතුමා ලබා දුන්නා. වයස අවුරුදු 85 දීත් උසාවි ගියා. ඒ වාගේම ශ්‍රම බලකාය නියෝජනය කළා. ඒක සමාජයට ආදර්ශයක්. මේ ආදර්ශ තමයි අපි ගන්න ඕනෑ.

තවත් පැත්තකින් එතුමා හොඳ සැමියෙක්. මුනුබුරු මිනිබිරියන් හය දෙනෙක් ඉන්නවා. උපාධිධාරි මුනුබුරු මිනිබිරියන් පිරිස ඕස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවල ඉහළ රැකියා කරමින් ශ්‍රී ලාංකීය වශයෙන් රටට කීර්තියක් අත් පත් කර දීලා තිබෙනවා.

ධීවර කර්මාන්තය බලද්දි ධීවර කර්මාන්තයේ ලොකු සම්බන්ධයක් වෙන්නප්පුව, මාරවිල වැනි මුහුදු තීරයේ ප්‍රදේශවලට තිබෙනවා. දැනට අපේ සිවිල් ගුවන් සේවා ඇමතිතුමාගේ පියාත් ධීවර ඇමති වශයෙන් සිටියා. ෆෙස්ටස් මහත්තයාත් ධීවර ඇමති වශයෙන් කටයුතු කෙරුවා. ජෝශප් මයිකල් පෙරේරා මහත්තයාත් ධීවර ඇමති වශයෙන් කටයුතු කෙරුවා. මිල්රෝයි ප්‍රනාන්දු මහත්තයා ධීවර නියෝජ්‍ය ඇමති වශයෙන් කටයුතු කෙරුවා. එතකොට මේකෙන්ම පෙනෙනවා ඇති ධීවර කර්මාන්තයත් එක්ක බැඳුණු තත්ත්වයක් තමයි මුහුදු කරයේ තිබුණේ කියලා. මෙතුමාටත් අතීතයේදී ධීවර නියෝජ්‍ය ඇමතිකම ලැබිලා තිබුණා. ඒකෙන්ම අපට පෙනෙනවා මේ දේශපාලන පිවිසුමට ධීවර සම්බන්ධතාවේ උදව්වීමක් තිබුණු බව. අපේ ජනාධිපතිතුමාත් කලක් ධීවර ඇමති වශයෙන් කටයුතු කෙරුවා. අපේ ජනාධිපතිතුමා ධීවර කර්මාන්තයට සුවිශාල මෙහෙවරක් කෙරුවා. ඒ නිසා මේ විෂය භාරව, මේ අමාත්‍යාංශය භාරව හිටපු පිරිස පොඩි හෝ ශක්තියක් තිබෙන පිරිසක් කියලා මට වෙලාවකට හිතෙනවා. ධීවරයාට ශක්තියක් තිබෙනවා. නැත්නම් මුහුදට යන්නේ නැහැනේ. ධීවරයා භය නැහැ, ණය නැහැ. දළ රළ පෙළ ජය ගන්න පුළුවන් ආත්ම ශක්තියක් තිබෙනවා නම්, එවැනි ජාන තිබෙන පියකුගේ පුතකුට මොනවාද කරන්න බැරි කියන එක එතුමා ඔප්පු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, Joseph Vaz College එකට එතුමා විශාල වශයෙන් වැඩ කරලා තිබෙනවා. එතුමා තමයි ඔය buildings හදලා, ඒ වාගේම ඒ පාසලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා ඒ විද්‍යාලය ඉතා උසස් තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කළේ. Marist Brothersලාගේ විද්‍යාලයක් ඒක. ජෝශප් වාස් විද්‍යාලයෙන් ඇහුවොත් කියයි, ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා තමන්ගේ පාසලට උදව් කෙරුවේ කොහොමද කියන එක.

එතුමා 1983 දී තමයි දේශපාලනයෙන් සමු ගත්තේ. ඒකටත් එක හේතුවක් තිබුණා. ජන මත විචාරණය දමලා 1983 දී අවුරුදු හයකට ඡන්දය කල් දැම්මා නේ. ඡන්දය කල් දමා ගත්තේ නැත්නම් එහෙම සමහර විට එතුමාගේ දේශපාලනයත් වෙනස් වෙන්න තිබුණා. ඡන්දයක් ඕනෑද එපාද කියලා අහන්න කළ ගෙඩියයි, ලාම්පුවයි ඉස්සරහට දමා ගෙන තමයි එදා ජන මත විචාරණය කෙරුවේ. ඒ ඡන්දයේදී මට මතකයි, වාසුදේව නානායක්කාර මැතිතුමා Naxalite කියලා අල්ලා ගත් වෙලාවේ එතුමා තනි සටනක් ගෙනිච්චා. ඉතින් මේ අතීතය මතක් කරන්න ඕනෑ. අනිවාර්යයෙන්ම 1983 දී ඡන්දයක් පවත්වන්න නියමිතව තිබුණා. මම හිතන්නේ 1983 දී ඡන්දයක් තියලා එතුමාට අවස්ථාවක් ලැබුණා නම් එහෙම මීටත් වඩා එතුමාගේ චරිතයේ තවත් පිටු කීපයක් ගැන අපට කථා කරන්න තිබුණා කියලායි. අඩු නොවී වැඩි ප්‍රමාණයකට එතුමාගේ සේවය ගැන තව තවත් අටුවාටීකා කියන්න තිබුණා කියන ටික මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න ඕනෑ. එවැනි සුනාමියකට හසුවීමෙන් තමයි එතුමාගේ දේශපාලන ජීවිතය නැවතුණේ. ඒක දේශපාලන සුනාමියක්. ඡන්ද නොතැබීමේ සුනාමියකට හසු වෙලා තමයි ඒ සිද්ධිය වුණේ.

එතුමා ගැන කථා කරද්දි ඒ ආදර්ශවත් චරිතය අපත් ආදර්ශයට ගන්න ඕනෑ. එතුමාගේ ඒ ආදර්ශවත් චරිතය තුළ විශේෂයෙන්ම වෙන්නප්පුව ප්‍රදේශයට ලොකු කථාවක් ලියන්න තරම්; පොතක් ලියන්න තරම් කරුණු රාශියක් තිබෙනවා. නමුත් සීමාසහිත කාලයක හැම දේම කියන්න බැහැ.

එතුමාගේ චරිතයේ දක්නට ලැබෙන හොඳම ලක්ෂණයක් තමයි පවුල් සංස්ථාවේ එතුමා දරපු ස්ථාවරය. එතුමා හොඳ පවුල් ජීවිතයක් ගත කෙරුවා. සාමාන්‍යයෙන් දේශපාලනඥයන්ට කතා බතා හැදෙනවා නේ. නමුත් එහෙම කතා බතා හදා ගත්තේ නැතිව හොඳ පවුල් ජීවිතයක් ගත කරපු කෙනෙක් විධියට එතුමා ගැන මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරන්න ඕනෑ.

ජෝශප් වාස් විද්‍යාලය ගැන මම කථා කෙරුවා. ජෝශප් වාස් විද්‍යාලය ඒ ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන විද්‍යාලයක්. ඒ විද්‍යාලය අද ඉතා උසස් තත්ත්වයක තිබෙනවා. ඒ උසස් තත්ත්වය ඇති කරන්නත් එතුමා ක්‍රියා කෙරුවා.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

වෙන්නප්පුව ආසනය මන්ත්‍රීවරුන් රැසක් බිහි වෙච්ච ආසනයක්. ගරු ප්‍රෝටස් තිසේරා මැතිතුමා, ගරු ෆෙස්ටස් පෙරේරා හිටපු ඇමතිතුමා, ගරු අගොස්තීනු පොන්සේකා හිටපු නියෝජ්‍ය ඇමතිතුමා, අපේ ගරු දයාශ්‍රිත තිසේරා ඇමතිතුමා වාගේ චරිත ගොඩක් ඒ ප්‍රදේශයෙන් බිහි වුණා. දැන් මන්ත්‍රීතුමෙක් ඒ පැත්තෙන් ඇවිල්ලා ඉන්නවා. පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු රැසක් බිහි වෙලා තිබෙනවා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ තිබුණු ඒ ශක්තිය මේ වෙද්දී ඒ ප්‍රදේශයෙන් දවසින් දවස ඛාදනය වෙමින් යනවා. මුහුද ඛාදනයට හසු වෙලා එහෙම වෙලා තිබෙනවාද කියා මම දන්නේ නැහැ. කෙසේ වෙතත් අපි ප්‍රාර්ථනා කරනවා මුහුද ඛාදනය වනවා වාගේ ඔබතුමන්ලාගේ පක්ෂය ඛාදනය නොවේවා කියලා. එසේ ප්‍රාර්ථනා කරමින් ස්තුතිවන්ත වෙනවා මට අවස්ථාවක් ලබා දීම ගැන.

ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ පවුලේ අයට මගේ ශෝකය ප්‍රකාශ කරනවා. ශෝකය ප්‍රකාශ කරන ගමන් කතෝලිකයකු වශයෙන් ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාට මොක් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. John Amaratunga.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
( மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු තලතා අතුකෝරල මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (MRS.) THALATHA ATUKORALE *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 4.46]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ අභාවය වෙනුවෙනුයි අද මේ ශෝක ප්‍රකාශය, ගුණ කථනය කරන්න යෙදෙන්නේ. එතුමා නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට, මන්ත්‍රීවරයකු හැටියට දේශපාලන ක්ෂේත්‍රයේ කරපු සේවය පිළිබඳවයි අද අප කතා කරන්නේ. ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා පාර්ලිමේන්තුවේ සිටියා, 1970 ඉඳලා 1977 වෙන කල්. ඒ වකවානුව තුළ එතුමා මන්ත්‍රීවරයකු වූවා පමණක් නොවෙයි, ධීවර නියෝජ්‍ය ඇමතිවරයා හැටියටද කටයුතු කළා. ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ විශේෂත්වය, එතුමා සාමාන්‍ය පවුලකින්, ධීවර පවුලකින් ඒ උසස් ස්ථානයට ආපු එකයි. ඒක තමයි අපට එතුමාගෙන් ගන්න තිබෙන ලොකුම ආදර්ශය.

ගුරුවරයකු හැටියටත්, නියෝජ්‍ය විදුහල්පතිවරයකු හැටියටත් කටයුතු කළ එතුමා විශ්වවිද්‍යාලයට ගිහින් උපාධියද ලබා ගත්තා. එතැන ඉඳන් මහ ජන සේවය පිණිස දේශපාලනයට පිවිසිලා එතුමා ඉමහත් සේවයක් කළා. මා හිතන හැටියට පුත්තලම දිස්ත්‍රික්කයේම, ඒ කියන්නේ කොච්චිකඩේ පාලමෙන් එහා ඉඳලා පුත්තලමට යන කල් ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ ජනප්‍රියත්වය ඒ කාලයේ ඉහළින්ම පැවතුණා.

එතුමා සාමාන්‍ය පවුලකින් ආපු පුද්ගලයකු හැටියට ජනතා දුක දන්නා පුද්ගලයකු හැටියට අහිංසක ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කළා. බලය තිබුණු රජයේ නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට, මන්ත්‍රීවරයකු හැටියට එතුමා ඒ පළාතට ඉමහත් සේවයක් කළා. මෙතැනදී කියැවුණා එතුමාගේ ක්‍රියා කලාපය; එතුමා මන්ත්‍රීවරයකු හැටියට, නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට කටයුතු කළ ආකාරය. මා ඒවා ආයෙත් කියා පාන්න වුවමනාවක් නැහැ. නමුත් ඒ ගැන ජනතාව අදත් සිහිපත් කරනවා. අගොස්තීනු පොන්සේකා මහත්මයා ආදර්ශයට ගන්නවා.

ඡන්ද පැරදුණාය කියලා එතුමා එතැනින් නැවතුණේ නැහැ, නිකම් හිටියේ නැහැ. නීති විද්‍යාලයට ගිහිල්ලා නීති වෘත්තිය හදාරලා අපේ ගරු හැරල්ඩ් හේරත් මැතිතුමා සමඟ, ගරු ෆෙස්ටස් පෙරේරා මැතිතුමා සමඟ මාරවිල උසාවියේ නීතිමය කටයුතුවලත් යෙදුණා. ඒ අය බොහෝ විට අහිංසක ජනතාව වෙනුවෙන් ගාස්තු නොගෙන -නොමිලේ පවා- පෙනී සිට තිබෙන බව අපට දැන ගන්න ලැබී තිබෙනවා.

අපේ පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද වෙනත් වැදගත් කාර්යයක -දේශපාලන කාර්යයක- යෙදෙන නිසා එතුමාට මේ අවස්ථාවේ සහභාගි වෙන්න බැරි වුණා. එතුමා වෙනුවෙනුත්, සමස්ත විපක්ෂය වෙනුවෙනුත් අපගේ ශෝකය ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ පවුලේ සැමට පුද කරනවා.

ගරු රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ වැඩ පිළිවෙළ අගය කිරීමක් හැටියට, එනම් ගුරු ගම්මාන වැනි ගම්මාන පිටුවීමේ වැඩ පිළිවෙළ, නිවාස වැඩ පිළිවෙළ, ඒ වාගේම දරුවන් වෙනුවෙන් ආහාර, රෙදි පිළි ලබා දීමේ වැඩ පිළිවෙළ ආදිය අගය කිරීමක් හැටියට, එතුමාගේ ප්‍රතිපත්ති අගය කිරීමක් හැටියට ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා තමාගේ අවසාන කාලයේදී එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වුණා.

එහෙම සම්බන්ධ වෙලා පක්ෂය තුළින් විශාල සේවාවක් කළා. ප්‍රේමදාස මහත්මයා එතුමාට හුඟක් උදවු කළා. ප්‍රේමදාස ජනාධිපතිතුමා එතුමාට අධ්‍යක්ෂකමක් එහෙම ලබා දුන්නා. අපේ නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාගේ පියා එක්ක සම්බන්ධකම් තිබුණු පුද්ගලයෙක් හැටියට ඒ ගැන එතුමා සෑහෙන විස්තරයක් කළා. ඒ වාගේම ෆීලික්ස් පෙරේරා මැතිතුමා, අපේ සභානායකතුමා එතුමා පිළිබඳව කථා කළ නිසා මම වැඩිදුර කථා කරන්න යන්නේ නැහැ. මේ මන්ත්‍රීවරයා ආදර්ශවත් මන්ත්‍රීවරයෙක් වාගේම දූෂණය පිටු දැකලා දූෂණයට සම්බන්ධ නොවූ, භීෂණය පිටු දැකලා භීෂණයට සම්බන්ධ නොවූ, ඡන්ද පැරදුණත් භය නැතිව ඕනෑම තැනක මහ පාරේ බැහැලා යන්න පුළුවන් තත්ත්වයකට කටයුතු කරපු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්. එතුමාගේ අභාවය ගැන අපි කනගාටු වනවා. ඇත්ත වශයෙන්ම අද මේ අවස්ථාවේදී එතුමාගේ භාර්යාව,

දූදරුවන්, නෑ පිරිස මෙම ස්ථානයේ සිටිනවා. ඒ අයට අපේ පක්ෂයේ; අපේ නායකතුමාගේ කනගාටුව මේ අවස්ථාවේදී පිරිනමනවා. හොඳ ආදර්ශවත්, භක්තිමත්, කතෝලිකයෙක් හැටියට එතුමාට මොක් සුවය අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[අ. භා. 4.52 ]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සමඟ එකට මේ පාර්ලිමේන්තුවට පළමුවෙන්ම තේරී පත් වී ආ අප මිත්‍ර අගොස්තීනු පොන්සේකා මැතිතුමා සහ මම මේ පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටියේ ළඟ ළඟ තැන්වලයි. එතුමා සමඟ කුලුපග වීමට එයම හේතුවක් වුණා. ඊටත් වඩා එතුමාගේ දැක්ම අනුව එතුමා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් වුණා. මම සමසමාජ පාක්ෂිකයෙක් වුණා. නමුත් අපි දෙදෙනාට නම් එහෙම දුරස්තරභාවයක් දැනුණේ නැහැ. ඒ නිසාම කුලුපගභාවයත් වැඩි වුණා. මගේ මිත්‍ර ෆීලික්ස් පෙරේරා මැතිතුමා ගරු සභාවේ මේ වෙලාවේ නැහැ. එතුමා කිව්වා, අපි මොන මොන පක්ෂවලට අයිතිව හිටියත් අපි ඔක්කොම එකිනෙකා සමඟ බොහොම යහතින්, හොඳින්, සමීපව ඉන්නවාය කියලා. ඒක ඇත්ත. ඒක හොඳ දෙයක්. මනුෂ්‍ය ධර්මය අනුව වාගේම දේශපාලන ධර්මය අනුව අපට ළං වී -සමීපව- ඉන්න පුළුවන් වන්නේත් එක්තරා පොදු දැක්මක් උඩයි. එයයි මා මෙතැනදී අවධාරණය කරන්නේ.

ධීවර ජනතාවගේ දුක්බර ජීවිතය, ඔවුන්ගේ දුක් වේදනා හා අඳෝනා, ධීවර ජනතාවගේ දුප්පත්කම ආදී මේ සියල්ලක්ම අගොස්තීනු පොන්සේකා මහතාගේ චතුර කථිකත්වයෙන් මහා උද්ඝෝෂණික හඬක් බවට පෙරළුවා කියන එක මම අද මගේ අතීතය මතක් කරමින් කිව යුතුව තිබෙනවා.

ධීවර සමිති ව්‍යාපාරය එතුමා තරුණ කාලයේම ආරම්භ කරපු වැඩ පිළිවෙළක්. පසුව ඒ ධීවර සමිති සංගම්වල නායකත්වය දැරුවේ ඉබේම නොවෙයි, එතුමා ඒ ධීවර ජනතාවගේ හඬෙහි නියෝජිතයා හැටියට මතු වී ආපු නිසයි. එදා වෙන්නප්පුව ප්‍රභූවාදී ප්‍රතිගාමිත්වයේ බලකොටුවක් වුණා. එය වෙනස් කරන්නට නව සම්ප්‍රදායක් වෙන්නප්පුවට ගෙන ආවේ අපේ අගොස්තීනු පොන්සේකා සොහොයුරා බව මා මතක් කළ යුතුව තිබෙනවා. අපේ හිතවත් ජෝන් අමරතුංග මැතිතුමා කිව්වා, ඉතාමත්ම සාමාන්‍ය තැනකින් තමන්ගේ ජීවිතය ආරම්භ කරලා නියෝජ්‍ය ඇමතිවරයකුගේ තැන දක්වා පැමිණීම තමයි අපි සලකුණු කර ගත යුතු එතුමාගේ විශේෂත්වය කියලා. ඒක හැබෑවයි. නමුත් එය ඒ තරම් ලෙහෙසි ගමනක් වුණේ නැහැ. එය ඉතාම දුෂ්කර, කටුක අරගලයක් වුණු බවයි මා මේ අවස්ථාවේදී කියන්නේ. එතුමාගේ චතුර කථිකත්වයෙන්, එතුමා ගෙනාපු තර්ක විතර්කවලින් ඉතා පැහැදිලිවම මේ සමාජයේ නැති බැරි මිනිස්සුන්ගේ පැත්තත්, ඉහළ පන්තියේ පැත්තත් අතර තිබෙන පරස්පරතාවට එතුමා නිතරම යොමු වුණා. මේක අපි වචා ගන්න ඕනෑ දෙයක් නොවෙයි.

මේ නැති බැරිකමයි ඉහළ පන්තියයි අතර තිබෙන පරස්පරතාව නැති වෙනවා දකින්න තමයි අපි කවුරුත් කැමැති. නමුත් ඒක එහෙම වන්නේ නැහැ. එය නොවන තුරු එය කරවා ගැන්මට අභීතව ඉදිරිපත් වුණු එක් තරුණයෙක් ඒ ධීවර ගම්මාන තුළින් මතු වෙලා ඇවිත් මහා චතුර කථිකයෙක් බවට පත් වී අවසානයේ පාර්ලිමේන්තුවටත් පැමිණෙන්න යෙදුණා.

පසු කාලයක ගරු ප්‍රේමදාස අගමැතිතුමාගේ වැඩසටහන් පිළිබඳව පැහැදී එතුමා සමඟ සමීපව ක්‍රියා කරපු බව කියැවුණා. මමත් දන්නවා, ප්‍රේමදාස මැතිතුමාගේ වැඩසටහන් ගණනාවක් තිබුණා, වාමාංශිකයන්ට වුණත් ආකර්ෂණය වන. නමුත් පොන්සේකා මැතිතුමා නැති බැරි පන්තියත්, ඉහළ පන්තියත් අතර තිබුණු නොවැළැක්විය හැකි අරගලය පිළිබඳව එතුමා එදා දැරූ ස්ථාවරත්වයෙන් අඟලක්වත් වෙනස් නොවුණු බව මම දැන ගත්තේ එතුමා බලන්නට එතුමාගේ නිවසට ගිය වෙලාවකයි. එතුමා නීතිඥයෙකු හැටියට වැඩ කරන කාලයේ දේශපාලන ක්‍රියාකාරිත්වයෙන් ඈත් වුණත්, සමාජ ක්‍රියාකාරිත්වයේ නියැලී සිටිමින් කටයුතු කළ අවස්ථාවේ එතුමාගේ අදහස්වල ගැඹුරින්ම තැන්පත් වී තිබුණේත් මේ සමාජ දැක්ම හා මේ සමාජයේ ඇති විය යුතු පරිවර්තනය පිළිබඳ දැක්මයි. අවසාන කාලයේත් එතුමා මිනිසුන්ගේ ජීවිත නඟා සිටුවීමට තමන්ට පුළුවන් හැටියට හදා ගත් අරමුදල් මඟින් සුළු ණය දෙමින් ජීවිතයේ යම් ක්‍රියාරම්භයක් ඇති කර ගෙන යම් ආකාරයක ආදායම් මට්ටම්වලට පැමිණීමට ජනතාවට උදවුපදවු කළ බව මට අදත් මතකයි.

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් අපි එතුමාව ඉතා හෘදයංගමව සිහිපත් කරනවා. එතුමාගේ පවුලේ සියලු දෙනාටම අපගේ ශෝකය පළ කරමින්, අප පක්ෂයේ ශෝකයද මෙම ශෝක ප්‍රකාශ යෝජනාවට එකතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

[අ. භා. 4.57]

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය තුළ 1970-1980 දශකය තුළ විශාල පෙරළියක් ඇති කරපු මගේ පියාගේ මිත්‍ර අගොස්තීනු පොන්සේකා මැතිතුමා ගැන බිඳක් කථා කිරීම මගේ යුතුකමක් ලෙස මා සලකනවා.

අගොස්තීනු පොන්සේකා කියන චරිතය ගැන කථා කරනවා නම්, එදා පුත්තලම දිස්ත්‍රික්කය තුළ රිදී සීනුව යන විරුදාවලිය ලත් හොඳ කථිකත්වයක් තිබුණු, මීට ප්‍රථමයෙන් කථා කළ අපේ මැති ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කරපු ආකාරයට ජනතාව ආකර්ෂණය කර ගැනීමේ හැකියාව තිබුණු, ඒ වාගේම ආදර්ශවත්, ජනතාවගේ හද ගැස්ම හඳුනන නායකයෙක් හැටියට එතුමා අපට හඳුන්වන්න පුළුවන්. අප කුඩා කාලයේ -වයස අවුරුදු හය, හත, දහය වගේ වකවානුවල- එනම්, 1970-1977 කාල වකවානුව තුළ අගොස්තීනු පොන්සේකා, එස්.ඩී.ආර්. ජයරත්න, ප්‍රෝටස් තිසේරා යන ඒ මැති ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා පුත්තලම දිස්ත්‍රික්කය තුළ බොහොම ලොකු සේවාවක් කළා. අගොස්තීනු පොන්සේකා මහතා වෙන්නප්පුව ආසනය තුළ ජනතාවට විශාල වශයෙන් ඉඩම් ලබා දීමට කටයුතු කළා. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගුරුවරයකු හැටියටත්, විදුහල්පතිවරයකු හැටියටත් සේවය කළා. එතුමාගේ මැතිනියත් ගුරු ක්ෂේත්‍රය තුළ කටයුතු කළා. එතුමිය මගේත් ගුරු මෑණියෙක් වුණා.

එතුමා දරුවන් හතර දෙනෙකුගෙන් යුතු පවුලේ හොඳ පියෙකු හැටියටත්, ආදර්ශවත් හොඳ ස්වාමිපුරුෂයෙක් හැටියටත් කටයුතු කළාය කියන එක බොහොම ප්‍රශංසා මුඛයෙන් අපට කියන්නට පුළුවන්. වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ එතුමා හලාවත සෙබස්තියන් විද්‍යාලයේ විදුහල්පතිවරයකු හැටියටත් කටයුතු කළා.

[ගරු දයාශ්‍රිත තිසේරා මහතා]

නීති විද්‍යාලයට ගොස් ඉගෙනුම ලබා නීතිඥයකු වශයෙන් මාරවිල උසාවිය තුළ බොහොම හඬක් නඟමින් ඒ තුළ විවිධ තානාන්තර දරමින් එතුමා කටයුතු කෙරුවාය කියන එක මගේ මුවිනුත් ප්‍රකාශ කිරීම යුතුකමක් වෙනවා. මීට ප්‍රථමයෙන් කථා කරපු අපේ ගරු මැති ඇමතිතුමන්ලා විසිනුත් ඒ බව ප්‍රකාශ කළාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා එතුමන්ලා වෙන්නප්පුව ආසනය ඇතුළු පුත්තලම් දිස්ත්‍රික්කය තුළ ආරම්භ කරපු වැඩ පිළිවෙළවල් අද ඉන්න දේශපාලනඥයින්ට අතපසු නොවී, ශක්තිමත්ව ඉදිරියට ගෙන යාමට පුළුවන් වෙලා තිබෙන්නේ නිවැරදි, ශක්තිමත්, හරි වැඩ පිළිවෙළක් එහෙම නැත්නම් නිවැරදි, ශක්තිමත් අත්තිවාරමක් එදා දැමූ නිසාය කියන එක බොහොම ආඩම්බරයෙන් මා ප්‍රකාශ කරනවා. ඒ නිසා ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා වැනි නිහතමානී දේශපාලනඥයන් එදා කළ සේවාව එතුමන්ලා සමඟ දේශපාලනය කරපු උදවිය අදටත් මතක් කරනවාය කියන එක සිහිපත් කරන්න ඕනෑ.

මා හිතන විධියට එතුමාගේ ගෝලයෙක් හැටියට ගරු යූසස් පීරිස් මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කෙරුවා. ඒ වාගේම එතුමා නිර්මාණය කරපු පිරිසක් අධ්‍යාපන ක්ෂේත්‍රය, දේශපාලන ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය ඇතුළු විවිධ ක්ෂේත්‍ර තුළ තවමත් කටයුතු කරමින් ඒ ප්‍රදේශයන් තුළ ඒ ක්ෂේත්‍ර ශක්තිමත් කිරීමට, නඟා සිටුවීමට කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. වෙන්නප්පුව, නාත්තණ්ඩිය, හලාවත වැනි ආසනවල පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එදා ඒ ආරම්භ කරන ලද හොඳ වැඩ පිළිවෙළවල් අදටත් අපට ඉදිරියට ගෙන යාමට පුළුවන් වෙලා තිබෙන්නේ දිවංගත ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා වැනි උදවිය දැමූ ශක්තිමත් අඩිතාලම, අත්තිවාරම නිසාය කියන එක සිහිපත් කිරීම අපේ වග කීමක් සහ යුතුකමක් වෙලා තිබෙනවා.

අද දින අප ශෝකය ප්‍රකාශ කරන ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමා 2010 ජූනි මාසයේ 02වැනි දා අප අතරින් වෙන් වී ගියත් එතුමා එම ප්‍රදේශය තුළ තැබූ ඒ නාමය එහෙමත් නැත්නම් එතුමා ගෙන ගිය ඒ වැඩ පිළිවෙළ සිහිපත් කරන විශාල පිරිසක් තවමත් ඉන්නවාය කියන එක නැවත වතාවක් මතක් කරමින්, ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ අභාවය - එතුමා අප අතරින් වෙන් වීම- සම්බන්ධයෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත්, අප පක්ෂයේ ශෝකයත්, ඒ වාගේම අප පවුලේ ශෝකයත් පිලෝමිනා ගුරුතුමියට වාගේම සිසිල්, ගාමිණී, අරුණ සහ සන්ධ්‍යා යන ඒ දූවා පුතුන්ටත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාට මොක් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 5.04]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ 1970 සිට 1977 දක්වා සමඟි පෙරමුණු රජය කාලයේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ වෙන්නප්පුව මහජන මන්ත්‍රී ඒ වාගේම හිටපු ධීවර නියෝජ්‍ය අමාත්‍ය ගරු අගොස්තීනු පොන්සේකා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වනවා.

අපේ මැතිවරණ කොට්ඨාසයේ ජනතාවට අතිමහත් සේවාවක් කළ එතුමා වෙනුවෙන් මේ ශෝක යෝජනාවේදී කථා කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ ආසනය වෙනුවෙන් මුලින්ම මගේ ස්තුතිය පුද කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය, ග්‍රාම සේවා වසම් සියයක් විතර තිබෙන, එක පැත්තකින් මහා සාගරයෙන් - ඉන්දියන් සාගරයෙන්- අනෙක් පැත්තෙන් සුන්දර මා ඔය ගං දැල, තවත් පැත්තකින් වෙල් යායවල්වලින් සමන්විත, විවිධ වූ භූ විෂමතා සහිතව සැදී තිබෙන මැතිවරණ කොට්ඨාසයක්. ඒ වාගේම විවිධ වර්ගයේ ජන කොටස්, විවිධ ආගමික ජන කොටස් - විශාල කතෝලික පිරිසක් වාගේම ඒ හා සමානවම වූ බෞද්ධ පිරිසක්- ජීවත් වන මැතිවරණ කොට්ඨාසයක්. ආගමික නායකයින්ගේ, විහාරස්ථානවල අපේ ස්වාමීන් වහන්සේලාගේ, ඒ වාගේම අපේ කතෝලික පූජා ප්‍රසාදීන් වහන්සේලාගේ අවවාද, අනුශාසනා, ආශීර්වාදය ලබන වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ ධීවර පවුලක එතුමා ඉපදුණා. ඒ මැතිවරණ කොට්ඨාසයේ ප්‍රධානම අංගයක් තමයි "ගුරු කුලය". මොකද, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසය ගත්තාම පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන විශාල ගුරු පරපුරක් ඉන්නවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයට අයත් ගුරු පරපුර නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි අගොස්තීනු ෆොන්සේකා මැතිතුමා අප මැතිවරණ කොට්ඨාසයට දැවැන්ත සේවාවක් කරපු ජන නායකයෙක්. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ එතුමා ඉතාමත් චතුර කථිකත්වයක් තිබුණ කෙනෙක්. මේ පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වාමාංශික දේශපාලනය වෙනුවෙන් නායකත්වය දෙමින්, ජනතාව වෙනුවෙන් එතුමා ඒ චතුර කථිකත්වය පාවිච්චි කළා.

එතුමා 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකත්වය ලබා ගෙන 1965 මැතිවරණයේ දී අපේ ගරු ෆෙස්ටස් පෙරේරා මැතිතුමා එක්ක තරග කරලා පරාජයට පත් වුණත් 1970 දී දැවැන්ත ජයග්‍රහණයක් ලබා ගෙන 1970-77 කාලය තුළ එතුමා මේ ගරු සභාව නියෝජනය කළා. ඒ 1970-77 කාලය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මඟින් රජයට ඉඩම් පවරා ගෙන අහිංසක දිළිඳු ජනතාවට ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළේදී වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයට එතුමා නායකත්වය දෙමින් ඒ වැඩ පිළිවෙළ දියත් කළා. ඒ වාගේම ධීවර ජනතාවටත් එතුමා දැවැන්ත සේවාවක් කළා. ඒ වාගේම වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ අධ්‍යාපන නිකේතනවලට, පාසල්වලට දෙන්න පුළුවන් සහයෝගය එතුමා ලබා දුන්නා. යටිතල පහසුකම්, ගුරුවරු ලබා දෙමින් ගුරුකුලය ආරක්ෂා කරමින් අධ්‍යාපනය පැත්තෙන් එතුමා දැවැන්ත වැඩ කොටසක් කළා. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රය, මාර්ග සංවර්ධනය ආදී වශයෙන් 1970-77 කාලය තුළ පැවැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සමඟි පෙරමුණු රජය තුළ එතුමා දැවැන්ත වැඩ කොටසක් කළා. ඉන් පසුව, 1977 දී පරාජයට පත් වුණාට පසුවත් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක දේශපාලනය කළා. මෙතැනදී කියැවුණ ආකාරයට එතුමා එක කාලයක් දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා එක්ක එකතු වෙලා හිටියත්, 2005 වන විට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ ගැන පැහැදිලා එතුමා ගෙන යන වැඩ පිළිවෙළත් එක්ක සහ සම්බන්ධ වෙලා අවසාන කාලය දක්වා අපිත් එක්ක ඒ වැඩ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ එතුමාගේ සෙවණැල්ල වාගේ අපේ පිලෝමිනා ෆොන්සේකා ගුරු මෑණියන් එතුමා එක්ක හැමදාම හිටියා. ඒ වාගේම තමයි අපේ ගරු දයාශ්‍රිත

තිසේරා මැතිතුමා කිව්වා වාගේ එතුමාට හොඳ ගෝල පිරිසක් හිටියා. ඒ අය අද දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ තැන්වල ඉන්නවා. ගරු දයාශ්‍රිත තිසේරා මැතිතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව පවා නියෝජනය කරන ගෝල පිරිසක් එතුමා එක්ක හිටියා. එතුමා පරිපූර්ණ චරිතයක්. එතුමාගෙන් අපට ඉගෙන ගන්න දේවල් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977 දී අපේ රජය පරාජයට පත් වුණ වෙලාවේ සමහර මන්ත්‍රීවරු ඉතාම ශෝකයෙන්, දුකින් ජනතාවත් එක්ක මුහු වෙන්නට බැරිව කාලය ගත කරන විට මෙතුමා ඒ කාලය නාස්ති කරන්නේ නැතිව, ඒ කාලය අධ්‍යාපන කටයුතුවලට යොමු කරලා නීති විද්‍යාලයට ගිහින් නීතිය ඉගෙන ගෙන නීතිඥවරයකු හැටියට වැඩ කටයුතු කළා. නීතිඥවරයකු හැටියට වැඩ කටයුතු කළා කියන්නේ සාමාන්‍ය නීතිඥවරයකු හැටියට නොවෙයි. එතුමා මාරවිල දිසා අධිකරණයේ නීතිඥ සංගමයේ සභාපති බවට පත් වුණා. එතුමාගේ චතුර කථිකත්වය පාවිච්චි කරලා හොඳම නීතිඥවරයකු හැටියට ජනතාව වෙනුවෙන් මාරවිල දිසා අධිකරණයේ පෙනී සිටියා. ඒ නිසා අපි එතුමාගෙන් ඉගෙන ගන්න ඕනෑ දේවල් තිබෙනවා.

එතුමා මුල් කාලයේදී ගුරුවරයෙක්. එතුමා ගුරුවරයකු හැටියට වැඩ කරද්දී බාහිර උපාධිය කරලා සමත් වුණා. ඒ වාගේම එතුමා ඩිප්ලෝමාවක් හැදෑරුවා. නියෝජ්‍ය විදුහල්පතිවරයකු බවට පත් වුණා. දේශපාලනයට ආවා. දේශපාලනයෙන් පාර්ලිමේන්තුවට ආවා. පාර්ලිමේන්තුවෙන් පසුව නැවත නීතිඥ වෘත්තියේ වැඩ කටයුතු කළා.

එතුමා තමන්ගේ දූ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙමින් ඒ දූ දරුවන්වත් යහ මඟට ගේන්න කටයුතු කළා. සිසිල්, ගාමිණී, අරුණ සහ සන්ධ්‍යා කියන දුවා දරුවන්ගෙන් සමහර අය අද විදේශ ගත වෙලා මේ රටේ කීර්තිය වෙනුවෙන් වැඩ කටයුතු කරනවා. ඒ අය ඒ තැනට ගෙනෙන්න හොඳ පියකු හැටියට කටයුතු කළා. ඒ වාගේම හොඳ පවුල් ජීවිතයක් ගත කළ ස්වාමි පුරුෂයකු හැටියට, පියකු හැටියට එතුමා ඒ සමාජ මෙහෙවර කළා. ඒ ගැන අපි ඉතාම සතුටු වනවා. එතුමාගේ ජීවිතය පරිපූර්ණ ජීවිතයක් කියලා අපි කියන්නේ ඒකයි.

විශේෂයෙන්ම ඒ මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට මගේ ශෝකයත් ඒ වාගේම මේ වෙලාවේ මේ සභාවේ නැති වුණත් අපේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු අමාත්‍යතුමාගේ ශෝකයත් මම එතුමාගේ පවුලේ අය වෙත පුද කරනවා. විශේෂයෙන් වෙන්නප්පුවේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඇතුළු පොදු ජනතාව වෙනුවෙන් දැවැන්ත, අමිල මෙහෙවරක් කළ එතුමාට අප සියලු දෙනාගේම ශෝකය පළ කරන අතර, අප අදහන ආගම අනුව එතුමාට මෝක්ෂ සම්පත්තිය අත්වේවායි ප්‍රාර්ථනය කරනවා. ඒ වාගේම මේ වෙලාවේ එතුමා වෙනුවෙන් අදහස් ප්‍රකාශ කළ සියලු දෙනාටම මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් ස්තුතිය පුද කරන අතර, එතුමාගේ පවුලේ අයට, විශේෂයෙන් පිලෝමිනා මැණියන්ට සහ ඒ දරුවන්ට අපගේ ශෝකය ප්‍රකාශ කරන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. Augustheenu Fonseka, ex-Member of Parliament.

I came into contact with him when I was introduced to him by the late M.I.B. Hafi, Provincial Councillor, when I was in charge of the Puttalam Electorate together with the leaders of that district like the Hon. Festus Perera, the Hon. (Mrs.) Larine Perera, the Hon. S.D.R. Jayaratne and the present Minister the Hon. Milroy Fernando. We interacted with each other on several subjects in giving assistance to the people of that area. When he shifted his political alignment, I came to know him very well, and joined him and travelled to several parts of the country addressing meetings. His well-oriented oratory captured the hearts of the audience and people thronged in large numbers to listen to him. He inspired the people whenever and wherever he delivered those fiery speeches.

අද රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම විධාන කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.15ට , 2011 අගෝස්තු 26 වන සිකුරාදා අ.භා. 1.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 5.15 மணிக்கு பாராளுமன்றம், 2011 ஓகஸ்ட் 26, வெள்ளிக்கிழமை பி..ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 5.15 p.m. until 1.30 p.m on Friday, 26th August, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.